

# නිවනේ නිවීම

## නවවන වෙළුම

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

## ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ

# පොදු පුණ්‍යානුමෝදනාව

**"මහණෙනි, ආමිස දානයය, ධර්ම දානයය, යන මේ දන් දෙකකි. මේ දන් දෙක අතුරෙන් මෙයම අග්‍රය - එනම්, ධර්ම දානය."**

මේ අසිරිමත් බුදුවදන අගය කරන බොහෝ පාඨකයින් තම පරලෝ සැපත් මවුපියාදී ඥාතීන්ට කෘතගුණපූර්වකව පින් අනුමෝදන් කරවීමේ චිරාගත චාරිත්‍රයට අනුව ලොකු කුඩා පරිත්‍යාග පිරිනමන බැවින් දෙස් - විදෙස් වැසි ගිහි - පැවිදි දහම් පිපාසිත විශාල පිරිසකට අමිල දහම් අමාපැන් නොමිලයේ බෙදාදෙන **ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය** පුණ්‍යානුමෝදනා වශයෙන් එම ධර්ම දානමය කුසලය එකී පින්වතුන්ට හා ඥාතීන්ටත් මෙම 'අමාගඟ' නොසිඳී ගලායාමට නිරතුරුව කාලය, ධනය, ශ්‍රමය වැයකරන සැමටත් පරම ශාන්ත උතුම් අමාමහ නිවනින් සැනසීමට උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතන බව දන්වා සිටිමු.

මෙයට,

සසුන් ලැදි

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය.

# නිවනේ නිවීම

## (දෙසුම් පෙළකි)

නවවන වෙළුම

(25, 26, 27 දෙසුම්)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

2001

ප්‍රකාශනය
ධර්මග්‍රන්ථ මුද්‍රණභාරය
මහාභාරකාර දෙපාර්තමේන්තුව

ධර්මදානයකි

මුදලට විකිණීම සඳහා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 1997 ජූනි
දෙවන මුද්‍රණය - 1999 මාර්තු
තෙවන මුද්‍රණය - 2000 ජූනි
සිවුවන මුද්‍රණය - 2003 ඔක්තෝබර්
පස්වන මුද්‍රණය - 2007 ජනවාරි

## පොත ලබාගත හැකි ස්ථාන

. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

. රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර,
කොළඹ 5.

. ඩී. ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ.

. අනුර රූපසිංහ මහතා
අංක 27, කොළඹ වීදිය, මහනුවර.

. මහා භාරකාර දෙපාර්තමේන්තුව
2, බුලර්ස් පටුමග,
කොළඹ 07.

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

## මාතර ශ්‍රී ඥානාරාමාභිධාන

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

## 'නිවනේ නිවීම'

පූජෝපහාරයක්ම වේවා!

එතං සනතං

එතං පණීතං

යදිදං

සබබ සංඛාර සමථො

සබබූපධිපටිනිසසගෙගා

තණහකඛයො

විරාගො

නිරොධො

නිබබානං

"මෙය ශාන්තය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අත්හැර දැමීම

තණ්හාව ක්‍ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන

| | පිටු |
|---|---|
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය | xi |
| අමාගඟ | xii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xiv |
| 'නිවනේ නිවීම' - 25 | 1 |
| 'නිවනේ නිවීම - 26 | 26 |
| 'නිවනේ නිවීම' - 27 | 50 |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අනුග්‍රාහක මණ්ඩලය | |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයය. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුල'සුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැනනැඟුනු

ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මඟ හැරුණි. ඒ බැව් සැළවූ විට, නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ. අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකින්දු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොපිරිහෙන අයුරින් මුතු ඇට පෙළක් තුලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටලුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරැයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන්

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මහපැදූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්‍ය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හඳුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සම්බුණ ශ්‍රද්ධා ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩඊරියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩබ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. මුණසිංහ සහ සමාගමේ කාර්‍යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් තිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවසථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගිත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය නවමන් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, "නිවනේ නිවීම" වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර කැන්පත් වූ. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම

ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ නිරණායතමක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

**පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය**
**'පහන් කණුව'**
**කණ්දෙගෙදර**
**දේවාලේගම**

**(25 41) 1997 ජූලි 1**

## නිවනේ නිවීම පළමු වෙළුම - පස්වන මුද්‍රණය

මෙම පස්වන මුද්‍රණයේ මුද්‍රණ කටයුතු මැනවින් නිමකළ "කොලිටි ප්‍රින්ටර්ස්'' සමාගමේ සී.ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

සම්පාදක
(2550) 2006 දෙසැම්බර්

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැනීම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැනීමට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැනීමට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කළ "නිවනේ නිවීම" දේශනා මාලාව සඳහා වියදම් ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 6ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සදහම් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇණවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම් සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිවූ මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මගට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවූයේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සදුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අභිනව පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, කහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉඳුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත්

මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි<br>
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය<br>
'පහන් කණුව'<br>
කන්දේගෙදර, දේවාලේගම

2000 ජූනි 05 (2544 පොසොන්)

# ග්‍රන්ථ සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| මහා. | - | මහා වග්ග පාළි |
| දී.නි. | - | දීඝ නිකාය |
| ම.නි. | - | මජ්ඣිම නිකාය |
| සං.නි. | - | සංයුත්ත නිකාය |
| අං.නි. | - | අංගුත්තර නිකාය |
| ඛු.නි. | - | ඛුද්දක නිකාය |
| ධ.ප. | - | ධම්මපද |
| උදා. | - | උදාන |
| ඉති. | - | ඉතිවුත්තක |
| සු.නි. | - | සුත්තනිපාත |
| ථෙර. | - | ථෙරගාථා |
| ථෙරී. | - | ථෙරීගාථා |
| මහානි. | - | මහා නිද්දෙස |
| චූ.නි. | - | චූලල නිද්දෙස |
| නෙත්ති | - | නෙත්තිප්පකරණ |
| සු.වි. | - | සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව) |
| ප.සූ. | - | පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව) |
| සා.ප. | - | සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව) |
| මනො. | - | මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව) |
| ධ.අ. | - | ධම්මපදට්ඨ කථා |
| ප.ජෝ. | - | පරමත්ථජෝතිකා |
| ජා.අ. | - | ජාතකට්ඨකථා |
| ප.දී. | - | පරමත්ථදීපනී |
| වි.ම. | - | විසුද්ධිමග්ග |
| බු.ජ. | - | බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා |
| හේ.මු. | - | සයිමන් හේවාවිතාරණ මුද්‍රණය |

# 25 වන
# දේශනය

# 25 වන දේශනය

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'ඵතං සන්තං ඵතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අතහැරදැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය'

අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන්වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ විසිපස් වන දේශනයයි මේ.

සළායතන නිරෝධය ප්‍රත්‍යක්‍ෂ කරගත් තථාගතයන් වහන්සේ සළායතනය තුළම කොටුවී සිටින පුහුදුන් ලෝකයාගේ දෘෂ්ටි කෝණ පිළිබඳව දක්වන ප්‍රබුද්ධ ආකල්පය "කාළකාරාම සූත්‍රය" ආශ්‍රයෙන් තේරුම් ගැනීමට එදා අපි යම්කිසි උත්සාහයක් දැරුව. දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයා විසින්, මහණ, බමුණන් සහිත ප්‍රජාව විසින්, යමක් දක්නා ලදද, අසන ලදද, විඳින ලදද, දැනගන්නා ලදද. සිතින් ගන්නා ලදද, සොයාබලන ලදද, කල්පනා කරන ලදද, ඒ සියල්ලක්ම තමන් වහන්සේ දන්නා බව බුදු රජාණන් වහන්සේ "තමහං ජානාමි" යන පදයෙන් ඒ සූත්‍රයේ ප්‍රකාශ කළා. ඒ වගේම ඒවා දන්නවා පමණක් නොවෙයි විශේෂ ඥානයකින් ඒවා දන්නා බවත්, 'තමහං අබ්භඤ්ඤාසිං' යන පදයෙන් ඊ ළඟට උන්වහන්සේ ප්‍රකාශ කළා. ඒවා විශේෂ ඥානයකින් දන්නවා වගේම තථාගතයන් වහන්සේ විසින් තේරුම් අරගෙන තිබෙන බවත්, 'තං තථාගතස්ස විදිතං' යන පාඨයෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. ඒ විදියටම ඥානයක්, විශේෂ ඥානයක්, තේරුම් ගැනීමක්, ඇති නමුත් තථාගතයන් වහන්සේ ඒ දිට්ඨ සුත මුත ආදී කිසිවක් පිළිබඳව ස්ථාවරයක් ගැනීම, එහෙම නැත්නම් ඒවාට හේත්තු වී සිටීම, ලංවී සිට ගැනීම, නොකරන බවත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා, 'තං තථාගතො න උපට්ඨාසි' යන පදයෙන්.

සාමාන්‍යයෙන් ලෝකයාගේ සිරිත යමක් පිළිබඳව දැනුමක්, විශේෂ ඥානයක්, තේරුම් ගැනීමක්, ඇති තැන "ජානාමි පස්සාමි තථේව ඵතං"

- "දනිමි දකිමි එය එසේම යැ"යි, දෘෂ්ටි ග්‍රාහයෙන් ඒවා අල්ලා ගැනීමයි. නමුත් මෙතෙන්දි අපට පෙනෙන්නේ මේ සූත්‍රයේ තිබෙන ආකාරයට, බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ මේ දිට්ඨ සුත මුත ආදිය පිළිබඳව දැනීමක් විශේෂ ඥානයක් තේරුම් ගැනීමක් ඇති නිසාම ඒවා පිළිබඳව ස්ථාවරයක් ගැනීමක්, ළංව සිට ගැනීමක්, හේත්තු වීමක්, නොකරන බවයි. මේ කාරණය අපට වඩාත් හොඳින් ප්‍රකාශ වෙනව සූත්‍රයේ අග එන ගාථාවලින්. "ජානාමි පස්සාමි තථෙව එතං -අජ්ඣොසිතං නත්ථි තථාගතානං". අජ්ඣොසිතං - දනිමි දකිමි එය එසේම යයි යන වෙලී පැටලී සිටීමක් තථාගතයන් වහන්සේලා තුළ නැත, කියල ඔය විදියට ප්‍රකාශ වෙනව. එතකොට මේ කියාපු ආකල්පය පිළිබඳ අමුතු වෙනස තේරුම් ගැනීමට ආධාරයක් වශයෙන් අපි එදා අර මජ්ඣිම නිකායේ මූල පරියාය සූත්‍රයෙන් පද දෙකක් උපුටා ගත්ත, මේ කාරණය තේරුම් ගැනීමට. 'සඤ්ජානාති - අභිජානාති' කියන දැනීම් මට්ටම් දෙක. "සඤ්ජානාති" කියන දැනීම් මට්ටමත්, සඤ්ඤා අනුව දැනගැනීමත් - අභිඤ්ඤා - අභිජානාති ඊට වඩා විශිෂ්ට අන්දමේ තේරුම් ගැනීමකුත් ගැන ඒ මූල පරියාය සූත්‍රයේ සඳහන් වෙනව. එතකොට අර 'සඤ්ජානාති' කියන දැනීම් මට්ටමෙන් - ඒක පුහුදුන් ලෝකයාගේ දැනීම් මට්ටමයි - ඒ දැනීම් මට්ටමෙන් ලෝකය දිහා බලන පෘථග්ජනයා, මිරිඟුවක් වැනි සංඥාවට මුලා වෙලා මඤ්ඤනා කිරීමක් - 'ඇතැයි' සිතා ගැනීමක් - අනුව ව්‍යාකරණ රටාවට වහල් වෙලා සිතන මතන ගතියයි පුහුදුන් ලෝකයාගේ සිරිත. නමුත් තථාගතයන් වහන්සේ අර අභිජානාති කියන විශේෂ දැනීම් මට්ටමෙන් ඒ අභිඤ්ඤාවෙන් - ඒ දිට්ඨ සුත මුත ආදියේ යථා තත්ත්වය විනිවිද පිරිසිඳ තේරුම් අරගත්තු නිසා ඒ කිසිවක් පිළිබඳව අර කියාපු 'උපට්ඨාසි' කියන වචනයෙන් ප්‍රකාශ කෙරෙන අන්දමට කිසිම ස්ථාවරයක් ගැනීමක් හේත්තු වී සිටීමක් කරන්නේ නැහැ. මේකට හේතුව අර මඤ්ඤනා නොකිරීමමයි. මඤ්ඤනා කියල කියන්නේ මමත්වය අනුව ගිය යම් යම් සිතුම් පැතුම්, ඇතැයි සිතා ගැනීම් - එතකොට මඤ්ඤනා නොකිරීම් ප්‍රතිපත්තියමයි අර 'න උපට්ඨාසි' කියන වචනයෙන් අදහස් කෙරෙන්නෙ. ඒ විදියට 'අජ්ඣොසිතයක්' වෙලී පටලැවී සිටීමක් තථාගතයන් වහන්සේලා තුළ නැත්තේ මඤ්ඤනා කිරීමක් නැති නිසාමයි. තණ්හා මාන දිට්ඨි වශයෙන් ඇලී වෙලී පැටලී සිටීමක් තථාගතයන් වහන්සේලා තුළ නැහැ, දිට්ඨ සුත මුත ආදිය පිළිබඳව.

මේ කාළකාරාම සූත්‍රයේ මුලින් එන ප්‍රකාශන කීපය, අප කලිනුත් අර අව්‍යාකත ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී ඉදිරියට ගත්තු චතුෂ්කොටි තර්ක න්‍යායයට තරමක් සමාන බව අපි එදා ප්‍රකාශ කළා.

චතුෂ්කෝටි තර්ක න්‍යායයට අපි පහසු වචනයක් හැටියට පාවිච්චි කළා 'සතර කොන් ප්‍රශ්නය'. ඒවට නිදසුන් තමයි අර 'හොති තථාගතො පරම්මරණා-න හොති තථාගතො පරම්මරණා - හොතිච න හොති ච තථාගතො පරම්මරණා-නෙව හොති න න හොති තථාගතො පරම්මරණා' තථාගත තෙම මරණින් මත්තෙහි වෙයි, නොවෙයි, වෙයි සහ නොවෙයි, වෙයිත් නොවෙයි නොවෙයිත් නොවෙයි' කියන ඔය විදියේ විකල්ප හතරකින් යුක්ත ප්‍රශ්නය. ඔන්න ඔය විකල්ප හතරකින් යුක්ත සතර කොන් තර්ක න්‍යායයට ටිකක් සමාන බවක් දරනව මේ සූත්‍රයේ එන ප්‍රකාශ.

එක ප්‍රකාශයක් තමයි අවස්ථා කීපයකින් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළේ. සදේවක ලෝකයා විසින් දන්නා දක්නා ආදී ඒ දිට්ඨ සුත මුත ආදිය මම දනිමි. මම විශේෂ ඥානයකින් දනිමි. තථාගතයන් වහන්සේ විසින් ඒවා තේරුම් ගෙන ඇත, කියල එහෙම ප්‍රකාශ කරල එනමුත් 'න උපට්ඨාසි' ඒව පිළිබඳව ස්ථාවරයක් ගත්තේ නැහැ කියල ප්‍රකාශ කරනව. සාමාන්‍යයෙන් සතරකොන් තර්ක න්‍යායයක අපට දකින්නට ලැබෙන්නේ ඒ විකල්ප හතරම එකවරම බුදුරජාණන් වහන්සේ පිළිතුරු නොදී ප්‍රතික්ෂේප කරන බවයි. දැන් මෙතන අමුත්තක් පෙනෙනව. මෙතන එක පාරටම ප්‍රතික්ෂේප නොකර බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව දනිමි. ඒ වගේම විශේෂ ඥානයකින් දනිමි. තේරුම් අරගෙනත් තියෙනව. බැලූ බැල්මට හරියට අර පළමුවෙනි විකල්පය තහවුරු කරන ආකාරයක්-පිළිගත්තු ආකාරයක් වගෙයි ඒවායින් කියැවෙන්නේ. නමුත් අගටම කියැවෙන 'න උපට්ඨාසි' කියන එකෙන් එක්තරා විදියක ප්‍රතික්ෂේපයකුත් කෙරෙනව. මෙතන තිබෙන රහස-මේක තව දුරටත් අපි උපමා ආදිය ඉදිරිපත් කර ගත්තහමයි කාරණය හොඳට පැහැදිලි වෙන්නෙ. එතෙක් අපට පෙනෙන කාරණය මොකක්ද? තථාගතයන් වහන්සේ මේවාට හේත්තු නොවී සිටින්නේ නොදක්කම නිසා නොවෙයි. දැනීමක්, විශේෂ ඥානයක්, තේරුම් ගැනීමක්, ඇති නිසාමයි. සාමාන්‍යයෙන් ලෝකයා හිතන්නේ දැනීමක් නැති තැනයි දැඩිව නොගැනීමක් තියෙන්නෙ කියල. නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ හරියට විශේෂ අවබෝධයක් තිබෙන නිසාම, විනිවිද දැක්ක නිසාම මේ තත්ත්වය - ඒ කියන්නේ අර දිට්ඨ සුත මුත ආදීන්ගේ නිස්සාරත්වය - ඒ සළායතනයන්ගෙන් ලබන සංඥාවන්ගේ නිස්සාරත්වය - බුදු රජාණන් වහන්සේ තේරුම් අරගත්ත නිසාමයි ඒවා පිළිබඳව ස්ථාවරයක් නොගන්නේ. එතකොට සතර කොන් ප්‍රශ්නයේ අනෙකුත් ප්‍රශ්න වල තිබෙන ප්‍රතික්ෂේප කිරීම් වගේ දෙයක් මෙතනත් කෙරෙන බවයි අපට පෙනෙන්නේ, නමුත් අමුතු ආකාරයකට. ඔන්න ඊළඟට දෙවෙනි ප්‍රකාශය. බුදු රජාණන් වහන්සේ කරන දෙවෙනි ප්‍රකාශය. 'යං භික්ඛවෙ

සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං න ජානාමීති වදෙය්‍යං තං මම අස්ස මුසා". මහණෙනි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයා විසින් මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව විසින් යමක් දකින ලදද අසන ලදද විඳින ලදද දැන ගන්නා ලදද සිතින් ගන්නා ලදද සොයා බලන ලදද කල්පනාකරන ලදද එය මම නොදනිමි - මම ඒ හැම දෙයක්ම නොදනිමි කියතොත් 'තමහං න ජානාමීති වදෙය්‍යං' .....තං මම අස්ස මුසා' ඒක මගේ බොරුවක් වනු ඇත. මෙන්න මේ පාඨය පිළිබඳව යම් කිසි ගැටලුවක් තියෙනව. ඇත්ත වශයෙන්ම මේ ගැඹුරු සූත්‍ර වල බොහෝ විට පාඨාන්තර පටලැවිලි රාශියක් තියෙනව. මේ සූත්‍රයේ විශේෂයෙන්ම තියෙනව ඒවා.

දැන් මෙතනදී අටුවාව පිළිඅරගෙන තියෙන පාඨය 'තමහං ජානාමීති වදෙය්‍යං තං මම අස්ස මුසා' කියන එක. නමුත් මේක අර අපි කලින් සඳහන් කළ ආකාරයට අර්ථවත් නැහැ. ඒක තේරුම් අරගෙන වෙන්න ඇති සමහර විට බුරුම ඡට්ඨ සංගීති සංස්කරණය අර අටුවා මගින් ඉවත් වෙලා 'තමහං න ජානාමීති' කියන පාඨානතරය පිළිඅරගෙන තිබෙන්නෙ. අටුවා මගින් ඉවත් වෙලා තියෙනවා, බුරුම ඡට්ඨ සංගීති සංස්කරණය, නමුත් සහේතුකවයි ඉවත් වෙලා තියෙන්නෙ-අපට පෙනෙන හැටියට. මක්නිසාද? බුදු රජාණන් වහන්සේ කලින්ම 'දනිමි' කියල ප්‍රකාශ කරල ඉවරයි. දැන් මෙතන කියන්නේ 'මම නොදනිමි' යි කිව්වොත් ඒක මගේ බොරුවක් වෙනව එතකොට මේ දෙවෙනි ප්‍රකාශයක් කිරීමට හේතුව මොකද?. සාමාන්‍ය ලෝකයා හිතන්නේ යමක් පිළිබඳව ස්ථාවරයක් ගන්නේ නැත්නම්, කෙළින් හිටල කියන්නෙ නැත්නම් මේක මෙහෙමමයි කියල ඒකාන්ත වශයෙන්, 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤං' මෙයම සත්‍යයයි අනික් සියල්ල බොරුය කියල පැහැදිලිවම නොකියනව නම්, ඒක නොදත්කම නිසා වෙන දෙයක්ය කියන හැඟීමත් සාමාන්‍ය ලෝකයා තුළ තිබෙනව. ඒක නිසයි බුදුරජාණන් වහන්සේ මේ දෙවෙනි වර ප්‍රකාශය කරන්නේ 'මම එය නොදනිමියි' කිව්වොත් ඒක මගේ බොරුවක් වෙනව. එතකොට මා නොදන්න නිසා නොවෙයි අර කියාපු විදියට ඒවා පිළිබඳව ස්ථාවරයක් නොගන්නේ.

ඒ විදියටම අපට තේරුම් කරන්න පුළුවන් ඊළඟට එන ප්‍රකාශනත්. සතර කොන් ප්‍රශ්න වලින් ඔන්න දෙවෙනි එකයි ඔය දැන් කියැවුනේ. 'තමහං න ජානාමීති වදෙය්‍යං තං මම අස්ස මුසා' එය නොදනිමියි කිව්වොත් එය මුසාවක් වෙනව. ඊළඟ ප්‍රකාශය අර විදියටමයි යන්නේ.

වෙනස වශයෙන් අවශ්‍ය ටික විතරක් කියමු. 'තමහං ජානාමි ච නච ජානාමී ති වදෙය්‍යං තං පස්ස තාදිසමෙව'. අර කියාපු දිට්ඨ සුත මුත ආදිය පිළිබඳව මම එය දනිමි සහ නොදනිමි 'දනිමි සහ නොදනිමි' ඒ දෙක එකතුකරල - ඒ විදියට මම කිව්වොත් ඒකත් මුසාවක් වෙනව. මක්නිසාද ලෝකයා හිතනව සමහර විට මේ විදියට ස්ථාවරයක් නොගන්නේ අඩාල දැනුමක් නිසයි කියල. යම් කිසි කෙනෙකුගේ අඩාල දැනුමක් ප්‍රකාශ වෙන කියමනක් වගෙයි "මම ඒක දන්නව ඒ වගේම නොදන්නව" අඩාලයි - සියයට පනහක් දන්නව සියයට පනහක් නොදන්නව වෙන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව එහෙම මා කිව්වොත් ඒකත් අර වගේම බොරුවක් වෙනව 'තමපස්ස තාදිසමෙව'. එතකොට ඔන්න තුන්වෙනි විකල්පය.

ඊළඟට බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරනව 'තමහං නෙව ජානාමි න න ජානාමීති වදෙය්‍යං තං මමස්ස කලි. 'මම එය දන්නේත් නොවෙමි. නොදන්නේත් නොවෙමි කිව්වොත් ඒක මගේ දෝෂයක් වනු ඇත. ඒකත් අපට තේරුම් ගන්න පුළුවනි. දැන් අර ලෝකයා කල්පනා කරන්නේ මේ කිසි දෙයක් පිළිබඳව ඒකාන්ත වශයෙන් යම්කිසි නිගමනයක් නොගන්නේ එක්කෝ අඩාල දැනුමක් නිසා එහෙම නැත්නම් තවත් හේතුවක් තිබෙනව. ඇඟ බේරා ගැනීමට. අපි මේ ඇඟ බේරා ගැනීම කියන සාමාන්‍ය වචනයෙන් ප්‍රකාශ කරන එකම තමයි, ඒක දර්ශනයක් වෙලා, සඤ්ජය බෙලට්ඨි පුත්තගේ - සඤ්ජය බෙලට්ඨි පුත්ත කියල ශාස්තෘ වරයෙක් බුදු රජාණන් වහන්සේගේ කාලෙ හිටිය. යම්කිසි කෙනෙක් ඇවිල්ල ප්‍රශ්නයක් ඇහුවහම පිළිතුරු දෙන්නෙ 'එවම්පි මෙ නො, තථාතිපි මෙ නො, අඤ්ඤථාතිපි මෙ නො, නොතිපි මෙ නො, නො නොතිපි මෙ නො' ආදී වශයෙන්. අර ආදාගේ ප්‍රතිපත්තිය වගේ ලිස්සල යන ප්‍රතිපත්තියකින් බේරෙන්න බලනව. 'මෙසේත් නොවෙයි, එසේත් නොවෙයි, අන්සේත් නොවෙයි, අන්සේ නොවන්නේත් නොවෙයි' ආදී වශයෙන් ඒ ප්‍රකාශ කිරීම් ක්‍රමයට අමරා වික්ඛෙප වාදය කියල කියන්නේ. ආදාගේ ප්‍රතිපත්තිය වැනි තර්කක්‍රමය. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව මම දන්නේත් නොවෙයි නොදන්නේත් නොවෙයි කිව්වොත් ඒක මගේ දෝෂයක් වෙනව. ඒක මෝහයෙන් කෙරෙන ඇඟ බේරා ගැනීමක් හැටියට ලෝකයා හිතන්න පුළුවන්. ඔන්න එතකොට තථාගතයන් වහන්සේ මේ කියාපු විදියට ප්‍රකාශ කළා. අර චතුෂ්කොටි තර්කයම තමයි නමුත් අමුතු ආකාරයකින් මෙතන ඉදිරිපත් වෙලා තියෙන්නෙ - යම්කිසි ගැටලුවකුත් සහිතව - බුදු රජාණන් වහන්සේට කියා ගන්න බැරි විදියේ තත්ත්වයක් වගෙයි ලෝකයාට මේ තිබෙන ගැටළුව.

අපි කලින් සඳහන් කළා අටුවාවේදී මේ සූත්‍රයේ අවස්ථා හයක් දක්වනව එහෙම නැත්නම් සූත්‍රය කොටස් පහකට බෙදල දක්වනව භූමි වශයෙන්. ඒ එක් එක් භූමියක් ප්‍රකාශ කරන අවස්ථාවේදී පොළොව කම්පාවුනා කියලත් සඳහන් කරනව. එයින් පළමුවැනි භූමිය වශයෙන් අටුවාවෙ දක්වන්නේ සබ්බඤ්ඤුත භූමි කියන එක. ඒක ප්‍රකාශ කෙරෙන පද හැටියට අටුවාවේ දක්වන්නේ 'තමහං ජානාමි' 'තමහං අබ්භඤ්ඤාසිං' 'තං තථාගතස්ස විදිතං' එය මම දනිමි, එය මම විශේෂයෙන් දනිමි, එය මම තේරුම් ගෙන ඇත'කියන ටික සබ්බඤ්ඤුත භූමිය හැටියට.

ඊළඟට එන ඛීණාසව භූමි කියන එක. ක්ෂීණාශ්‍රවයන් කෙනෙකුන්ගේ තත්ත්වය පිළිබඳ කොටස හැටියට හඳුන්වන්නෙ 'න උපට්ඨාසි' කියන එක. ඒවා පිළිබඳ ස්ථාවරයක් නොගැනීම. තණ්හා මාන දිට්ඨි වශයෙන් ඒවා පිළිබඳව ස්ථාවරයක් නොගැනීම ආශ්‍රවයන් ක්ෂය කළ පුද්ගලයා පිළිබඳ තත්ත්වයක් කියන එක දැක්වීමටයි, එය ක්ෂීණාශ්‍රව භූමි හැටියට හඳුන්වන්නේ. මෙතනදී අපි ඉදිරිපත් කළ 'තං මම අස්ස මුසා තමපස්ස තාදිස මෙව' තං මමස්ස කලි' කියන පද තුන ඒ කියන්නේ එය මගේ මුසාවක් වනු ඇත. එයත් එවැනිම මුසාවක් වනු ඇත, එය මගේ දෝෂයක් වනු ඇත, කියල කියන ප්‍රකාශන තුනෙන් කියැවෙන්නේ සච්චභූමි නම්වූ තුන්වැනි අවස්ථාවෙයි කියල අටුවාව තෝරනව. එතකොට ඒකත් අපි දැන් ඉවර කරල තියෙන්නෙ.

ඊළඟට එන හතර වන භූමිය - හතර වෙනි කොටස. ඒක තමයි ගැඹුරු හරිය. සුඤ්ඤතා භූමි නමින් අටුවාව එතන හඳුන්වනව. හේතු සහිතවයි එහෙම ප්‍රකාශ කරන්නේ. ඒ සුඤ්ඤතා භූමියයි ඊළඟට එන ඡේදයේ තියෙන්නේ. 'ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති, අදිට්ඨං න මඤ්ඤති, දට්ඨබ්බං න මඤ්ඤති දට්ඨාරං න මඤ්ඤති, සුතා සොතබ්බං සුතං න මඤ්ඤති අසුතං න මඤ්ඤති, සොතබ්බං න මඤ්ඤති, සොතාරං න මඤ්ඤති, මුතා මොතබ්බං මුතං න මඤ්ඤති, අමුතං න මඤ්ඤති මොතබ්බං න මඤ්ඤති, මොතාරං න මඤ්ඤති. විඤ්ඤාතා විඤ්ඤාතබ්බං විඤ්ඤාතං න මඤ්ඤති අවිඤ්ඤාතං න මඤ්ඤති, විඤ්ඤාතබ්බං න මඤ්ඤති, විඤ්ඤාතාරං න මඤ්ඤති' ඔන්න ඔය ටික. මෙතනත් පාඨාන්තර පටලැවිල්ලකට මුහුණ දෙන්නට සිද්ධ වෙලා තියෙනව. පළමුවෙන්ම අපි මෙතෙන්දි ගත්තෙ 'දිට්ඨා දිට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති' කියල. නමුත් අටුවාවෙ ඒක අරගෙන තියෙන්නෙ 'දට්ඨා දට්ඨබ්බං දිට්ඨං කියල. දට්ඨා කියන වචනය අටුවාවෙ තෝරනව 'දට්ඨා දට්ඨබ්බනති දිස්වා දට්ඨබ්බං' පූර්ව ක්‍රියා රූපය අරගෙන, ඒ කියන්නෙ දැකල දැකියයුතු දැක්මක් ඇතැයි

නොහගියි කියන එක - දිස්වා කියන එකෙන් තෝරනව. නමුත් අර 'දිට්ඨා' කියන පාඨාන්තරයත් තිබෙනව. මේ 'දිට්ඨා' පාඨාන්තරය වෙනුවට දට්ඨා කියන එක අටුවාව අරගෙන තිබෙන්නෙ ඒක අර 'දෘෂ්ටවා' - දැක කියන අදහස ගැනීමට ළඟ නිසා. මේක බලාගෙන බුරුම ඡට්ඨසංගීති සංස්කරණය අනිත් පද තුනත් අර විදියටම පූර්වක්‍රියා රූපයෙන් අරගෙන දක්වල තිබෙනව. 'සුත්වා සොතබ්බං සුතං' 'මුත්වා මොතබ්බං මුතං' විඤ්ඤත්වා විඤ්ඤාතබ්බං විඤ්ඤාතං'. මේ විදියට ඡට්ඨසංගීති සංස්කරණයේ දක්වන්න ඇත්තෙ සමහරවිට දිට්ඨ සුත මුත විඤ්ඤාත කියන පද ඒ ආකාරයෙන්ම තිබීමෙන් යම්කිසි අදහසක් ගන්න බැහැයි කියල හිතන නිසා වෙන්න ඇති. නමුත් අපි මෙතෙන්දි ඉදිරිපත් කළ විවරණ මාර්ගය අනුව ශූන්‍යතා ප්‍රතිසංයුක්ත මේ සූත්‍රයේ ගැඹුරුම කාරණයක් හෙළිවෙන පද කීපයකුයි 'දිට්ඨ සුත මුත විඤ්ඤාත' කියන වචන වලින් මෙතෙන්දි ප්‍රකාශ වෙල තියෙන්නෙ. එදා යන්තම්න් අපි මේකෙ කටුසටහනක් - සැකිල්ලක් වශයෙන් යම්කිසි පරිවර්තනයක් ඉදිරිපත් කළා.

'දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති' කියන එක විවරණය කරන්ට වෙන්නෙ දැකීමෙන් පරිබාහිර වූ, එහෙම නැත්නම් දැකීමෙන් අන්‍ය වූ දැකිය යුතු දැක්මක් ඇතැයි නොහගියි. ඊළඟට අනිත් පද 'සුතා සොතබ්බං සුතං න මඤ්ඤති' ඇසීමෙන් පරිබාහිර වූ ඇසිය යුතු ඇසුමක් ඇතැයි නොහගියි. විඳීමෙන් පරිබාහිර වූ විඳිය යුතු විඳීමක් ඇතැයි නොහගියි. දැනගැනීමෙන් පරිබාහිර වූ - දැනගැනීමෙන් අන්‍ය වූ - දැනගතයුතු දැනගැනීමක් ඇතැයි නොහඟී. මේක තවම ගැටලුවක් හැටියට පෙනෙන්න පුළුවන්. මේක තේරුම් ගැනීමට අපට උපකාර වෙනව අපි කලින් අවස්ථාවක සවිස්තරව තේරුව බාහිය සූත්‍රය. බාහිය සූත්‍රයේ බාහිය දාරුචීරිය තාපසයට බුදුරජාණන් වහන්සේ දුන්න අවවාදය 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති සුතෙ සුතමත්තං භවිස්සති මුතෙ මුතමත්තං භවිස්සති විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති' කියන ඒ දර්ශනයයි. ඒ කියන්නෙ දුටු දෙයෙහි - එහෙම නැත්නම් දුටුවෙහි - දුටු පමණක්ම වන්නේය. දුටු මාත්‍රයෙන් නවතිනව- දුටු දෙයක් ඇතැයි කියල හිතාගන්නෙ නැහැ. ඇසුවෙහි එහෙම නැත්නම් ඇසුන දේ පිළිබඳව ඇසීම් මාත්‍රයෙන්, මේක ඇසීමක් පමණක් කියන හැඟීම විතරක් ගන්නව. ඒ මිසක් ඇසුනු දෙයක් ඇතැයි කියල හඟින්නේ නැහැ. ඔන්න ඔය අදහසයි මෙතන මේ කියැවෙන්නෙ. 'දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති' දිට්ඨයෙන් වෙන්වූ - ඒක අවධි විභක්තියෙන් ගන්න පුළුවන් - දිට්ඨය හැර එහෙම නැත්නම් දිට්ඨයෙන් අන්‍යවූ. දිට්ඨයෙන් පරිබාහිර වූ දැකිය යුතු දිට්ඨයක්, දැකිය යුතු දැක්මක් ඇතැයි නොහඟී. මේක අපි තව ටිකක් එළි පෙහෙළි කරගන්න, අපි කලින් අවස්ථාවක

නාමරූපය පිළිබඳව විග්‍රහකරන අවස්ථාවෙ ඉදිරිපත් කළ උපමාව-ඒක පොතපතේ තියෙන උපමාවක් නොවෙයි අපි සාමාන්‍ය ගැමි උපමාවක් ගත්තෙ 'ඒදණ්ඩ උඩ යන බල්ල'. බල්ලෙක් ඒදණ්ඩ උඩින් යන අතරෙ ඒදණ්ඩ මැද ටිකකට නතර වෙලා සමහරවිට නගුට හොලවන්නෙ කුතුහලයෙන් බලන්නෙ මොකද කියල බැලුවාම, ඒකට හේතුව තමාගේම ඡායාව දකිනව වතුරෙ. මේ සතා හිතාගන්නව තව බල්ලෙක් කියල, දිය බල්ලෙක්, කියල හිතාගන්නව, අන්න ඒ විදියෙ දෙයක්. එතෙන්දි මේ බල්ලට මේ සිද්ධ උනේ මොකක්ද? බල්ල කල්පනා කරනව. ඒ වගේම කීප වාරයක්ම බලනව ජලය දිහා. මොකද හේතුව, මෙතන දැකීමෙන් පරිබාහිරවූ දැකිය යුතු දැක්මක් ඇතැයි කියල හිතාගන්නව. බල්ලෙක් ඉන්නව මේ වතුරෙ, දිය බල්ලෙක් ඉන්නව. අන්න 'දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං'. ඒ බල්ල තේරුම්ගත්තේ නැහැ මේ බලන නිසයි පෙනෙන්නෙ කියල. බල්ල හිතන්නෙ මේ පෙනෙන නිසයි බලන්නෙ කියල. පෙනෙන නිසා බලනවනම් ඉතින් බල බලාම ඉන්න ඕන. බල්ල තේරුම් ගත්ත නම් යම් අවස්ථාවක මේ බලන නිසාය පෙනෙන්නෙ කියල නොබල ඉන්නව. ඔන්න ඔතන අර පටිච්චසමුප්පාදය පිළිබඳ ගැඹුරුම කාරණයක් - මේ නාම රූප විග්‍රහය පිළිබඳ ගැඹුරු අදහසක් මෙතන තියෙන්නෙ.

එතකොට මේ බැලීම නිසාම පෙනෙන බව තේරුම් නොගැනීමෙනුයි බලන දෙයක් තියෙනව, දියේ බල්ලෙක් ඉන්නව කියන හැඟීම. අන්න ඒ හැඟීම වගේ දෙයක් තමයි මෙතන මේ මඤ්ඤනාව. 'දට්ඨා දිට්ඨබ්බං. දිට්ඨං න මඤ්ඤති' එතකොට තථාගතයන් වහන්සේට එහෙම එකක් නැහැ-ඒ විදියෙ මුළාවක් නැහැ. ඒක නිසා අර දැකීම් මාත්‍රයෙන් - කොටින්ම කියනවානම් දැකීම් මාත්‍රයෙන් ඔක්කොම ඉවරයි. දැකීම් මාත්‍රය පටිච්චසමුප්පන්න නිසා - හේතු ප්‍රත්‍යය රාශියක් නිසා දැකීම කියල දෙයක් ඇති වෙනව. ඒ හේතු ප්‍රත්‍ය අහක් කළාම අමුතු දෙයක් - කොටින්ම කියනව නම් බලන වාරයක් පාසා මේ අලුත් දැකීමක්. බලන බලන වාරයක් පාසා වෙනම බල්ලෙක් මැවෙනව වතුරෙ. බලන කෙනෙක් මැවෙනව. ඒ බල්ලට තමාගේ මූණ පෙනෙනව. අන්න ඒ විදියෙ දෙයක් මෙතන තියෙන්නෙ. හැම දෙයක්ම පටිච්චසමුප්පන්නයි. 'සබ්බං තං ඵස්සපච්චයා' කියල බ්‍රහ්මජාල සූත්‍රයේ දැක්වූයේත් ඒකයි. මේ හැම එකක්ම ස්පර්ශය නිසයි. මේක ඉතාමත්ම ගැඹුරුයි. සක්කාය දිට්ඨිය නිසයි ලෝකයාට ඒ විදියට පේන්නෙ. පෙනෙන නිසා බලනව කිය කියා බලනව, නමුත් බලන නිසයි පෙනෙන්නෙ. එතකොට අන්න ඒ කාරණයයි මෙතන මේ 'දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති'. ඒකමයි අපි අර බාහිය සූත්‍රයෙනුත් තේරුම් ගත්තෙ. ඒ දණ්ඩ උඩ බල්ලාගෙ උපමාවෙන් ගත්තු

එකමයි. මේ දැකීම කියන ක්‍රියා මාත්‍රයෙන් අන්‍ය වූ දැකිය යුතු දැක්මක් ඇතෙයි කියල තථාගතයන් වහන්සේ හිතන්නේ නැහැ. තව උපමා අවශ්‍යනම් අපට හිතාගන්න පුළුවන් දැන් ඔන්න සිංදුවක් සංගීතයක් ඇත ඇහෙනව, සංගීතය කියල දෙයක් තියෙනව කියල හිතාගන්නව. හිතාගෙන මෙතෙන්දි ඇහෙන සංගීතයම අහන්න ඕන කියන හැඟීමෙන් ඒ සංගීතය පැවැත්වෙන තැනට යනව. තබන තබන පියවරක් පියවරක් පාසා වෙන සංගීත ඇහෙන්නෙ. ඒක තේරෙන්නෙ නැහැ. මක්නිසාද මේක පටිච්චසමුප්පන්න බව නොදැනීම නිසා. පටිච්චසමුප්පන්න වන්නෙ - 'චක්ඛුංච පටිච්ච රූපෙච, 'දැන් අතන බලන බල්ල නිසා පෙනෙන බල්ලෙක් ඉන්නව වගේ, කණත් ශබ්දයත් නිසයි ඒ සංගීතය පිළිබඳ විඤ්ඤාණයක් ඇතිවෙන්නේ. සොත විඤ්ඤාණයක් ඇති වෙන්නෙ. එතකොට අර මුළාව නිසා මෙතනට ඇසෙන සංගීතයම වඩා හොඳට ඇසීමට මේ තැනැත්තා අර සංගීත ශාලාව ළඟට යනව. ඒ මුළාව හොඳට තේරෙන්නෙ ඒ සංගීත භාණ්ඩයට කණ තිවුවහම පමණයි. කණ තිවුවහම දෙදරුම් ගොඩක් විතරයි. සංගීතයක් නොවෙයි ඇහෙන්නෙ. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් මේ ලෝකෙ තියෙන්නෙ. මහ මුළාවක්. මක් නිසාද? හිතාගන්නව, මඤ්ඤනා කර ගන්නව, අර සංගීතයමයි මට ඇහෙන්නෙ, නමුත් තබන තබන පියවරක් පාසා වෙන වෙන සංගීතයි ඇහෙන්නෙ. මේක පටිච්චසමුප්පන්න දෙයක් නිසා. අහන පුද්ගලයෙක් නිසා නොවෙයි. කණත් ශබ්දයත් අතර ඇති යම් කිසි පටිච්චසමුප්පන්න හේතු ප්‍රත්‍යයන් නිසා, ස්පර්ශය නිසා, ඇතිවුන අවස්ථාවක් පමණයි මෙතන තියෙන්නෙ. ඔන්න ඔය කාරණයයි දිට්ඨ සුත මුත විඤ්ඤාත කියන හතරෙන් ප්‍රකාශ වෙන්නෙ.

ඒ 'දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති' කියන ටිකයි අපි තේරුවේ. ඒක පිළිබඳව තවත් කාරණයක් කියනවනම්, දැන් අටුවාවෙ මේ කියාපු මේ ශූන්‍යතා ප්‍රතිසංයුක්ත අංශය පිළිබඳව ඒ තරම් තැකීමක් කරල නැති බව අපට පේනව. අටුවාව අර 'දිට්ඨා දට්ඨබ්බං' කියන එක තෝරන්න යන ගමන් කියනව 'දිස්වා දට්ඨබ්බන්ති, අහං මහාජනෙන දිට්ඨමෙව එතං පස්සාමීති තණ්හා මාන දිට්ඨීහි න මඤ්ඤති' අර තථාගතයන් වහන්සේ 'දිට්ඨා දට්ඨබ්බං වශයෙන් මඤ්ඤනා නොකරන්නෙ මක්නිසාද කියන එක අටුවාව තෝරල දෙන්නෙ කොහොමද?

'මම මහජනයා විසින් දකින ලද්දක්ම නොදකිමි'යි කියල තණ්හා මාන දිට්ඨී වශයෙන් තථාගතයන් වහන්සේ හිතන්නේ නැත. මේක ඉතාමත් ලිහිල් අර්ථයකිනුයි අරගෙන තියෙන්නෙ. මහජනයා විසින් දකින දෙයක්ම මම දකිනව කියල තණ්හාවක් දිට්ඨියක් මානයක් ඇති කර ගන්නව කියල ඒ විදියටමයි ඊළඟ පාඨයත් තෝරන්නේ. 'අදිට්ඨං න මඤ්ඤති'

කියන එක 'අදිට්ඨං න මඤ්ඤතීති අහං මහාජනෙන අදිට්ඨං එව පස්සාමි' මහජනයා විසින් නොදුටු දෙයක් මම දකිනව කියල තථාගතයන් වහන්සේ තණ්හා මාන දිට්ඨි ඇතිකරගන්නවයි කියන එක-මෙවයි තිබෙන ගැඹුරු අර්ථයට කිට්ටුවීමක්වත් නැහැ. නමුත් මෙතන අපි ගත්තෙ 'දිට්ඨං න මඤ්ඤති' කියන එක. අපි දැනටමත් තේරුව.

ඊළඟට එන 'අදිට්ඨං න මඤ්ඤති' කියන එකේ අදහස ගත්ත කියෙන්නෙ දැන් අර ඒ දණ්ඩ උඩ බල්ලගෙ උපමාවෙන්ම ගත්තොත් 'දිට්ඨං න මඤ්ඤති' කියල කියන්නෙ දියේ බල්ලෙක් ඉන්නව කියල එහෙම හැඟීමක් ඇතිකර ගැනීමයි. 'අදිට්ඨං න මඤ්ඤති' කියන්නෙ තථාගතයන් වහන්සේ එය නුදුටු හැටියට ප්‍රකාශ කරන්නෙත් නැහැ.

නොදුටුවයි කියල කියන්නෙ නැත්තේ මක් නිසාද කියන එක අපි අර කලින් 'න ජානාමීති වදෙය්‍යං තං මම අස්ස මුසා' කියල කළ ප්‍රකාශනයෙන්ම හෙළි වෙනව. එය මම නොදනිමි යි කිව්වොත් ඒක මගේ මුසාවක් වෙනව. අන්න ඒ නිසාමයි මෙතන 'අදිට්ඨං න මඤ්ඤති', නොදුටුවයි කියල කියන්නෙත් නැහැ. මක්නිසාද මේක ප්‍රතීත්‍ය සමුත්පන්න දෙයක්. ඡායාවක් දුටු බව දන්නව. දැන් බල්ල ගැන කියනවනම් දුටුවෙ බල්ලෙක් නොවෙයි නමුත් ඡායාවක්. ඒක නිසා නුදුටුවයි කියල කියන්නත් බැහැ. එය පටිච්චසමුප්පන්න දෙයක් බව තේරුම් ගත්ත. අන්න ඒක නිසා එතකොට 'අදිට්ඨං න මඤ්ඤති'.

ඊළඟට 'දට්ඨබ්බං න මඤ්ඤති' ඒ කියන්නෙ දැකිය යුත්තක් ඇතැයි නොහඟී. ඒකත් අර බොහෝ දුරට පළමුවෙන් කියාපු කාරණයටම සම්බන්ධයි. දැන් අර බල්ල නැවත නැවතත් බලන්නේ මක්නිසාද? නැවත නැවත බලන්නේ "දැකිය යුත්තක් තියෙනව මේ වතුරෙ" කියන හැඟීමෙන්. තථාගතයන් වහන්සේට එහෙම එකක් නැහැ. මක්නිසාද මේ හැම එකක්ම පටිච්චසමුප්පන්නයි' සබ්බං තං ඵස්සපච්චයා' බලන බලන වාරයක් පාසා මේක අලුත් බැල්මක්. සංස්කාරයක්. අලුත් වීමක්. අන්න ඒ නිසාම 'දට්ඨබ්බං න මඤ්ඤති'. මේකෙ බලන්න දෙයක් නැහැ. බැලීමක් හැරෙන්න බැලිය යුත්තක් නැහැ. දැකීමක් හැරෙන්න දැකිය යුත්තක් නැහැ. ඇසීම් මාත්‍රයක් හැරෙන්න ඇසිය යුත්තක් නැහැ. ඒක අර ආත්ම දෘෂ්ටිය නිසා ඇතිවන හැඟීමක්. එතකොට මෙතනින් කියවෙන්නෙ නිස්සාරත්වයයි. ශූන්‍ය අදහසමයි. හරයක් නැහැ. හිස්, බොල්. සංගීතය කියන එක - වචනයක් විතරයි. ඒ වචනයෙන් එන සංකල්පය දැඩිව ගැනීම නිසා, සංගීතය කියල දෙයක් තියෙනවය, අර සංගීත භාණ්ඩ රාශියකින් කෙරෙන මහා ගාලගෝට්ටිය තුළින් සංගීතය කියන වචනය මතු කරගෙන ඒක දැඩිව

ගැනීම නිසා තමයි ඒ සංගීතය අහන්න යන්නෙ. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් තියෙන්නෙ. එතකොට 'දිට්ඨ' ආදිය පිළිබඳවත් එහෙමයි. ඔය කාරණය තථාගතයන් වහන්සේ තේරුම්ගත්ත නිසා තමයි 'දට්ඨබ්බං න මඤ්ඤති' දැකිය යුත්තක් ඇතැයි නොහඟී. ඇසිය යුත්තක් ඇතැයි නොහඟී. ඔය ආදී වශයෙන් අනික් ඒවත් තේරුම් ගන්න පුළුවන්.

ඊළඟට 'දට්ඨාරං න මඤ්ඤති'. දකින කෙනෙක් ඇතැයි නොහඟී. අන්න එතෙන්දි කෙළින්ම ශූන්‍යත්වය. ආත්ම ආත්මීය ශූන්‍යතාව. දැන් අර ඒ දණ්ඩ උඩ ඉන්න බල්ල තේරුම් අරගෙන නැහැ බලන බල්ලත් දකින බල්ලත් අතර ප්‍රත්‍යයසම්බන්ධතාවක් තිබෙන බව. දකින බල්ල නිසයි පෙනෙන බල්ල පෙනෙන්නෙ. මේ දෙක අතරෙ ප්‍රත්‍යය සම්බන්ධතාවක් තියෙනව. මේක වෙනත් විදියකට කිව්වොත් 'චක්ඛුංච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං' ඇස තියන පමණට පෙනෙනව නොවෙයි. ඇස තිබුන පමණින් චක්ඛු විඤ්ඤාණය ඇතිවෙන්නෙ නැහැ. 'චක්ඛුංච පටිච්ච රූපෙච' බැලූවාම ඉතාම සරල කියමනක්. නමුත් මේක තේරුම් ගැනීම ඉතාමත්ම ගැඹුරු කාරණයක්, ඇසත් රූපයත් නිසා. මේක 'නිසා - හටගැනීමක්' පටිච්චසමුප්පාද යයි මෙතන කියැවෙන්නෙ. ඒක නිසා මෙතන දකින කෙනෙක්, වෙනම දකින කෙනෙක්, ඒ කියන්නෙ දැකීමෙන් පරිබාහිර වූ අරවිදියෙ කෙනෙක් ඇතැයි හැඟීමක් තථාගතයන් වහන්සේ තුළ නැහැ. 'දට්ඨාරං න මඤ්ඤති'. සාමාන්‍ය ලෝකයා තුළ ඒ දැකීම කියන ක්‍රියා මාත්‍රය තුළින් ඇති වෙනව දකින කෙනෙක් පිළිබඳ සංඥාවක්. ආත්ම ආත්මීය සංඥාවක්, ඇතිකරගන්නව.

මෙන්න මේ කාරණයම අර බාහිය සූත්‍රයේ ප්‍රකාශ වෙනව. බුදුරජාණන් වහන්සේ ඒ බාහියට ප්‍රකාශ කරනව, අර විදියට ශික්ෂණයක් දීල-දුටුවෙහි දුටුමතින් නවතින්න, ඇසුවෙහි ඇසුමතින් නතර වෙන්න, ආදී වශයෙන් ප්‍රකාශ කරල ඊළඟට වදාරනව 'යතො ඛො තෙ බාහිය දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති සුතෙ සුත මත්තං භවිස්සති. මුතෙ මුතමත්තං භවිස්සති විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති තතො ත්වං බාහිය න තෙන, යතො ත්වං බාහිය න තෙන, තතො ත්වං බාහිය න තත්ථ. යතො ත්වං බාහිය න තත්ථ තතො ත්වං බාහිය නෙව ඉධ න හුරං න උභයමන්තරෙ එසෙවන්තො දුක්ඛස්ස'. අර විදියට ඒ ශික්ෂණය යනවනම්, ඒ කියන්නෙ දැනීම් මාත්‍රයෙන් නතරවීම් ආදී වශයෙන් ඒ ශික්ෂණයෙහි යෙදෙනව නම්, එවිට බාහිය නුඹ ඒ දිට්ඨ සුත මුත විඤ්ඤාත ආදිය පිළිබඳව ඒවායින් මඤ්ඤනා කරන්නෙ නැහැ. 'න තෙන මඤ්ඤති' ඒවා මුල් කරගෙන දිට්ඨයෙන් මඤ්ඤනා කරන්නෙ නැහැ. මමත්වය අනුව කල්පනා කරන්නේ නැහැ, දිට්ඨය උපකාර කරගෙන. සුතය උපකාර කරගෙන මමත්වය අනුව කල්පනා කරන්නෙ නැහැ. ඒකයි

'න තෙන මඤ්ඤති' කියල කියන්නෙ. වීජගණිත සූත්‍රයක් වගේ මෙතන දක්වල තියෙනව එක වචනයක්. එතකොට, අර විදියට කරන කොට 'න තෙන මඤ්ඤති'. 'තතො ත්වං බාහිය න තෙන' එවිට බාහිය ඔබ 'එයින්' නොවන්නේය. 'යතො ත්වං බාහිය න තෙන, තතො ත්වං බාහිය න තත්ථ' යම් අවස්ථාවක බාහිය නුඹ 'එයින්' නොවන්නේද එවිට බාහිය නුඹ 'එහි' නොවන්නේය. 'තතො ත්වං බාහිය න තත්ථ' කියල කිව්වෙ එවිට බාහිය නුඹ එහි නොවන්නේය. දැන් අර සංගීතය - ඒක නිසා ඒ වෙලාවෙ අපි ඒකෙ ඇතුලේ-සංගීත ශාලාවෙයි අපි ඉන්නෙ. 'සොතාරං' පුද්ගලයෙක් හැටියට ඒක අරගෙන. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් තියෙනව, දකින කෙනෙක් පිළිබඳ හැඟීම. ඒක තමයි අර 'යතො ත්වං බාහිය න තෙන තතො ත්වං බාහිය න තත්ථ' යම් අවස්ථාවක නුඹ 'එයින්' මඤ්ඤනා නොකරතොත්, එවිට බාහිය නුඹ 'එහි' නොවන්නෙහිය. නුඹ ඒ දිට්ඨයෙහි නොවන්නෙහිය. ඒ දිට්ඨයෙහි පැල පදියම් නොවන්නෙහිය. ඒ දිට්ඨය පිළිබඳව මඤ්ඤනා ඇතිකර නොගන්නෙහිය. සුත මුත ආදිය පිළිබඳවත් එහෙමයි. ඔන්න ඕකයි එතකොට 'න තත්ථ' කියල කියන්නෙ. නුඹ එහි නොවන්නේය. 'යතො ත්වං බාහිය න තත්ථ, තතො ත්වං බාහිය නෙව ඉධ න හුරං න උභයමන්තරෙ' යම් අවස්ථාවක නුඹ 'එහි' නොවන්නේද එවිට බාහිය නුඹ 'මෙහිත්' නොවන්නෙහිය 'එහිත්' නොවන්නෙහිය. ඒ දෙක අතරත් නොවන්නෙහිය. මෙයම දුකෙහි කෙළවරයි. ඒ කියන්නෙ සම්පූර්ණයෙන්ම අර ශූන්‍යත්වය ප්‍රත්‍යක්ෂ කර ගත්ත කියන එකයි එතැනින් කියැවෙන්නෙ. මෙහිත් නැහැ. එහිත් නැහැ, අතරත් නැහැ.

ඔන්න ඔය කාරණයයි එතකොට 'දට්ඨාරං න මඤ්ඤති' කියල කියන්නෙ. දකින කෙනෙක් ඇතැයි නොහඟී. ඒ විදියටම 'සොතාරං. මොතාරං. විඤ්ඤාතාරං' හිතන්නෙක් ඇතැයි කියලවත් හිතන්නෙ නැහැ. සිතීම් මාත්‍රය හැරෙන්න සිතන කෙනෙක් ඇතැයි කියලවත් හිතන්නෙ නැහැ තථාගතයන් වහන්සේ. මඤ්ඤනා කරන්නෙ නැහැ. ඔන්න ඕකයි එතකොට අර ශූන්‍යතා භූමිය-ශූන්‍යත්වය. දිට්ඨ සුත මුත ආදියේ නිස්සාරත්වය. ඒව අර සාමාන්‍ය ලෝකයා හිතන්න වගේ ව්‍යාකරණ රටාවට අනුව කර්තෘ කර්ම කියල - යමක් තේරුම් ගන්න ලේසි ක්‍රමය තමයි විෂය විෂයී සම්බන්ධතාව එහෙම නැත්නම් කර්තෘ කර්ම සම්බන්ධතාව. දකින කෙනෙක් ඉන්නව දකින දෙයක් තිබෙනව. දකින දෙයක් තිබෙන නිසා දකින කෙනෙක් ඉන්නව. දකින කෙනෙක් ඉන්න නිසා දකින දෙයක් තිබෙනව. මේ දෙක අතර ද්වයතාවක් තිබෙන්නෙ. ඔන්න ඔය ද්වයතාවෙන් මිදීමයි. ඒ ද්වයතාවෙන් මිදිල මේක මේ පටිච්චසමුප්පන්නයක්. හේතු ප්‍රත්‍යරාශියකගේ සමවායයක්. සන්නිපාතයක්, එක්තැන්වීමක්. මහ රැස්වීමක්, මහ රැස්වීමක් නම් මහ ගොඩක් ඉන්නව මෙතන. හේතු රාශියක්. එයින් තොරව මෙතන දෙයක්

හැටියට බෙදල ගන්න බැහැ. නමුත් ලෝකයාගේ සිරිත අර විෂය විෂයී සම්බන්ධතාව - කර්තෘ කර්ම සම්බන්ධතාව - අනුව ව්‍යාකරණ රටාවට මුළාවෙලා, වඩා පහසුවෙන් ව්‍යාවහාර කිරීම සළකා ගෙන දකින මමෙක් ඉන්නව, දකින දෙයක් තියෙනව, අසන මමෙක් ඉන්නව අසන දෙයක් තියෙනව, ඔය විදියට කල්පනා කරනව. එතකොට තථාගතයන් වහන්සේ තුළ එබඳු මුළාවක් නැති බවයි මේ කොටසින් ප්‍රකාශ වෙන්නෙ.

ඊළඟට අපි එන්නෙ අර 'තාදී භූමි' නමින් හැඳින්වෙන පස්වෙනි කොටසටයි. ඒක ප්‍රකාශ වෙන්නෙ සූත්‍රයේ 'ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨ සුත මුත විඤ්ඤාතබ්බෙසු ධම්මෙසු තාදීයෙව තාදී, තම්හා ච පන තාදිම්හා, අඤ්ඤො තාදී උත්තරිතරො වා පණීතතරො වා නත්ථීති වදාමි' මෙසේ මහණෙනි තථාගත තෙම දුටු ඇසූ විඳි දැනගත යුතු ආදී ඒ ධර්මයන් පිළිබඳව 'තාදීයෙව තාදී' තාදී වූයේ තාදීමය. ඒ තාදී භාවයෙන් ඊට වඩා උත්තරීතර වූ හෝ ප්‍රණීතතර වූ තාදී භාවයක් නැත.

එතකොට මෙතන තිබෙන ගැඹුරු වචනය තමයි 'තාදී' කියන එක. ඒක අපි කලිනුත් එක්තරා ප්‍රමාණයකට විග්‍රහ කළා. තාදී කියන එක 'එසේ වූ' කියන අදහසයි. අටුවාව මේක තෝරන්නෙ 'තාදිතා නාම එක සදිසතා' - තාදී කියල කියන්නෙ ඒකාකාරී බවයි. 'තථාගතො ච යාදිසො ලාභාදිසු තාදිසො අලාභාදිසු' තථාගතයන් වහන්සේ ලාභාදීන් පිළිබඳව (අෂ්ට ලෝක ධර්ම පිළිබඳවයි මෙතන අදහස් කරන්නෙ) යම්සේද අලාභාදීන් පිළිබඳවද එසේමයි. ඔය විදියටයි අටුවාව තෝරන්නෙ. මේක සම්පූර්ණයෙන් වැරදි තැනක්. මෙතන තිබෙනව යම්කිසි අඩුපාඩුවක්. මක් නිසාද අර තාදී කියන වචනයෙ එක්තරා ගැඹුරු අංශයක් මේකෙන් යටපත් වෙනව. ලාභාදියෙහි යම් සේද අලාභාදියේත් එසේමය කිව්වාම කෙනෙකුට ප්‍රශ්න කරන්න පුළුවන් ලාභාදියේදී කෙසේද කියල. නමුත් මේක නොවෙයි තාදී කියන එකේ නියම අර්ථය. මීට ටිකක් කිට්ටුවෙන් යන ඇත්ත වශයෙන්ම පිළිගත හැකි විවරණයක් අටුවාව ඒ එක්කම දෙනව. මහා නිද්දේසයෙන් උපුටා දක්වනව, අර 'ඉට්ඨානිට්ඨෙ තාදී' කියන විග්‍රහය. ඒ මුනිවරය පිළිබඳව, රහතන් වහන්සේ පිළිබඳව.' ලාභෙපි තාදී අලාභෙපි තාදී යසෙපි තාදී අයසෙපි තාදී'. අන්න ඒකයි නියම විවරණය. ඒ කියන්නෙ ලාභයේත් තාදී අලාභයේත් තාදී, යසස පිළිබඳවත් තාදී අයස පිළිබඳවත් තාදී. එහෙම නැතුව ලාභයන්හි යම්සේද අලාභයන්හිත් එසේමය කියන එක නොවෙයි. ලාභයෙත් එසේමයි අලාභයෙත් එසේමයි. යසස පිළිබඳවත් එසේමයි අයසේත් එසේමයි. නින්දාවේත් එසේමයි, ප්‍රශංසාවේත් එසේමයි. ඔය එසේබව එක දිගටම යන 'එසේවක්'. මේ කියන එසේ බවට හේතුව අපි කලින් අවස්ථාවකත් දැක්වුව. එක ආකාරයකින් මේක විග්‍රහ කරන්න

පුළුවන් අර තථතා නම්වූ ධර්මතාව අවබෝධ කරගැනීම. අනිත් එක 'තම්මයතා' නමින් හැඳින්වෙන යමක් අයත්කර ගැනීම, අල්ලා ගැනීම, ආදියෙන් වැළකී සිටීම. ඒකට අපි කිව්වෙ අතම්මයතාව. මේක ඉතාමත් වැදගත් වචනයක්, සූත්‍ර දේශනා වල තිබෙන. මෙකල එතරම් එළියට අර ගත්තෙ නැති විදියෙ වචනයක්. අතම්මයතා කියන ප්‍රතිපත්තිය. ඒ කියන්නෙ අපි අර සංගීතය පිළිබඳව කල්පනා කරල බලනවනම් ඒක පිළිබඳව තම්මයතාවක් ඇති කරගත්තොත් අන්න එතකොට ඒකෙ ඇලී සිටීමකුයි ඒකෙන් හැඟෙන්නෙ. එහෙම පිටින්ම සංගීතමය පුද්ගලයෙක් එයා. සංගීතයට ඇලෙන පුද්ගලයා සංගීතමයයි. තම්මය කියල කියන්නෙ - සොවණ්ණමය රජතමය ආදී වශයෙන් රන්මය රිදීමය කිව්ව වගේ එකක් තමයි තම්මය කියල කියන්නෙ. නමුත් මෙතන තද්මය, - එයින්ම හටගත්. කුමකින්ද හටගත්තේ?. දැන් දිට්ඨියක් පිළිබඳව නම් ඒ දිට්ඨියෙන්ම හටගත්තු පුද්ගලයෙක්. එහෙම නැත්නම් සූතයක් නම්, ඒ කියන්නෙ සංගීතයක් පිළිබඳව කල්පනා කරනව නම්, සංගීතයෙන්ම හටගත්, ඒ කියන්නෙ සංගීතඥයෙක්. සංගීතයටම ප්‍රිය. ඒ විදියට මේ තම්මයතාව. එතකොට මේ තම්මයතාව නැතිවීමමයි තාදිබව, තම්මයතාවෙන් මිදීම. එහෙකටවත් හේත්තු වෙන්නෙ නැහැ. අල්ල ගන්නෙ නැහැ. බදාගන්නෙ නැහැ. ඒක නිසාමයි අර තාදීගුණය තියෙන්නෙ, මේක මහ පුදුම සංකල්පයක්. මක්නිසාද, දැන් තාදී බව කියන එකේ එක අර්ථයක් තමයි ස්ථිරසාර බව - බොහෝ විට ඒක පරිවර්තනය කරන්නේ ස්ථිරසාර, අචල අකම්ප්‍ය කියන වචන වලින්. සාමාන්‍ය ලෝකයා අචල දෙයක් හැටියට සලකන්නෙ, අචලවීම ස්ථිරසාරවීම හැටියට සලකන්නෙ, යම්කිසි දෙයකට හේත්තු වී සිටීමයි. එහෙම නැත්නම් යමක් තදින් අල්ල ගැනීමයි. නමුත් මෙතන තියෙන්නෙ ඒකෙම අනික් පැත්ත. කිසිවක්වත් අල්ලගත්තෙ නැති බවයි - අතම්මයතාව. මේ කියන මේ තාදී කියන ගුණය තුළ තියෙනව එක්තරා විදියක සුඛනම්‍ය බවක්. සුඛනම්‍ය කියල කියන්නෙ පහසුවෙන් නමන්න පුළුවන් ගතියක්. අන්න ඒකම තමයි අපි කලින් අවස්ථාවක දැක්වුවෙ. අර පිණ්ඩපාතෙ යන මුනිවරය පිළිබඳ ප්‍රකාශ වෙනව.

> අලත්ථං යදිදං සාධු - නාලත්ථං කුසලාමිති
> උභයෙනෙව සො තාදී - රුක්ඛංව උපනිවත්තති[1]

පිණ්ඩපාතෙ යනව, යන තැනින් - 'අලත්ථං යදිදං සාධු' - ඉඳින් පිණ්ඩපාතෙ ලැබුනත් ඒත් හොඳයි - 'නාලත්ථං සුන්දරාමි ති' - නොලැබුනොත් ඒකත් සුන්දරයි. 'උභයෙනව සො තාදී' ඒ දෙකටම ගැලපෙන හැටියට හැඩ ගැහෙනව. අන්න ඒ හැඩගැහීමේ හැකියාව, ඒ සුඛනම්‍ය බව ඒකත් තිබෙනව මේ 'තාදි' කියන වචනයේ. එතකොට 'තාදී' කියන වචනය

'ස්ථිරසාර' කියල තේරුවට මොකද එයින් හැඟෙන්නේ නැහැ දැඩිබවක්. නොදැඩි බවක් ඒ වෙනුවට තියෙන්නේ. තථාගතයන් වහන්සේලා, රහතන් වහන්සේලා පිළිබඳව තිබෙන්නෙ එක්තරා නොදැඩි සුඛනම්‍ය බවක්. මේක මහ පුදුම ගුණයක්. මේක ටිකක් අපට තේරුම් ගන්න පුළුවනි (අපි ලෝකයේ තියෙන නොයෙකුත් උපමායි ගන්නෙ මේ ධර්මය තේරුම් ගන්න) දැන් ඔය ක්‍රීඩා මණ්ඩප වල තියෙනව යතුරු ඔන්චිල්ලා, එහෙම නැත්නම් 'කතුරු ඔන්චිල්ලාව' කියලත් ඕකට කියනව. ඔය යතුරු ඔන්චිල්ලාවක් කරකැවෙන කොට ඔය ආසනයක ඉඳගත්තු කෙනෙක් මේක උඩට යනකොට මූණින් අතට හැරිලා වැටෙන්නෙ නැහැ. ඒ යතුරු ඔන්චිල්ලාව කරකැවෙන ආකාරයට අර ආසනයත් හැඩගැහෙනව. සුඛනම්‍යබවක් නිසා. ඒක දැඩිව තිබුන නම් එහෙම, එහෙම නම් උඩට යනකොට අර පුද්ගලය වැටෙන්න ඕන. අන්න ඒකම තමයි තාදී ගුණය. 'ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති' කියල කියන්නෙ ඒකයි. මේ කියන අකම්ප්‍ය ගුණය, අචල බව. අර යමක් බදා නොගැනීමයි. යමක් දැඩිව අල්ලා නොගැනීම නිසයි. 'නිස්සිතස්ස හි චලිතං, අනිස්සිතස්ස චලිතං නත්ථි' යමකට හේත්තු වෙලා සිටිනවනම් චලිතයක් ඇතිවෙනව. දැන් මම බිත්තියට හේත්තු වෙලා ඉන්නව. කවුරුවත් හිටි ගමන්ම බිත්තියට මොකක් හරි කළොත් සමහරවිට එතන චලිතයක් ඇතිවෙනව - සැල්මක්. අන්න ඒකම තමයි 'නිස්සිතස්සහි චලිතං - අනිස්සිතස්ස චලිතං නත්ථි' යමකට හේත්තු වෙලා සිටින තැනැත්තාටයි චලිතයක් තියෙන්නෙ. හේත්තු වෙලා නැත්නම් චලිතයක් නැහැ. නමුත් ලෝකයා හිතන්නෙ යමකට හේත්තු වෙලා සිටිනව නම් ඒකම තමයි ස්ථිරසාර බව, ඔන්න ඔය විදියෙ පුදුම අදහසක් තිබෙනව ඔය 'තාදී' කියන වචනයේ. දැන් මෙතන කියවෙන්නෙ ලාභ අලාභ පිළිබඳ තාදී බව නොවෙයි. අෂ්ට ලෝක ධර්ම පිළිබඳ තාදී බව නොවෙයි. මෙතන විශේෂ අර්ථයකිනුයි 'තාදි' බව විග්‍රහ කෙරෙන්නෙ. මක් නිසාද? 'ඉති බො භික්ඛවෙ තථාගතො දිට්ඨ සුත මුත විඤ්ඤාතබ්බෙසු ධම්මෙසු'. අර ලෝකයා ගන්න දෘෂ්ටි පිළිබඳව තාදි බවක් මෙතන ප්‍රකාශ වෙන්නෙ. ලෝකයා දිට්ඨ සුත මුත විඤ්ඤාත ආදිය 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤං' මෙය සත්‍යයි අනික් සියල්ල බොරුය කියල දැඩිව අල්ල ගන්නව. නමුත් තථාගතයන් වහන්සේ ඒ එකක් වත් දැඩිව අල්ල ගන්නෙ නැහැ. ඒ ඒ තැනම තබල ඒව විග්‍රහ කරනව විතරයි. අර ඒ දණ්ඩ උඩ බල්ලාගේ උපමාව වගේ, ඒවයි ප්‍රතීත්‍ය සමුත්පන්න ස්වභාවය, ඒ ඒ හැම එකක්ම ස්පර්ශය ප්‍රත්‍ය කරගෙන සිදුවෙන බව, ඒක විතරයි තේරුම් ගන්නෙ. අන්න ඒකයි මෙතන තාදී ගුණය. එතකොට ඔන්න ඕකයි 'තාදී භූමිය'. අපි ටිකක් ගැඹුරින් කල්පනා කළොත් ඒ විදියටයි ගන්න තියෙන්නෙ. 'ඊළඟට තිබෙන්නෙ ඒ සූත්‍රයේ අගට එන ගාථා දෙක.

'යං කිඤ්චි දිට්ඨංව සුතං මුතං වා - අජ්ඣෝසිතං සච්චමුතං පරේසං
න තෙසු තාදී සයසංවුතේසු - සච්චං මුසා වාපි පරං දහෙය්‍යං

එතං ච සල්ලං පටිකච්ච දිස්වා - අජ්ඣෝසිතා යත්ථ පජා විසත්තා
ජානාමි පස්සාමි තථෙව එතං - අජ්ඣෝසිතං නත්ථි තථාගතානං'

අන්‍යයන් විසින් සත්‍යය හැටියට හඳුන්වනු ලබන යම්කිසි දුටු දෙයක් ඇසූ දෙයක් විඳි දෙයක් ඇද්ද, - සයසංවුත කියන එක එක්තරා ගැටලු විදියක වචනයක්. අපි මේකට දුන්න අර්ථය, තම තමන්ට සීමා වූ එහෙම නැත්නම් ස්වකීයත්වයෙහි කොටුවූ කියල ගන්නත් පුළුවන්. - තම තමන්ට විතරක් සීමාවූ ඒ දිට්ඨ සුත මුත විඤ්ඤාත ආදිය පිළිබඳව - ඒ සත්‍යයන් පිළිබඳව - තාදී වූ මම ඒ එකක්වත් (ඒ දිට්ඨ සුත මුත විඤ්ඤාත ආදිය පිළිබඳ) අනිකකුගේ බස සත්‍යය කියා හෝ බොරුය කියා හෝ නොකියමි. අර තාදි බව නිසාමයි. ඒකාන්ත සත්‍යයක්ය කියල කියන්නෙත් නැහැ, ඒකාන්ත බොරුවක්ය කියල කියන්නෙත් නැහැ.

'එතං ච සල්ලං පටිකච්ච දිස්වා' මේ කියන දිට්ඨි උල කලින්ම දැකල, මේ සත්ත්ව ප්‍රජාව ඇමිණිල සිටින මේ දිට්ඨි උල කලින්ම දැකල, 'ජානාමි පස්සාමි තථෙව එතං' 'දනිමි දකිමි මෙය එසේමය'යි යන අජ්ඣෝසිතයක්, වෙලී පැටලී සිටීමක්, තථාගතයන් වහන්සේලා තුළ නැත. ඔය විදියටයි ඒ සූත්‍රය අවසාන වෙන්නෙ.

එතකොට මේ ගාථාවෙ තියෙන වචන පිළිබඳවත් නිරුක්ති පිළිබඳ යම් යම් පටලැවිලි තියෙනව. ඒව තුළින් අපට මතුකර ගන්න පුළුවන් මේ සූත්‍රයේ තවත් ගැඹුරු අර්ථ රාශියක්. මේ 'සයසංවුත' කියන පදය ලොකුම ගැටලු පදයක්. අටුවාවෙ මේක තෝරන්නෙ 'සයසංවුතෙසූ ති සයමෙව සරිත්වා පියායිත්වා ගහිත ගහණේසු දිට්ඨිගතිකෙසු ති අත්ථො. දිට්ඨි ගතිකාහි සයසංවුතා ති වුච්චන්ති[2] තමාම සිහිකොට ප්‍රියවශයෙන් සළකාගෙන අල්ලාගත් ග්‍රහණ ඇති දෘෂ්ටිගත් අයයි. සයසංවුත කියල කියන්නෙ දෘෂ්ටි අල්ලගත්තු අයයි. 'සයසංවුත' කියන එක අටුවාව තෝරන්නෙ එහෙමයි. නමුත් අපි මෙතෙන්දි ගත්තෙ, අල්ලාගත් දෘෂ්ටි, ඒ මතිමතාන්තරයි. මෙතන සයසංවුත කියල කියන්නෙ පුද්ගලය නොවෙයි. මේක සහේතුක බව පෙන්වන්න අපට සාධක වශයෙන් පෙන්වන්න පුළුවනි, සයසංවුත කියන එකෙන් ගතයුතු අදහස තේරුම් ගැනීමට හුඟක් උපකාර වෙනව මේ කාළකාරාම සූත්‍රයේ කියවෙන අදහසට අදාළ කාරණා රාශියක් ඉදිරිපත් කරන සුත්තනිපාතෙ අට්ඨක වග්ගයෙ එන යම් යම් සූත්‍ර. සුත්ත නිපාතයෙ අට්ඨක වග්ගයෙ විශේෂයෙන්ම ඒ කාලයේ විවිධ දෘෂ්ටිවාදීන්

අතර තිබුනු මත භේද විවාද පිළිබඳව ගැඹුරු අදහස් රාශියක් ප්‍රකාශ වෙනව. දැන් මෙතන මේ කාරණයට, මේ සයසංවුත කියන වචනයෙ අර්ථය මතුකරගන්න අපට උපකාර වෙන ගාථා කීපයක් පළමුවෙන්ම දක්වන්න පුළුවනි, 'චූලවියූහ' කියන සූත්‍රයෙන්. ඒ සූත්‍රය විකාශනය වෙන්නෙ ප්‍රශ්නෝත්තර වශයෙන්. ප්‍රශ්නයක් අහනව ඒකට පිළිතුරු දෙනව. මේක අටුවාවෙ තෝරන්නෙ බුදු රජාණන් වහන්සේ නිර්මිත බුදු කෙනෙක් මවාගෙන ලෝකයා අහන ප්‍රශ්න ඉදිරිපත් කරල ඒකට පිළිතුරු දුන්න කියලයි. ඒ කොයිහැටි හෝ වේවා ප්‍රශ්නය මෙන්න මේකයි.

'කස්මානු සච්චානි වදන්ති නානා - පවාදියාසෙ කුසලා වදානා
සච්චානි සු තානි බහූනි නානා - උදාහු තෙ තක්කමනුස්සරන්ති'[3]

'මක්නිසාද මේ නානා විධ සත්‍යයන් නොයෙකුත් අය ප්‍රකාශ කරන්නෙ. විරුද්ධ වාද ඇති අය තම තමන් දක්ෂයන් යයි කියා ගනිමින් නා නා විධ සත්‍යයන් ප්‍රකාශ කරන්නෙ මක් නිසාද? ඕකයි ප්‍රශ්නය. ඊළඟ පද දෙකෙන් කියැවෙන්නෙ 'සච්චානි සු තානි බහූනි නානා'. ඇත්ත වශයෙන්ම සත්‍ය කියන දේවල් නා නා විධ දෙයක්ද? (බොහෝ සත්‍යයන් තිබිය හැකිද? කියන එකයි අහන්නෙ) 'උදාහු තෙ තක්කං අනුස්සරන්ති'. එහෙම නැත්නම් ඒ විරුද්ධ වාද ඇති අය නිකම් තර්කය අනුව යන එකක් පමණක්ද මෙතන තියෙන්නෙ. ඔය විදියටයි ප්‍රශ්නය.
ඊට බුදු රජාණන් වහන්සේ දෙන පිළිතුර

'න හෙව සච්චානි බහූනි නානා - අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ
තක්කං ච දිට්ඨීසු පකප්පයිත්වා - සච්චං මුසාති ද්වයධම්මමාහු'[4]

'න හෙව සච්චානි බහූනි නානා' සත්‍යය කියන එක බහුවිධ දෙයක් නොවෙයි. 'අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ' ලෝකයේ සංඥාව හැරුණුවිට, ඒ ඒ සත්‍ය හැටියට ප්‍රකාශ කරන දෘෂ්ටි මතවාදවලට මුල්වූ ඒ සංඥාවෙන් බැහැර, ඒ සංඥාවෙන් පරිබාහිරව, ඒ සංඥාව හැරෙන්ට, වෙන වෙනම සත්‍යය කියල දෙයක් ලෝකයේ නැත. මෙතනින් අපට පේන්නෙ බුදුරජාණන් වහන්සේ අරව ඒකාන්ත සත්‍යය හැටියට පිළිගන්නෙ නැහැ. නමුත් ඒ ඒ සංඥා මට්ටම් නිසා මේ මේ දෘෂ්ටි ප්‍රකාශ කරනව කියන කාරණය තේරුම් ගන්නව. ඒකයි 'අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ' කියල කිව්වෙ. යම්කිසි දෘෂ්ටි මතවාදයක් ඇති වීමට හේතු වුනු සංඥාව - ඒක බුදුරජාණන් වහන්සේ පිළිගන්නව ඒ සංඥාව දකිනව. ඒක නිසා ඒ සංඥාව අනුව මේ දෘෂ්ටිය මතුවිය යුතුය කියන අදහස කියනව බුදුරජාණන් වහන්සේට. අන්න ඒක නිසා ඒව එක්තරා සීමිත

අර්ථයකින් සත්‍යයි. 'තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා - සච්චං මුසාති ද්වයධම්ම මාහු'. ලෝකයේ සාමාන්‍යයෙන් කෙරෙන්නෙ මෙන්න මේ විදියෙ දෙයක්. තම තමන් ගත්ත ඒ දෘෂ්ටීන් පිළිබඳව තර්කය උපකාර කරගෙන - දෘෂ්ටීන් පිළිබඳව තර්කය යොදමින් - තර්කය උපකාර කරගනිමින්, සත්‍යයක් මුසාවක් කියල දෙකක් ලෝකයේ හදාගෙන තියෙනව. මේ කාරණය තවත් විග්‍රහ වෙනව ඊළඟට තිබෙන මහාව්‍යූහ සූත්‍රයෙන්.

"සකං හි ධම්මං පරිපුණ්ණමාහු - අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු
එවම්පි විග්ගය්හ විවාදියන්ති - සකං සකං සම්මුතිමාහු සච්චං"

විරුද්ධ වාද ඇති අය කියාගන්න ආකාරයයි, වාද කරන ආකාරයයි, මේ ගාථාවෙන් ප්‍රකාශ වෙන්නෙ. "සකං හි ධම්මං පරිපුණ්ණමාහු" තමාගේ ධර්මය සම්පූර්ණයයි කියත්. "අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු" අනිකාගේ ධර්මය හීනයයි කියත්. "එවම්පි විග්ගය්හ විවාදියන්ති" මෙසේ දැඩිකොට ගෙන විවාද කරත්. "සකං සකං සම්මුතිමාහු සච්චං" තම තමන්ගේ සම්මුතියට සත්‍යයයි කියා ගනිත්.

ඔන්න එතනත් කියවෙනව අර "සකං සකං සම්මුති" අර සයසංවුති කියන වචනයට ටිකක් අදාල වචන මේ අහු වෙන්නෙ. ඒකට යම්කිසි ඉඟියක් මේ අහුවෙන්නෙ, සාධක. "සකං සකං සම්මුතිං ආහු සච්චං" තම තමාගේ සම්මුතියට ලෝකයා සත්‍යයයි කියනව.

තවත් ගාථාවක් අපට හමුවෙනව මේකට අදාළ, පසූර සූත්‍රයේ - ඒකත් ඔය අට්ඨක වග්ගයේමයි.

"ඉධෙව සුද්ධි ඉති වාදියන්ති - නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු
යං නිස්සිතා තත්ථ සුභං වදානා - පච්චෙක සච්චෙසු පුථූ නිවිට්ඨා"[5]

ඒත් අර විදියටම වාදකරන අය පිළිබඳවයි කියන්නෙ. "ඉධෙව සුද්ධි ඉති වාදියන්ති" මේ මගේ ධර්මයේ විතරයි, මගේ ශාසනයෙ විතරයි ශුද්ධිය තියෙන්නෙ. "නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු". අනිකුත් ධර්මයන්හි විශුද්ධියක් නැත. ඔය විදියට කියනව. "යං නිස්සිතා තත්ථ සුභං වදානා" යමක ඇලිල සිටිනව නම් ඒ පිළිබඳව සුභ පක්ෂය, ඒකෙ හොඳ පැත්ත විතරක් ප්‍රකාශ කරනව. එහෙම ප්‍රකාශ කරමින් "පච්චෙක සච්චෙසු පුථූ නිවිට්ඨා" පච්චෙක සත්‍යයන් කියන්නෙ තම තමන්ට පමණක් සීමාවූ සත්‍යයන්. දැන් පච්චෙක බුද්ධ' කියල කියන්නෙ තම තමන්ට පමණක් බුදු වූ කියන එකයි. ඒ වගේ පච්චෙක සච්ච' කියල කියන්නෙ තම තමන්ට පමණක්

සත්‍ය වූ "පුදු නිවිට්ඨා" කියන්නෙ වෙන් වෙන්ව ඒ කියන්නෙ විරුද්ධ මත වාද ඇති අය වෙන් වෙන් වශයෙන් තම තමන්ගේ සත්‍යයන්හි පැලපදියම් වෙලා සිටිනවා. ඔන්න ඔය 'පච්චේක සච්ච' කියන අදහසයි, 'සකං සකං සම්මුති' කියන අදහසයි මේ 'සයංසංවුත' කියන වචනයෙන් ප්‍රකාශ වෙන්නෙ. එතකොට සයසංවුතෙසු කියන්නෙ ස්වකීය වශයෙන් කොටුවූ - ස්වකීයත්වයෙන් ආවරණය වූ එයින්ම කොටුවූ පටුවූ ඒ දෘෂ්ටීන් පිළිබඳව තථාගතයන් වහන්සේ අනිකෙකු සත්‍යය කියා හෝ මුසාය කියා හෝ ඒකාන්ත වශයෙන් දරන්නෙ නැතෙයි කියන එකයි. එතකොට ඒ වචනය ඒ විදියටයි. තවත් පොඩි කාරණයක්, අර "පරං දහෙය්‍යං" කියන එකත් අටුවාවෙ තෝරන්නෙ, "පරං" කියන වචනය තෝරන්නේ "උත්තමං කත්වා". නමුත් මෙතන "පරං" කියල කියන්නෙ "අනිකා" කියන එකයි. ඒකත් සුත්ත නිපාතයේ ගාථා වලින් අපට හෙළි වෙනව. ඔය චූළවියූහ සූත්‍රයෙන් එහෙම,

"යෙනෙව බාලොති පරං දහාති - තෙනාතුමානං කුසලොති චාහ"[6]

යම් කාරණයක් නිසා අනිකා බාලයා යයි කියයිද - බාලයා යයි දරයිද - ඒ ආකාරයෙන්ම තමා දක්ෂයෙකැයි කියයි. අන්න එතැන "පරං දහාති" කියල කියැවෙනව. අනිකා මෝඩයකු හැටියට බාලයකු හැටියට දරයි. එතකොට මෙතැන පරං කියල කියන්නෙ අනිකා කියන එකයි. ඔය විදියට අපිට මේ ගාථාවල මූලික අර්ථය ගන්න පුළුවනි. මේ සූත්‍රයේ අගට එන පාඨයක් ඉතාම වැදගත් "ජානාමි පස්සාමි තථෙව එතං - අජ්ඣොසිතං නත්ථි තථාගතානං" දනිමි දකිමි එය එසේමයයි යන වෙලී පැටලී සිටීමක් තථාගතයන් වහන්සේලා තුළ නැත. දැන් මෙයින් මේ ප්‍රකාශ වෙන කාරණයට හේතුව මොකද? ලෝකයා සළායතනයෙන් නිපදවා ගන්න- සළායතන තුළින් නිපදවෙන - දිට්ඨසුත මුත විඤ්ඤාත ආදිය දැඩිව දෘෂ්ටි ග්‍රාහයෙන් අල්ලා ගන්නව. නමුත් තථාගතයන් වහන්සේලා ඒ වගේ වෙලී බැඳී පැටලී සිටීමක් ඇතිකර ගන්නෙ නැත්තෙ මක්නිසාද, සළායතන නිරෝධය දුටුව නිසයි. මේ සළායතන නිරෝධය දැකීමට අපි නිදසුන් කියනවනම්, යම්කිසි අධිවේග ක්‍රියාකාරිත්වයකින් යුක්ත යන්ත්‍රයක ආවරණ තහඩුව ගලවල, ඒක ඇතුලේ කෙරෙන මහාපුදුම විදියේ චලන, භ්‍රමණ, ස්පන්දන, ධාවන ක්‍රියාවලිය පෙන්නුම් කරන්න වගේ බුදුරජාණන් වහන්සේත් අපට සළායතන කියන මේ මහා යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය, අර අපි කලින් දවසේ උපුටා දැක්වූ 'ද්වයං' කියන සූත්‍රයෙන් විදහා දැක්වුව. ඒ සූත්‍රයේදී අපි එදා දැක්වුව "චක්ඛුං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී, රූපා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො ඉච්චෙතං ද්වයං චලං චෙව ව්‍යයං ච විපරිනාමී අඤ්ඤථාභාවි" ඔය ආදී වශයෙන් දීර්ඝ සූත්‍රකොටසක් අපි එදා

දැක්වුව. "මහණෙනි ඇස අනිත්‍යයි වෙනස් වෙමින් තිබෙනව අන්‍යාකාරයකට පරිවර්තනය වෙනව, රූපයනුත් අනිත්‍යයි ඒ වගේම චක්ඛු විඤ්ඤාණයත් අනිත්‍යයි" ඔය විදියට දිගටම කියාගෙන ගිහිල්ල අවසානයේ කියැවෙනව "ඵුට්ඨො භික්ඛවෙ වෙදෙති, ඵුට්ඨො චෙතෙති, ඵුට්ඨො සඤ්ජානාති ඉච්චෙතෙ ධම්මා චලා චෙව වයා ච අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො". මේ සළායතනයෙන් නිෂ්පාදනය වන කොටස තමයි අන්තිමට කියැවෙන්නෙ. මේ ස්පර්ශ නිසා ඇති වෙන වේදනාදී මේ හැම එකක්ම අනිත්‍යයි. චලනය වෙනව, වෙනස් වෙනව, ගෙවී යනව ඔය විදියට වචන රාශියක් බුදු රජාණන් වහන්සේ යොදනව, මේවායින් නිපදවෙන වේදනාවන් චේතනාවන් ගැන. දිට්ඨ සුත මුත විඤ්ඤාත කියල කියන්නෙ මේ සංඥා ගොඩයි. සංඛත සංඥා ගොඩක්. සංඛත කියල කියන්නෙ නිෂ්පාදනය කරන ලද දේවල්. අපට මේ සළායතනය කියන එක හඳුන්වන්න පුළුවන් අධිවේග ක්‍රියාකාරිත්වයකින් යුක්ත යම්කිසි යන්ත්‍රයක් හැටියට. ඒ යන්ත්‍රයේ සම්පූර්ණ ක්‍රියාවලිය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. මේ හැම එකක්ම චලනය වෙනව, භ්‍රමණය වෙනව, ස්පන්දනය වෙනව, ධාවනය වෙනව, ගෙවී ගෙවී යනව. ඔය විදියෙ ස්වභාවයක් තියෙනව. අන්න ඒ සංඛතය බුදුරජාණන් වහන්සේ තේරුම් ගත්ත. මේ සංඛතය එසේ වෙන්නෙ සංස්කාරයන්ගෙන් කියල, ඒ සංස්කාරයනුත් බුදු රජාණන් වහන්සේ දැක්ක. මේක සංඛතයක් බව බුදු රජාණන් වහන්සේ දැක්ක. අන්න ඒක නිසා තමයි ඒ සළායතනයෙන් නිෂ්පාදනය වන දිට්ඨ සුත මුත විඤ්ඤාත පිළිබඳව අර විදියට දෘෂ්ටි ග්‍රාහයෙන් අල්ලගන්නෙ නැත්තෙ. ඒ එකකවත් හරයක් නෑ. ඒ හැම එකක්ම නිස්සාරයි. අර ක්‍රියාවලිය හැරෙන්න අමුතු 'දෙයක්' මෙතන නැහැ. ගත හැකි 'දෙයක්' නැහැ මෙතෙ, කියන ඒ අවබෝධයයි. එතකොට මෙන්න මේ කාරණය තමයි බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. මෙතෙක් අපි මේ සූත්‍රයෙන්මයි තේරුම් කරන්න ගත්තෙ. මේ නිරුක්ති ආදිය මතුකර ගත්තෙ. මේවා වඩාත් පහසුවෙන් තේරුම් ගන්න උපකාර වෙනව යම්කිසි උපමාවක් අපි මේකට ළංකර ගත්තොත්.

බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය මායාවකට උපමා කරල තියෙනව. අපි කලින් අවස්ථාවකත් උපුටා දැක්වුව "ඵෙන පිණ්ඩූපම" සූත්‍රයෙ, ඛන්ධ සංයුත්තයෙ එන ඒ සූත්‍රයේ බුදු රජාණන් වහන්සේ -

"ඵෙන පිණ්ඩූපමං රූපං - වෙදනා බුබ්බුළූපමා,
මරීචිකූපමා සඤ්ඤා - සංඛාරා කදලූපමා.
මායූපමඤ්ච විඤ්ඤාණං - දීපිතාදිච්චබන්ධුනා"

ඇත්ත වශයෙන්ම එය සංග්‍රාහක බුද්ධ දේශනාවක් හැටියටයි ප්‍රකාශ වෙන්නෙ. රූපය පෙන පිඩකට, උපමා කොට, වේදනාව දියබුබුලකට උපමා කොට. සංඥාව මිරිඟුවකට උපමා කොට සංස්කාරයන් කෙසෙල් කඳකට උපමාකොට, විඤ්ඤාණය මායාවකට උපමාකොට ආදිච්චබන්ධු වූ, සූර්‍ය බන්ධු වූ, තථාගතයන් වහන්සේ විසින් පෙන්නුම් කරන ලද්දේය කියල ඔන්න ඔය විදියට ප්‍රකාශ වෙනව ඒ සූත්‍රයේ. මෙතනින් අපට ඕන කරන ටික මායාව පිළිබඳ ටිකයි. මේ විඤ්ඤාණය පිළිබඳ ටිකයි. විඤ්ඤාණය පිළිබඳව ඒ සූත්‍රයේ ප්‍රකාශ වෙනව - ඒ උපමාව සම්පූර්ණ කිරීමට - "සෙය්‍යථාපි භික්ඛවෙ මායාකාරො වා මායාකාරන්තෙවාසී වා චාතුම්මහාපථෙ මායං විදංසෙය්‍ය තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය. තමෙනං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො තං රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය, කිංහි සියා භික්ඛවෙ මායාය සාරො."

එවමෙව ඛො භික්ඛවෙ යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති අසාරකඤ්ඤෙව ඛායති කිංහි සියා භික්ඛවෙ විඤ්ඤාණෙ සාරො." මෙකෙ අදහස, "මහණෙනි යම්සේ මායා කාරයෙක් - විජ්ජා කාරයෙක් - හෝ විජ්ජා කාරයෙකුගේ අත වැසියෙක් හෝ සිවු මහා සන්ධියක විජ්ජාවක් දක්වන්නේද, එය නුවණැස ඇති පුද්ගලයෙක් බලන්නේය ඒ ගැන සිතා බලන්නේය ඒ ගැන නුවණින් පිරික්සා බලන්නේය එසේ බලන ඔහුට එය හිස් බව බොල් බව වැටහෙන්නේය. කොයින්ද මහණෙනි විජ්ජාවක සාරයක්. "එසේම යම්කිසි විඤ්ඤාණයක් අතීත අනාගත පච්චුප්පන්න අජ්ඣත්තික බහිද්ධා, ආදී ඒ කියාපු ඒ හැම ආකාරයකම විඤ්ඤාණයක් පිළිබඳව භික්ෂුවක් එය නුවණින් දකිනව මෙනෙහි කරනව කල්පනා කරනව නුවණින් විමසා බලනව. එසේ බලන්නා වූ ඔහුට ඒ විඤ්ඤාණය හිස් හැටියට නිසරු හැටියට වැටහෙනව. කොයින්ද මහණෙනි විඤ්ඤාණයේ සාරයක්?

## අධෝලිපි

1. නාලක සු.සු.නි. බු.ජ. 25 - 230 පිට
2. මනො. II 485 පිට (හේ.මු.)
3. සු.නි. බු.ජ. 25 - 280 පිට
4. සු.නි. බු.ජ. 25-284 පිට
5. සු.නි. බු.ජ. 25 - 260 පිට
6. සු.නි. බු.ජ. 25 - 280 පිට

# 26 වන
# දේශනය

# 26 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අත්හැරදැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය'

අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන්වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ විසිහය වන දේශනයයි මේ.

සත්‍යය අසත්‍යය යන සංකල්ප දෙක සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් ලෝකයේ සම්මතව පවතින මතිමතාන්තර ගැන ඉතාමත්ම ගැඹුරු විග්‍රහයක් කාළකාරාම සූත්‍රයේ අඩංගුවන බව මෙතෙක් කළ විවරණයෙන් පවා පෙනී යනව. පාඨාන්තර අතරින් නිවැරදි පාඨය පවා තෝරා බේරා ගැනීමට අපහසු තරමට වල්බිහි වී ඇති මේ අගනා සූත්‍ර දේශනාවට ළංවීමට සෑහෙන කැලෑවක් එළිකර ගන්න අපට සිද්ධ උනා. ශාස්ත්‍රීය ස්වරූපයක් දරණ අර්ථ විවරණ නිරුක්ති ආදිය ඔස්සේ දැන් අපි මේ සූත්‍රයේ මූලික අදහස් ටික මතුකර ගෙන තිබෙනව. දැන් මෙතැන් සිට අපට තිබෙන්නේ මේ සූත්‍ර දේශනාවෙන් බුදු රජාණන් වහන්සේ ලෝකයට ඉදිරිපත් කරන ගැඹුරු දර්ශනය ප්‍රතිභානය තුළින් අපේ ප්‍රත්‍යක්ෂයට ළංකර ගැනීමට උත්සාහ කිරීමයි. තර්කයෙන් තළා ඔප මට්ටම් කළ දෘෂ්ටි -'තක්ක පරියාහත දිට්ඨි' - නිපදවන නිෂ්පාදනාගාරය වන සළායතනයේ ඇතුල් පැත්ත විශිෂ්ට ඥානයෙන් දැකල තේරුම් ගත්තු තථාගතයන් වහන්සේට ඒ සළායතනයේ පිටපැත්ත පමණක් දකින පුහුදුන් ලෝකයා සමඟ අදහස් හුවමාරු කරගැනීම එක්තරා විදියක ගැටලුවක් උනා. මේ ගැටලුව තේරුම් ගැනීම පහසු වීමට අපි එදා ඛන්ධසංයුක්තයේ "ඵෙන පිණ්ඩූපම" සූත්‍රයේ අර විඤ්ඤාණය මායාවකට උපමා කරන තැන ඒ සූත්‍ර දේශනාවෙන් උපුටා දැක්වුවා.

"සෙය්‍යථාපි භික්ඛවෙ මායාකාරො වා මායාකාරන්තෙවාසී වා චාතුම්මහාපථෙ මායං විදංසෙය්‍ය තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍යං තමෙනං පස්සතො නිජ්ඣායතො යොනිසො

උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය, කිංහි සියා භික්ඛවෙ මායාය සාරො. එවමෙව ඛො භික්ඛවෙ යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං, අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති. තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති අසාරකඤ්ඤෙව ඛායති, කිංහි සියා භික්ඛවෙ විඤ්ඤාණෙ සාරො."

යම් සේ මහණෙනි මායාකාරයෙක් හෝ මායාකාර අතවැසියෙක් හෝ - මේ කාලයේ ව්‍යවහාරයෙන් කියනව නම් විජ්ජාකාරයෙක් හෝ විජ්ජාකාර අතවැසියෙක් හෝ - සිවුමහා සන්ධියක විජ්ජාවක් දක්වන්නේද, එය නුවණැස ඇති පුරුෂයෙක් බලන්නේය. නුවණින් සළකන්නේය. නුවණින් විමසා බලන්නේය. ඒ ගැන සිතා බලන්නේය. එසේ එය බලන්නාවූ - එහෙම නැත්නම් එය දකින්නාවූ, ඒ ගැන සිතන්නාවූ, එය නුවණින් විමසා බලන්නා වූ ඔහුට එය හිස් ලෙස වැටහෙන්නේය. බොල් ලෙස වැටහෙන්නේය. නිසරු ලෙස වැටහෙන්නේය. කොයින්ද මහණෙනි මායාවක, විජ්ජාවක, සාරයක්. එසේම මහණෙනි යම්කිසි විඤ්ඤාණයක් අතීත අනාගත පච්චුප්පන්න හෝ ආධ්‍යාත්මික හෝ බාහිර හෝ ඖළාරික හෝ සියුම් හෝ හීන හෝ ප්‍රණීත හෝ දුර හෝ ළඟ හෝ යම් කිසි විඤ්ඤාණයක් භික්ෂුවක් දකින්නේය. නුවණින් දකින්නේය, කියන එකයි. ඒ ගැන සිතා බලන්නේය. නුවණින් විමසා බලන්නේය. එසේ බලන්නාවූ ඒ භික්ෂුවට එය හිස් ලෙස බොල් ලෙස නිසරු ලෙස වැටහෙයි. කොයින්ද මහණෙනි විඤ්ඤාණයක හරයක්."

මෙන්න මේ විදියට බුදුරජාණන් වහන්සේ මේ විඤ්ඤාණය මායාවකට උපමා කරල දේශනා කරල තියෙනව. මේක අනිකුත් කිසිම දර්ශනයක නැති විදියේ මහා පුදුම දේශනාවක්. මක්නිසාද, ආත්ම දෘෂ්ටිය - ආත්ම දර්ශනය - අනිකුත් හැම පදනමක්ම දෙදරල යනකොට අල්ල ගන්නෙ මේ විඤ්ඤාණයයි. මේ විඤ්ඤාණයත් බුදු රජාණන් වහන්සේ එතකොට හිස්ලෙස, බොල් ලෙස, නිසරු ලෙස මායාවක් ලෙස විජ්ජාවක් ලෙස මෙතෙන්දි දක්වල තිබෙනව. මේ විජ්ජාව පිළිබඳව බුදු රජාණන් වහන්සේ ඉදිරිපත් කළ කාරණය තවදුරටත් තේරුම් ගැනීමට උත්සාහ කරමු.

ඒ කාලයේ මායාකාරය කියල කිව්වෙ විජ්ජා කාරයට. එහෙම නැත්නම් ඊටත් වඩා ව්‍යවහාර භාෂාවක් පාවිච්චි කරනව නම් "මැජික් කාරයට". අපි හිතමු දැන් විජ්ජා කාරයෙක් යම් කිසි ශාලාවක විජ්ජා දැක්මක්, මැජික් දැක්මක් පවත්වනව. එතෙන්ට පැමිණි පිරිස අතරින් යම්කිසි

නුවණැස ඇති පුද්ගලයෙක්, ඥානවන්ත පුද්ගලයෙක් කල්පනා කරනව "මම අද මේ විජ්ජාව හරියටම දකින්න ඕන", කියල. ඔය විදියට අධිෂ්ඨානයක් කරගෙන අනික් අයට නොපෙනී වේදිකාවෙ කොනක සැඟවී ගන්නව. විජ්ජා දර්ශනය ආරම්භයේදී එහෙම සැඟවීගෙන ටික වෙලාවක් බලාගෙන ඉන්න කොට, මේ විජ්ජාකාරයා කරන දේ, දර්ශනය ආරම්භ උනාම වැඩි වෙලා යන්ට කලින් මේ පුද්ගලයට පෙනෙනව, අර විජ්ජා කාරයගෙ කපටි කම්. ඒ ව්‍යාජ උපකරණ, හොර නූල්, හොර බොත්තම්. හොර සාක්කු, ඒ හැම දෙයක්ම, අර පෙට්ටිවල තිබෙන බොරු අඩි - ඒ හැම එකක්ම මේ පුද්ගලයට පෙනෙනව. ප්‍රේක්ෂකාගාරයේ, ශාලාවේ සිටින අයට පේන්නෙ නැති රහස් උපකරණ ආදී සියල්ලම හොඳට පෙනෙනව. අන්න එහෙම පෙනෙන්න ගත්තහම මේ එකකවත් විජ්ජාවක්-මැජික් එකක් නැහැ කියන හැඟීමක් එනව. ඒ පිළිබඳව එක්තරා විදියක කලකිරීමක් ඇතිවෙනව. අර කලින් තිබුණු විජ්ජාදර්ශනය දැකීමේදී ඇතිවුනු කුතුහලය, විස්මය, ත්‍රාසය, හාස්‍යය වැනි කිසිම හැඟීමක් මේ පුද්ගලය තුළ ඇතිවෙන්නෙ නැහැ. ඒ වෙනුවට එක්තරා විදියක උපේක්ෂා සහගත සන්සුන් හැඟීමක් ඇති වෙන්නෙ. එතකොට විජ්ජාවෙ තවත් බලන්න දෙයක් නැති නිසා මේ පුද්ගලය ඒ උපේක්ෂාව පිටම අර ප්‍රේක්ෂකාගාරය දිහා, ප්‍රේක්ෂකාගාරයේ නරඹන්නන් දෙස, හොඳ යොමු කරනව. එතකොට වෙනස පෙනෙනව. එහෙම පිටින්ම ඒ ශාලාව දික් කර ගත්තු ගෙලවල් වලින් පිරුණු ශාලාවක්, කටවල් ඇරගෙන ඇසුත් ඇරගෙන බලාසිටින ආ-ඕ-හූ ආදී හඬ නගමින් විස්මය ප්‍රකාශ කරන ජනකායක් මේ පුද්ගලයට පෙනෙනව. එතකොට එක්තරා විදියක සංවේගයකුත් අනුකම්පාවකුත් ඇතිවෙනව, තමනුත් ඒ තත්ත්වයෙ හිටිය නේද කියල. ඔන්න ඔය විදියට එතකොට විජ්ජාව පිළිබඳව හරි හැටියටම මේ පුද්ගලය දැක්ක. දැකල ඉතින් විජ්ජා දර්ශනය අවසන් උනාට පස්සේ මේ ශාලාවෙන් එළියට එනව. එළියට ඇවිල්ල අනික් අයට නොපෙනී යන්නයි උත්සාහ කරන්නේ. නමුත්, තමන් අඳුනන යම් කිසි මිත්‍රයෙක්, ප්‍රේක්ෂක ශාලාවේ ඒ විජ්ජා දර්ශනය නැරඹූ කෙනෙක් හමුවෙනව. ඒ තැනැත්ත පටන් ගන්නව ඊළඟට මේ විජ්ජාකාරයගෙ හපන්කම් ගැන විස්තරයක්. ලොකු ප්‍රශංසාත්මක විස්තරයක් කියන්න පටන් ගන්නව. තමන්ගේ යාලුවත් ඊට හවුල් වෙය කියල. නමුත් උපේක්ෂාවකින් අහගෙන ඉන්නව මිසක් මේ නුවණැස ඇති පුද්ගලය මේ අවස්ථාවෙ වෙනද වගේ ඕව ගැන උනන්දුවක් නැති බවක් පෙන්නුම් කරනව. එතකොට මිත්‍රයට මේක පුදුමයට කාරණයක්. මිත්‍රය අහනව "ඇයි ඔබත් මේ ශාලාවෙ නේද හිටියේ" කියල. එතකොට මේ නුවණැස ඇති පුද්ගලය ප්‍රකාශ කරනව "ඔව් මාත් හිටිය තමයි ඒ ශාලාවෙ", "ඔබ නිදාගෙනද හිටියේ"? "නැහැ මම අවදියෙන් හිටියෙ".

"එහෙම නම් හොඳට සැළකිල්ලෙන් බැලුවෙ නැතිව වෙන්න ඇති"? "නැහැ - මම සැළකිල්ලෙන් තමයි බැලුවෙ, සමහර විට මම පමණට වඩා සැළකිල්ලෙන් බැලුව නිසා වෙන්න ඇති" "ඔබ සැළකිල්ලෙන් බැලුව කියල කියනව නමුත් විජ්ජාවක් දැක්ක බවක් නම් පේන්න නැහැ." එතකොට අවසාන වශයෙන් මේ පුද්ගලය දෙන පිළිතුර මොකක්ද?, "නැහැ මම දැක්ක ඒක, කොයි තරම් හොඳට දැක්කද කිව්වොත් මට ඒකෙ විජ්ජාවක් මැජික් එකක් පෙනුනෙ නැහැ".

ඔන්න ඔය විදියට ඒ සංවාදය අපට තේරුම් ගන්න පුළුවනි. මේ සංවාදය ආශ්‍රයෙන් - ඒ කියන්නෙ, නුවණැස ඇති පුද්ගලයත් මසැසින් පමණක් අර විජ්ජාව නැරඹූ පුද්ගලයාත් අතර මේ සංවාදය ආශ්‍රයෙන් අපට තේරුම් ගන්න පුළුවන් අර කාළකාරාම සූත්‍රයේ බුදු රජාණන් වහන්සේ ප්‍රහේලිකා ස්වරූපයෙන් ඉදිරිපත් කළ අර වාක්‍ය කීපය. බුදු රජාණන් වහන්සේටත් මේක ලොකු ගැටලුවක් උනා. මක්නිසාද මේ විඤ්ඤාණ මායාවේ ඇතුල් පැත්ත බුදු රජාණන් වහන්සේ තේරුම් ගත්ත. ඒකත් අර නුවණැස ඇති පුද්ගලය වේදිකාවෙ කොනක සැඟවිල සිටල දුටුව වගේ දෙයක් බුදු රජාණන් වහන්සේ කළේ. ලෝක වේදිකාවෙ කොනක සැඟවී සිටීමෙනුයි මේ අවබෝධය ලබාගත්තෙ. "පටිසල්ලාන" කියන වචනයේ තිබෙනව, සැඟවිල සිටිනව කියන අදහසකුත්. ඒ විදියට පටිසල්ලානවයි අර සළායතනයේ ඇතුල් පැත්ත දුටුවෙ, බුදු රජාණන් වහන්සේ. ඒ ඇතුල් පැත්ත දුටුව නිසා තමයි අර විදියට ලෝකයා සත්‍යය සහ අසත්‍යය පිළිබඳව කරන තර්ක විතර්ක ආදිය පිළිබඳව එක්තරා උපේක්ෂාවකින් බුදු රජාණන් වහන්සේ ඒ දෙස බලන්නෙ, අර සූත්‍රයෙන් හැඟුන ආකාරයට. පළමුවෙන්ම ඒ සූත්‍රය සමඟ අපි සන්සන්දනය කරනව නම් දැන් මේ අපි ඉදිරිපත් කරපු උපමාව, මේ නිදර්ශනය, බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව. "යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං ජානාමි. තමහං අබ්භඤ්ඤාසිං තං තථාගතස්ස විදිතං" කියල පළමුවෙන්ම ප්‍රකාශ කරනව. ඒකෙ අදහස, මාරයා බ්‍රහ්මයා සහිත සදේවක ලෝකයා විසින් යමක් දකින ලදද, අසන ලදද, විඳින ලදද, සිතින් ගන්නා ලදද, සිතින් පැමිණෙන ලදද, විමසා බලන ලදද, කල්පනා කරන ලදද ඒ සියල්ලම මම දනිමි. මම දනිමි කියල නැවතුනේ නැහැ. මම විශිෂ්ට ඥානයෙන්ම දැන ගතිමි. "තමහං අබ්භඤ්ඤාසිං, තං තථාගතස්ස විදිතං" කියන එකෙන් තේරෙන්නෙ තථාගතයන් වහන්සේ ඒක තේරුම් ගත්ත. ඒකෙ යථා ස්වභාවය තේරුම් ගත්ත. ඒක හිස් දෙයක් බොල් දෙයක් නිසරු දෙයක් හැටියට

තේරුම් ගත්ත. අන්න ඒ තේරුම් ගැනීම හොඳ නිසාම තමයි, වඩා සැළකිල්ලෙන් බැලුව නිසා, අර ප්‍රේක්ෂකයින්ට, නරඹන්නන්ට, වඩා හොඳින් බැලුව නිසා, වෙන විදියකින් කියනවනම් විජ්ජා දැක්ම දුටුව, නමුත් 'නැරඹුවෙ' නැහැ. නරඹන්න බැරි තත්ත්වයකට බුදු රජාණන් වහන්සේගේ හිත පත්වුනා, විමුක්ත සිත. අන්න ඒක නිසා තමයි අර "තමහං ජානාමි, තමහං අබ්භඤ්ඤාසිං, තං තථාගතස්ස විදිතං". ඒ අවබෝධය නිසාම ඒ නිසරු බව නිසාම "තං තථාගතො න උපට්ඨාසි" තථාගතයන් වහන්සේ ඒවාට හේත්තු වුනේ නැහැ. ඒව පිළිබඳ ස්ථාවරයක් ගත්තෙ නැහැ. "ජානාමි පස්සාමි තථෙව එතං" දනිමි දකිමි මෙය මෙසේම යයි කියල ඒ විදියට "අජ්ඣොසිතං නත්ථි තථාගතානං" තථාගතයන් වහන්සේලාට වෙලී පැටලී සිටීමක්, දෘෂ්ටිගතික ලෝකයාට වගේ වෙලී පැටලී සිටීමක්, නැහැ. මෙන්න මේ අනුව අපට තේරුම් ගන්න පුළුවන් අර මුල් කොටස. අර සංවාදය ආශ්‍රයෙන් මේ කාරණය තේරුම් ගන්න පුළුවන්. ඒවගේම ඒ සංවාදය ආශ්‍රයෙන් වඩාත් තේරුම් ගන්න පුළුවන් කොටසක් තමයි ඊ ළඟට කියැවෙන්නෙ, කාළකාරාම සූත්‍රයේ. "ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති, අදිට්ඨං න මඤ්ඤති, දට්ඨබ්බං න මඤ්ඤති. දට්ඨාරං න මඤ්ඤති" මෙසේ තථාගත තෙම දුටු දෙයින් වෙන්ව - දුටු දෙයින් අනාවූ - දුටු බැවින් පරිබාහිර වූ - දැකිය යුතු දැක්මක් ඇතැයි නොහඟී. ඒක හරියට අර නුවණැස ඇති පුද්ගලය ශාලාවෙන් එළියට ආවට පස්සෙ තමා විජ්ජාව දැක්ක, විජ්ජාව නැරඹුව කියල කෙළින් කියන්න බැරි තත්ත්වයක් ඇති උනා වගේ. මක් නිසාද තථාගතයන් වහන්සේ සළායතනය පිළිබඳව ඇතුළත ක්‍රියා කාරිත්වය - හේතුප්‍රත්‍යය සම්බන්ධය-දුටුව නිසාම. ඒ අවබෝධය ලැබුව. දුටු කෙනෙක් නැහැ. දුටු දෙයක් නැහැ. දුටු බවක් විතරයි. දිට්ඨයක් පමණයි. "දිට්ඨෙ දිට්ඨ මත්තං" අර බාහිය සූත්‍ර ආදියෙන් අපි එදා උපුටා දැක්වුව කාරණා තව දුරටත් තේරුම් ගන්න පුළුවනි. දිට්ඨයක් පමණයි එතන තියෙන්නෙ, දුටු බවක් මිසක් දුටු දෙයක්, දකින්න දෙයක් නැහැ එතන. මැජික් එකක් නැහැ එතන. ඒක නිසා තමයි "දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති" තමා විජ්ජාවක් දැක්කයි, විජ්ජාවක් නැරඹුවයි කියන ඒ විදියට මඤ්ඤනාවක් ඇතිකර ගන්න බැහැ. ඒ වගේම "අදිට්ඨං න මඤ්ඤති" දැන් අර ඒ පුද්ගලයගේ මිත්‍රයට හුඟක් ඕනකම තිබුන තමාගේ මේ යාලුව ශාලාවේදී නිදාගෙන හිටියද කියල දැනගන්න. එහෙම නැත්නම් ඒක දැක්කෙ නැද්ද කියල දැන ගන්න. එහෙමත් කියන්න බැරි තත්ත්වයක් තියෙනව. "අදිට්ඨං න මඤ්ඤති". තථාගතයන් වහන්සේ මේව නුදුටුවත් නොවෙයි. නුදුටුවයි කියල කියන්නත් බැහැ. ඊ ළඟට "දට්ඨබ්බං න මඤ්ඤති". දකින්න දෙයක් නැහැ මෙතන. ඒ උපේක්ෂාව කොයි තරම් වැඩි උනාද කියතොත් අර

විජ්ජා දර්ශනය එපා වෙලා අර නරඹන්නන් දිහා බැලුව. අන්න ඒ විදියට මැජික් දර්ශනය ආශ්‍රයෙන්ම අපට හිතාගන්න පුළුවන්, මෙතන දකින්න දෙයක් නැහැ. දුටුබවක් විතරක් මිසක් දැකිය යුත්තක් මෙතන නැහැ, කියන අවබෝධය තථාගතයන් වහන්සේ ලැබුව. ඒ වගේම "දට්ඨාරං න මඤ්ඤති" දකින්නෙක් නැහැ. අර ශාලාවෙන් පිටත් උන අනික් ඔක්කොම නරඹන්නන්. මේ පුද්ගලය විතරක් 'නරඹන්නෙක්' නොවෙයි. 'ප්‍රේක්ෂකයෙක්' නොවෙයි. 'ප්‍රේක්ෂකය' කියන ලේබලයට ගැලපෙන්නෙ නැහැ. මක් නිසාද, අර වේදිකාවෙ කොනක ඉඳගෙන අර මැජික් එකේ ඇතුළ දැක්ක නිසා. ඔන්න ඔය විදියට "දට්ඨාරං න මඤ්ඤති". ඒ ආශ්‍රයෙන් අපට ඒ ටිකත් තේරුම් ගන්න පුළුවනි. ඊ ළඟට අපට අතහැරුන කොටසක්. "ජානාමි" කියන ප්‍රශ්නය නිසාම ඊ ළඟට මතු වෙනව තථාගතයන් වහන්සේ ලෝකයාට ප්‍රකාශ කළොත් "තමහං න ජානාමීති වදෙය්‍යං තං මම අස්ස මුසා" මම මේ විජ්ජාව දුටුවෙ නැහැ කියල ප්‍රකාශ කළොත් ඒක මගේ බොරුවක් වෙනව. ඒක නිසා තමයි අර සංවාදය අවස්ථාවේදී අර ලොකු ගැටලුවකට මූන පාන්න සිද්ධ උනේ, ඒ නුවණැස ඇති පුද්ගලයට. "තමහං න ජානාමි" මම එය නොදනිමි කියන්නත් බැහැ. එහෙම කිව්වොත් බොරුවක් වෙනව. අර ශාලාව ඇතුලේ නිදා ගෙනත් නොවෙයි හිටියේ. ඊ ළඟට "ජානාමි ච න ච ජානාමි" ඒ දෙක එකතු කරල කියන්නත් බැහැ. "නෙව ජානාමි න න ජානාමි" කියල කියන්නත් බැහැ. දුටුවෙත් නැහැ නුදුටුවෙත් නැහැ කිව්වොත් ඒකත් දෝෂයක් වෙනව. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් තියෙන්නෙ. මක්නිසාද අර "අබ්භඤ්ඤාසිං" විශිෂ්ට ඥානයෙන්ම තේරුම් ගත්ත නිසා. විශිෂ්ට ඥානයෙන් දුටු නිසා තමයි ඒක හොඳ හැටියට තේරුම් ගත්තෙ. එතකොට මැජික් දර්ශනය ආශ්‍රයෙන් අපිට ඒ කොටසත් තේරුම් ගන්න පුළුවන්.

ඊ ළඟට අගට එන හරිය. "ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨ සුත මුත විඤ්ඤාතබ්බෙසු ධම්මෙසු තාදීයෙව තාදී තම්හාච පන තාදිම්හා අඤ්ඤො තාදී උත්තරිතරොවා පණීතතරොවා නත්ථී" ඒ කොටසත්-අර තාදී කියන වචනය ගැන අපි එදත් විස්තරයක් කළා. තාදී කියන වචනය සාමාන්‍යයෙන් තෝරන්නෙ නම් අර අෂ්ට ලෝක ධර්මයෙන් නොසැලෙන ස්වභාවය කියන ඒ විදියටයි, බොහෝ අවස්ථාවල් වල තෝරන්නෙ. නමුත් මෙතන කියවෙන තාදී බව ඒකමත් නොවෙයි. දෘෂ්ටි පිළිබඳව-දෘෂ්ටි ගතිකයන් පිළිබඳව - අනුගමනය කරන මධ්‍යස්ථ ප්‍රතිපත්තියයි, මෙතන පෙන්නුම් කරන්නෙ. ඒකාන්ත සත්‍යය කියල කියන්නෙත් නැහැ. ඒකාන්ත මුසාව කියල කියන්නෙත් නැහැ. ඒකෙත් එක්තරා ප්‍රමාණයක සත්‍යයක් තියෙනව කියන හැඟීමයි. ඒක නිසාම තමයි අර මිත්‍රයට එකහෙළා උත්තරයක් දෙන්න බැරි. කෙළින්

උත්තරයක් දෙන්න බැහැ. ඒ විදියෙ තත්ත්වයක් තියෙන්නේ. අර තාදී බව නිසා. ඒකත් හරි මේකත් හරි වගේ. ඒක චපල බවක් නිසා නොවෙයි. නොදුටු බවක් නිසා නොවෙයි. මෙතන තියෙන එක්තරා ගැඹුරු කාරණයක් නිසා. මායාවෙ ඇතුළත දැක්ක. ඒ තාදී බවට හේතුව 'තථතා' නම් වූ පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ අවබෝධයයි.

පටිච්ච සමුප්පාදය විග්‍රහ කරන තැන්වල "අවිජ්ජා පච්චයා සංඛාරා" ආදී වශයෙන් දක්වල ඊ ළඟට "අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො" ආදී වශයෙන් අනුලෝම පටිලෝම වශයෙන් දෙපැත්තක් තියෙනව. එතකොට අවිද්‍යාව ඇති තැනක අර උපාදානස්කන්ධ ගොඩගැහෙනව, දුකක් ගොඩගැහෙනව. ඒක නැතෙයි කියල කියන්නෙත් නැහැ. ඊ ළඟට අවිද්‍යාව නැති වෙන කොට - ඒ නිරෝධය - උපාදානස්කන්ධත් ගොඩ ගැහෙන්නේ නැහැ, දැන් මේ විජ්ජා දැක්ම ගැන - මැජික් දර්ශනය ගැන කල්පනා කළොත් මෙතන ඉඳල අපට පටිච්ච සමුප්පාද ධර්මය ගැන එක්තරා ගැඹුරු විග්‍රහයකට බහින්න පුළුවන්. මීට කලිනුත් අපි නොයෙකුත් දේශනවල නාට්‍ය සංදර්ශන, සිනමා දර්ශන ආදිය ආශ්‍රයෙන් මේ පටිච්ච සමුප්පාද ධර්මයේ එක්තරා ගැඹුරු කාරණයක් තේරුම් ගන්න උත්සාහ කළා. දැන් මේ මැජික් දර්ශනයේ ඒක ඊටත් වඩා හොඳට ඔජ්නංවල පෙන්නුම් කරනව. අර සිනමා දර්ශන ආදියේ දී ඒ අන්ධකාරය අවිද්‍යා අන්ධකාරය හැටියටයි අපි දැක්වුවෙ. අඳුරේ ඒ සිනමාවෙ පෙන්වන දේවල් සත්‍ය හැටියට ගැනීම නිසා ඒ අනුව ඒ පුද්ගලයින් නොයෙක් විදියේ මනෝභාවයන් ඇතිකර ගන්න ආකාරය. දැන් මෙතන කෙළින්ම තිබෙන්නෙ "විද්‍යාව" පිළිබඳ ප්‍රශ්නයක්. මෙතන හැබැයි වචනවල තිබෙනව ශ්ලෙෂාර්ථයක්. මේ කාලයේ ව්‍යවහාරයේ හැටියට මෙතන අපි යෙදුව 'විජ්ජාව' කියන එක ඇත්ත වශයෙන් අවිද්‍යාවයි. මහ පුදුම විදියේ ගැටලුවක් මෙතන තිබෙන්නෙ. "අවිජ්ජා පච්චයා සංඛාරා" කියන එක ආශ්‍රයෙන් මේක තෝරන්න ගත්තොත්, මේ 'විජ්ජාව' පිළිබඳ අවිජ්ජාව නිසා තමයි ඒක විජ්ජාවක් වෙන්නෙ. විජ්ජාවෙ විජ්ජා තත්ත්වය රඳා පවතින්නේ ඒක පිළිබඳ අවිජ්ජාව ඇති තාක් පමණයි. මේ කියන විජ්ජාවෙ, විජ්ජා තත්ත්වය තේරුම් ගත්තොත් - ඒ කියන්නේ අවිජ්ජාව නැති උනොත් - එතන විජ්ජාවක් නැහැ.

මේක පටලවා ගන්න පුළුවන් නිසා අපි ඊට වඩා පහසුවෙන්ම කියමු. මේ විජ්ජාවෙ, එහෙම නැත්නම් මැජික් දර්ශනයෙ ඒ මැජික් දර්ශනය දැක්වූ පුද්ගලය උපකාර කර ගත්තු රහස් උපකරණ ආදිය, ඒවා "සංස්කාර" උනා. ඒ සංස්කාර පිහිට කරගෙන තමයි අර නරඹන්නන්, ප්‍රේක්ෂකාගාරයේ

හිටපු අය, එයින් විජ්ජා දර්ශනයක් මවා ගත්තෙ. මැජික් දර්ශනයක් මවා ගත්තෙ. ඒ සංස්කාරයන් ඇති උනේ නැහැ අර නුවණැසින් වේදිකාවෙ කොනක සිට නැරඹූ පුද්ගලය තුළ. ඒක නිසා තමයි ඒ තැනැත්තට ඒකෙ මැජික් එකක් නොපෙනුනෙ. ඒ විදියටම තමයි මායාවෙ යථා ස්වභාවය අවබෝධ කරගන්න පුළුවන් වෙන්නෙ. ඒ නිසා තමයි අර මජ්ඣිම නිකායෙ මහා වේදල්ල සූත්‍රයේ විඤ්ඤාණ පඤ්ඤා කියන දෙකම, ඒ ධර්ම දෙකම, එකිනෙක හා සම්බන්ධතාවක් ඇති ධර්ම හැටියට දක්වල තියෙන්නෙ. ඒව එහෙම පිටින්ම වෙන් කරල දක්වන්න බැහැ. "සංසට්ඨං නො විසංසට්ඨං" ඒව සංසට්ඨයි. නමුත් එක වෙනසක් තිබෙනව. "පඤ්ඤා භාවෙතබ්බා විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං" ඒ ධර්ම දෙක අතරින් ප්‍රඥාව වැඩිය යුත්තක්. විඤ්ඤාණය පිරිසිඳ දත යුත්තක්. ප්‍රඥාව වැඩීමෙන් කරන්නෙ විඤ්ඤාණය පිරිසිඳ දැනගැනීමයි. විඤ්ඤාණය පිරිසිඳ දැන ගත්තාම විඤ්ඤාණයේ දෙයක් නැහැ, හරයක් නැහැ. බොල් බව තේරෙනව. අන්න ඒ වගේ දෙයක් මෙතනදිත් අර නුවණැසින් බැලුව පුද්ගලයාට සිද්ධ උනේ. බැලුව හොඳ වැඩි කම නිසාම අර මැජික් දර්ශනය පෙන්වූ මැජික් කාරය උපකාර කර ගත්තු ඒ උපකරණවල තිබෙන සංස්කාර ස්වභාවය එහෙමම නැතිවෙල ගියා. එයින් අපට පේනව අවිද්‍යාවත් සංස්කාරත් අතර තිබෙන සම්බන්ධතාව. ඒක නිසා තමයි අවිද්‍යාව මුලට දාල තියෙන්නෙ. ඒවයෙ සංස්කාර තත්ත්වය රඳා පවතින්නෙ අවිද්‍යාව උඩයි. සංස්කාරවල යථා ස්වභාවය අවබෝධ වීමම විද්‍යාවයි. ඒ විද්‍යාව පහළ වෙනවත් සමඟම ඒව සුද්ධ සංස්කාර වෙනව. ඒකනිසා තමයි රහතන් වහන්සේලාට - අර අධිමුත්ත ථෙර ගාථාවෙන් එහෙම අපි කලින් දැක්වූ ගාථාවල සඳහන් වුනේ "සුද්ධං ධම්මසමුප්පාදං සුද්ධං සංඛාර සන්තතිං". එක්තරා සීමිත අර්ථයකින් අපි කථා කලොත් අපිට කියන්න පුළුවන් අර නුවණැසින් බැලූ පුද්ගලයා තුළ ඒ විජ්ජාව පිළිබඳ, මැජික් දැක්ම පිළිබඳ, උපාදාන, ගොඩනැඟුනෙ නැහැ. එහෙම නැති අනික් තැනැත්ත තුළයි, මිත්‍රයා තුළයි, එහෙම පිටින්ම ඒව ගොඩ නැඟුනෙ., එහෙම පිටින්ම මැජික් ලෝකයක ඉඳල එළියට ආව වගේ ශාලාවෙන් පිටට ආවෙ. මැජික් භවයක් මවා ගත්ත. මැජික් උපාදාන ස්කන්ධ ගොඩ නහා ගත්ත. ඒ ඔක්කොම සිදු උනේ අර සංස්කාර වල යථා ස්වභාවය තේරුම් නොගැනීම නිසයි.

එතකොට මෙයින් අපට තේරුම් ගන්න පුළුවනි විඤ්ඤාණයේ යථා ස්වභාවය යම් අවස්ථාවක ප්‍රඥාවෙන් පිරිසිඳ දුටුව නම් ඒ අවස්ථාවෙ අර සංස්කාර නිකම්ම සංස්කාර වෙනව. -ශුද්ධ සංස්කාර වෙනව. අනාශ්‍රව ධර්ම-ඒවයින් සංඛතයක් ගොඩ නැගෙන්නෙ නැහැ. උපාදානස්කන්ධ ගොඩ නැගෙන්නෙ නැහැ. භවයෙන් මිදුන. භවයෙ නොවෙයි ඉන්නෙ. ලෝකයේ

ඉන්නව වගේ පේනව නමුත් ලෝකයේ නෙවෙයි. අර ශාලාවෙ හිටිය නමුත් ශාලාවෙමත් නොවෙයි. ඔන්න ඔය විදියෙ තත්ත්වයක්. ඊ ළඟට අපට අර "තාදී" කියන වචනය ඔස්සේ තව දුරටත් අර "තථතාව" - පටිච්ච සමුප්පාද ධර්මය - ගැන තේරුම් ගන්න උත්සාහ කරනව නම්, දැන් මෙතන කිවයුතුව තිබෙනව, අර සංවාදයෙන් අපට හෙළි වෙනව මේ කථාන්තරයෙ තිබෙන බව දෘෂ්ටි කෝණ දෙකක්. දෘෂ්ටි කෝණ දෙකක් පිළිබඳ ප්‍රශ්නයක් මෙතන තිබෙනව. ඒ දෘෂ්ටි කෝණ දෙක අපට පුළුවන් පටිච්ච සමුප්පාදය ආශ්‍රයෙන් තේරුම් කරනව නම්, පටිච්ච සමුප්පාදයත්, පටිච්ච සමුප්පන්න ධර්මත් කියල කොටස් දෙකක් බුදු රජාණන් වහන්සේ දක්වල තියෙනව, සමහර සූත්‍ර වල, නිදාන සංයුක්තයේ එහෙම. කලින් අපි ඒව උපුටා දැක්වුව. "පටිච්චසමුප්පාදංච වො භික්ඛවෙ දෙසිස්සාමි පටිච්චසමුප්පන්නෙ ච ධම්මෙ" මම පටිච්ච සමුප්පාදයකුත් දේශනා කරනව පටිච්ච සමුප්පන්න ධර්මයනුත් දේශනා කරනව. "මේ වචන දෙකට සමාන්තරව යන තව පද දෙකක් සමහර විට යොදනව. "හේතුච සුදිට්ඨො හොති හේතුසමුප්පන්නාච ධම්මෙ". ආර්ය ශ්‍රාවකයා, වෙන එකක් තබා සෝවාන් ඵලය ලැබූ පුද්ගලයා, ගැන පවා සඳහන් වෙනව. ඒ තැනැත්තා විසින් පටිච්ච සමුප්පාදය අර දෙයාකාරයෙන්ම තේරුම් ගෙන තිබෙනව කියලා. "හේතුච සුදිට්ඨො හොති හේතු සමුප්පන්නාච ධම්මෙ" හේතුවත් දුටුව හේතු සමුප්පන්න ධර්මයනුත් දුටුව. ඒකම තමයි අපි කලිනුත් සාකච්ඡා කළ උපතිස්ස-කෝලිත කථාන්තරයෙ-ගිරග්ග සමජ්ජය පිළිබඳ කථාවෙ, - ගිරග්ග සමජ්ජය දැකල කලකිරීමක් ඇති වුනාට පස්සෙ ඒකට හිත සූදානම් වෙල තිබෙන අවස්ථාවෙ අස්සජි ස්වාමීන් වහන්සේ උපතිස්ස පරිබ්‍රාජකයාට "යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ, තෙසංච යො නිරොධො එවං වාදී මහා සමණො" කියල කියන කොට මුලු මහත් සංසාර ගැටලුව-මේ මැජික් දැක්මේ-රහස හෙළි කර ගත්ත උපතිස්ස පරිබ්‍රාජකයා-පසුව, ඒ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ, - අර මුල් පද දෙකෙන්ම "යෙ ධම්මා හෙතුප්පභවා-තෙසං හෙතුං තථාගතො ආහ" - ප්‍රඥාව අධික නිසා තේරුම් ගත්ත. "යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං" සමුදය ටික කීවාම ඒකෙන්ම එක පාරටම තේරුම් ගත්ත, යමක් හටගන්න ස්වභාවය නම් එය නිරුද්ධ වන ස්වභාව යයි කියල. ඒ පද හතරම අහලයි ඊ ළඟට කෝලිත පරිබ්‍රාජකයා සෝවාන් ඵලයට පැමිණියෙ.

කොහොම නමුත් අපට පේනව මෙතන 'හේතු' කියල කියන්නෙ - මේ ගාථාව නා නා ප්‍රකාරයෙන් තෝරනව - නමුත් ඇත්ත වශයෙන් මෙතන ගන්න තියෙන්නෙ 'හේතු' කියල කියන්නෙ ඒ පටිච්ච සමුප්පාද ධර්මතාවයි.

බොහෝ විට පටිච්චසමුප්පාදය කුමක්ද කියල ඇහුවාම අර අංග දොළහ අනුලෝම -පටිලෝම වශයෙන් කට පාඩමින් කියනව මිසක් අර මුලින් තිබෙන ඉතාමත්ම වැදගත් කොටස "අස්මිං සති ඉදං හොති - ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, අස්මිං අසති ඉදං න හොති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති 'කියන පටිච්ච සමුප්පාද ධර්මය අමතක කරනව. ඒක තමයි පටිච්ච සමුප්පාද න්‍යායය. පටිච්ච සමුප්පාද දේශනාවෙ හරය ඒකයි. ඒකයි අර ගාථාවෙ සඳහන් වෙන්නෙ. එහෙම නැතිව "යෙ ධම්මා හෙතුප්පභවා.." ආදියෙන් අවිජ්ජාව නොවෙයි එතන කියන්නෙ. ඒක ඉතාම ගැඹුරු කාරණයක්. මක් නිසාද? අර අංග දොළහම පටිච්ච සමුප්පන්නයි. එකොළහක් නොවෙයි, දොළහම පටිච්ච සමුප්පන්නයි. අවිජ්ජාවත් ආශ්‍රවයන් නිසයි - "ආසව සමුදයා අවිජ්ජා සමුදයො". එතැන ඉතාම ගැටලු තැනක්. නමුත් ඒ අංග දොළහම පටිච්චසමුප්පන්නයි. එතකොට මෙතන ධර්මතාවයි, "අස්මිං සති ඉදං හොති" කියන ඒ ප්‍රකාශයෙන් කියැවෙන්නෙ. පටිච්ච සමුප්පාදය තේරුම් කරන කොට, බහුධාතුක සූත්‍රය[1] ආදියේදී පටිච්චසමුප්පාදය ගැන ප්‍රකාශ කරන කොට, පළමුවෙන් ඉදිපත් කරන්නේ "අස්මිං සති ඉදං හොති" කියන ධර්ම න්‍යායයයි. ඊ ළඟට ඒක සම්බන්ධ කරන්නෙ ද්වාදස අංගයත් එක්ක "යදිදං" "එනම්" කියලයි. ඒ එනම් කියන එකෙන් තේරෙනව, එතකොට, අරව නිදර්ශනයි. පසුව කියන අංග දොළහ නිදර්ශන පමණයි. ඒව පටිච්චසමුප්පන්න ධර්ම. ඒව නොවෙයි හේතු. ඒව හේතු සමුප්පන්න ධර්ම. හේතුව "අස්මිං සති ඉදං හොති - ඉමස්සුප්පාදා - ඉදං උප්පජ්ජති - අස්මිං අසති - ඉදං න හොති ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" අන්න ඒ ධර්මතාවයි, ඒ තථතාවයි, තථාගතයන් වහන්සේ තේරුම් ගත්තෙත්. අර නුවණැසින් බැලූ පුද්ගලයට අර ප්‍රේක්ෂකාගාරය දිහා බලල අනුකම්පාවක් ඇතිවුන අවස්ථාවෙ ඒ පුද්ගලයට ඇති උනෙත් ඒ විදියේ අවබෝධයක්. මමත් මේ විදියෙ තැනක කාලයක් මේ විදියෙ මෝඩකම් කළා නේද කියල. අර අවිද්‍යාව නිසා මෙන්න මෙහෙම ධර්ම පරම්පරාවක් ඇති වෙනව. උපාදානස්කන්ධ ගොඩක් ඇති වෙනව. අවිද්‍යාව නැති උනාම ඒව නැහැ. එතකොට ඔන්න ඔය නිරෝධය දකීමෙනුයි මේ සම්පූර්ණ වෙනස සිද්ධ උනේ. නිරෝධය දකීමෙන් තේරුම් ගන්නව "මේ ලෝකයා ඒකාන්ත සත්‍යය හැටියට - සදාකාලික - නිත්‍ය - හැටියට සළකන හැම දෙයක්ම මේව සිහින්ම ඇති උන දේවල් "මනො පුබ්බංගමා ධම්මා" වගේ. මේවායේ නිරෝධයකුත් තියෙනවා. මේවා මෙතනම නිරුද්ධ වෙනව.

මේ සළායතනයන්ගේ ඇතිවීම කියල සමහර විට පටිච්ච සමුප්පාදය තෝරනකොට අර මව්කුස සම්බන්ධ කරගෙනයි තෝරන්නෙ. නාම රූප

සළායතන යන මේව තෝරන්නේ එහෙම පිටින්ම භෞතික කථාන්තරයක් ආශ්‍රයෙන්. නමුත් මෙතන මේ සළායතනයේ හටගැනීම බුදු රජාණන් වහන්සේ දුටුවේ මව්කුසට හිත යවල නොවෙයි. එහෙම නැත්නම් දරුවකු පිළිබඳ කාරණාවක් නොවෙයි මෙතන. සළායතනයක් ඇතිවෙන ආකාරය ප්‍රඥාවෙන් දුටුව. "චක්ඛුංච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං" ආදී වශයෙන් ඒ දක්වූ කාරණය අනුව ඒ සළායතනයන් ඒ ඒ තැනම හටගන්නව. ඒවායේ නිරෝධයකුත් තිබෙනවා. හටගන්නා ස්වභාවයක් තිබෙනව. අර මැජික් දර්ශනය වගේමයි, මුලුමහත් ලෝකයේම තිබෙන දේවල්. ඒ කාරණය තමයි එතකොට "යෙ ධම්මා හෙතුප්පභවා" ආදී ගාථාවෙන් අපට පේන්නේ. පටිච්ච සමුප්පාද ධර්මය හරියාකාර විස්තර කරනව නම් අපි ඉස්සෙල්ල දක්වන්න ඕන අර "අස්මිං සති ඉදං හොති" කියන ධර්ම න්‍යායය. නියම පටිච්ච සමුප්පාදය එතනයි.

දැන් මෙතන මේ තිබෙන අවුල ඇත්ත වශයෙන්ම කියනව නම් දැන් බුදු රජාණන් වහන්සේ අත දික් කරල 'අන්න කැලයක්' කියල දක්වූවාම යම්කිසි කෙනෙක් ඒ එක එක ගහක් අල්ලගෙන මෙන්න මේකද කැලේ කියල තේරුම් ගත්ත වගේ. එහෙමත් නැත්නම් ඒ කැලේ තියෙන ගස්ටික ගණන් කරල ඔන්න මං කැලේ දැක්ක කියල කියනව වගේ දෙයක්, මේ පටිච්ච සමුප්පාදයෙ අංග 12 කටපාඩම්කර ගැනීමෙන් පටිච්ච සමුප්පාද ධර්මය තේරුම් ගන්නට උත්සාහ ගැනීම. නමුත් මෙතන ඉතාමත් ගැඹුරු කාරණය තමයි මෙන්න මේ පටිච්ච සමුප්පාදය. ඒ කියන්නේ මේ ධර්මතාව. "අස්මිං සති ඉදං හොති ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. අස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති". දැන් මේ දෙක අතර සම්බන්ධය ගැන අපි ටිකක් කල්පනා කරල බලමු. පටිච්ච සමුප්පාදයත් පටිච්චසමුප්පන්න ධර්මත්.

සාමාන්‍ය ලෝකයා අර පටිච්ච සමුප්පන්න ධර්ම-ඒව පටිච්ච සමුප්පන්න බව වත් දන්නේ නැහැ. ඒ ධර්ම තුළයි හැසිරෙන්නේ. ඒකයි සංසාරේ. පටිච්ච සමුප්පාද ධර්මතාව දුටු පුද්ගලය තේරුම් ගන්නව" අවිජ්ජාය සති සංඛාරා හොන්ති[2]. අවිද්‍යාව ඇති කල්හිම සංස්කාරයෝ වෙත්. එතකොට අවිද්‍යාව අල්ල ගන්නෙත් නැහැ. සංස්කාර අල්ල ගන්නෙත් නැහැ. ඇත්ත වශයෙන්ම කියනවනම් පටිච්ච සමුප්පාද ධර්මයෙහි සිත පැවැත්වීම පටිච්ච සමුප්පන්න ධර්මයන්ගෙ ග්‍රහණයෙන් මිදීමේ මඟයි. ඒ කිව්වේ අර අංග දොළහ ගැනම බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ "අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාග ධම්මං නිරොධධම්මං කියල.[3] අවිද්‍යාවත් ඇතුළු මුලු අංග දොළහම- එක එක අංගයක් ගැන බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරනව- අනිත්‍යයි, සංඛතයි, පටිච්ච සමුප්පන්නයි.

ඒ වගේම "ඛය ධම්මං වය ධම්මං විරාග ධම්මං නිරෝධ ධම්මං". ඒව අනිත්‍යයි සංඛතයි. ඒව හදල මවල ගත්තු දේවල් වගේ කියන එකයි. "සංඛතං" කියන එකෙන් හැඟෙන්නෙ ඒකයි. කෘත්‍රිම ස්වභාවයක් තිබෙනව, කියන එකයි. ස්වාභාවික නොවෙයි. සැබෑ නොවෙයි. අනිත්‍යයි, සංඛතයි, පටිච්ච සමුප්පන්නයි. හේතු ප්‍රත්‍යයන් නිසා ඇති උනා. ස්පර්ශය නිසා ඇති උනා - "ඵස්ස". ඊ ළඟට "ඛය ධම්මං" ඒ වගේම ඒව ක්ෂය වෙලා යනවා. "වය ධම්මං" ගෙවී යනව. "විරාග ධම්මං" මැකී යනව. "නිරෝධ ධම්මං" නැති වෙලා යනව. ඔන්න ඔහොම ස්වභාවයක් තිබෙනව. අවිද්‍යාවත් සහිත මේ අංග දොළහෙම මේ මැකී යන ස්වභාවය තිබෙනවා කියලා ප්‍රකාශ කළා. මේක අවබෝධ කර ගත්ත නම්, ප්‍රත්‍යක්ෂයට ළං කර ගත්ත නම්, අර පටිච්ච සමුප්පන්න ධර්මවල නොවෙයි හිත රඳවන්න තියෙන්නෙ. පටිච්ච සමුප්පාදයෙයි. මේක මහ පුදුම කාරණයක්. අර කැලේ ගැන කිව්ව කාරණය වගේ. කැලේ කියල බුදු රජාණන් වහන්සේ මෙතන ඉඳල අත දික් කරල පෙන්නුවෙ, ඒ ගස් බදාගන්න නොවෙයි. ඒ ගස් ගණන් කරන්න නොවෙයි. මෙතන ඉඳලම බලන්න ඕන. ඒක මධ්‍යස්ථ බැල්මකින් බැලුවොත් ඒ ගස් විතරක් නොවෙයි ඒ ගස් අතර පරතරයත් - ඒකත් අහුවෙනව කැලේට. එක බැල්මටම අහු වෙනව. අන්න ඒ විදියෙ දෙයක් මෙතන.

මේ පටිච්ච සමුප්පාදය තේරුම් ගැනීමට නම්, ඒක ප්‍රායෝගික වශයෙන් ජීවිතයට ළංකර ගැනීමට නම්, යුගල යුගල වශයෙන් අරගෙන මේ පටිච්ච සමුප්පන්න දෙකක් අතර තියෙන ඒ ධර්මතාවයේ හිත රඳවන්න ඕන. ඒක ඉතාම අමාරු දෙයක්. මක්නිසාද? ලෝකයා ද්වයතාවට යට වෙලයි ඉන්නේ. එක්කෝ මේක අල්ල ගන්නව නැතිනම් ඒක අල්ල ගන්නවා. අර "නෙව ඉධ න හුරං න උභයමන්තරෙ" කියල කියන ඒ රහතන් වහන්සේගේ සිතේ තත්ත්වය ලෝකයාට තේරුම් ගන්න අමාරුයි. සාමාන්‍ය ලෝකයා ජීවත් වෙන්නෙ එක්කො ඒක අල්ල ගෙන නැත්නම් මේක අල්ලගෙන. එක්කෝ අවිද්‍යාව අල්ල ගන්නවා, නැත්නම් සංස්කාර අල්ල ගන්නවා. දැන් මෙතන ඒ දෙකම නැහැ. අර දෙක අතර සම්බන්ධයෙ හිත පවත්වන අවස්ථාවේදී අවිද්‍යාවෙනුත් තාවකාලිකව තදංග වශයෙන් හෝ මිදුන, සංස්කාරයන්ගේ ඇති මෝහන ස්වභාවයෙනුත් තාවකාලිකව හෝ මිදුන. අපි හිතමු දැන් මේ මැජික් දර්ශනය ආශ්‍රයෙන්ම, ඒ මැජික් දර්ශනය පෙන්වන තැනැත්තා මහා ප්‍රාතිහාර්යයක් වගේ කලින් හිතු දෙයක් කරනව, ඒ කිරීමට උපකාර කර ගත්ත ඒ දේවල් දැන් පෙනෙනව- ව්‍යාජ උපකරණ, හොර නූල්, හොර බොත්තම්, දැන් පෙනෙනව. එතකොට යම් කිසි කෙනෙක් මේ අවස්ථාවෙ කල්පනා කරනව නම් මෙන්න මේ මේ දේවල් නිසයි

මේවයේ සංස්කාර ස්වභාවයක් තියෙන්නේ කියලා එතකොට එපමණටම අර සංස්කාර දැඩිව අල්ල ගන්නේ නැහැ. අවිද්‍යාවත් ඒ පමණටම ගෙවිල යනවා. ඔන්න ඔය කියන විදියටයි එක එක අංග ගෙවිල යන්නේ. "ඛය ධම්මං වය ධම්මං විරාගධම්මං නිරොධ ධම්මං"

එතකොට 'අවිද්‍යාව ඇති කල්හිම සංස්කාරයෝ වෙත්'. සංස්කාරවල සංස්කාර ස්වභාවය තියෙන්නේ අවිද්‍යාව ඇති තාක් පමණයි. අවිද්‍යාව හට ගැනීමෙන් සංස්කාර ඇතිවෙනවා. අවිද්‍යාව නැති කල්හි සංස්කාරවල සංස්කාර තත්ත්වය නැත. අවිද්‍යාව සම්පූර්ණයෙන්ම නැති වුණාම සංස්කාරයනුත් නැත. කියල ඔන්න ඔය විදියට ඒ අංග දෙක. ඒ විදියටම තමයි - ඊ ළඟට - ටිකක් දුර මේක තේරුම් යනකං විස්තර කරන්න බලමු. ඊ ළඟට අපි ගනිමු සංස්කාර සහ විඤ්ඤාණය. "සංඛාර පච්චයා විඤ්ඤාණං" - සාමාන්‍යයෙන් ලෝකයා විඤ්ඤාණය ඒකඝන ඒකීය දෙයක් හැටියටයි සළකන්නේ. ආත්මය හැටියටයි සළකන්නෙ. අනිත් හැම එකක්ම අල්ලගන්න බැරි උනාම විඤ්ඤාණය අල්ල ගන්නව, ඇසට නොපෙනෙන දෙයක් නිසා. මේක තමයි ආත්මය කියල. එතකොට යම්කිසි කෙනෙක් කල්පනා කරනව නම්, හැම මොහොතකම අවදිව සිටිනව නම්, 'මේ සංසකාර නිසයි විඤ්ඤාණය ඇති වෙන්නෙ. මේ සංස්කාර හටගන්නවත් එක්කම විඤ්ඤාණය හටගන්න. ඒ - එක එකට අදාළ "තජ්ජං තජ්ජ" කියනව වගේ, ඒ එක් එක් කාරණය හා සම්බන්ධ "චක්ඛුංච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං" මේ චක්ඛු විඤ්ඤාණය හට ගන්නෙ ඇසත් රූපයත් නිසා. මේ සොත විඤ්ඤාණය හට ගන්නෙ මේ කණින් විතරක් නොවෙයි. ශබ්ද වලින් විතරක් නොවෙයි. වෙන අමුතුවෙන් දේකුත් නොවෙයි. කණත් ශබ්දයත් දෙක සම්බන්ධ වෙලයි, කියල අන්න ඒ විදියට අර සංස්කාර උඩයි මේ විඤ්ඤාණය තියෙන්නේ, කියල කල්පනා කරන කොට විඤ්ඤාණයේ ඒකඝන ස්වභාවය ගැන හැඟීම නැති වෙලා යනව. විඤ්ඤාණය මැකිල යන්න පටන් ගන්නව. "ඛයධම්මං වයධම්මං විරාගධම්මං" ඒ ගැන කළකිරීම ඇති වෙනව. "නිරොධධම්මං" යම්කිසි අවස්ථාවක සම්පූර්ණ නිරෝධය වෙන්නෙත් ඒ විදියටයි.

සංස්කාර උඩයි විඤ්ඤාණය තිබෙන්නේ. ඒ වගේම තමයි විඤ්ඤාණය උඩයි නාමරූපය තිබෙන්නේ. මේක නාම රූපයක් කියලා ලෝකයා හිතන්නේවත් නැහැ. අපි නාමරූපය ගැන කලිනුත් විග්‍රහ කරල තියෙනවා. නාම මාත්‍ර රූපයකුත් රූප ස්වරූපයකුත් ආදී වශයෙන් මේ දෙක එකකට එකක් සම්බන්ධයි. ඊ ළඟට ඒ දෙකම විඤ්ඤාණයෙ පිළිබිඹුවෙන එකක් පමණයි. මේක 'අන්තොජටා බහිජටා' තත්ත්වයක්. අර ඒ දණ්ඩ උඩ බල්ලගෙ උපමාවෙන් එහෙම අපි දැක්වුව, ඒ කියන්නේ කල්පනා කරනවා

නම් මේ නාම රූපය - මේ ලෝකයා සත්‍යය හැටියට මමායනය කරන නාම රූපය - මේක මේ විඤ්ඤාණයෙ පිළිබිඹුවක් පමණයි. විඤ්ඤාණයේ පිළිබිඹු වන දෙයක් පමණයි කියල හිතෙන කොට විඤ්ඤාණය අල්ල ගන්නෙත් නැහැ. තව ටිකක් එහාට අපි බලමු. සළායතනය, මේ සළායතනය නාම රූපය නිසයි කියන්නේ. නාම රූපයට සීමිත වූ දෙයක් මේ සළායතනය. නාමරූපය ඇති තාක් සළායතනය තියෙනව. නාමරූපය නැති වෙන කොට සළායතනය නැහැ, කියලා ඒ අවබෝධයේ සිත රඳව ගන්නව නම් - ඒ පටිච්ච සමුප්පාද ධර්මයේ සිත රඳවා ගන්නව නම් - අර පටිච්ච සමුප්පන්න ධර්මයන් ගෙවිල යන්න පටන් ගන්නවා. ඒ වගේම තමයි සළායතනය නිසයි ස්පර්ශයන් ඇති වෙන්නේ. සාමාන්‍යයෙන් ස්පර්ශයට ලෝකයා ගැති වෙනව. නමුත් ඒ ස්පර්ශය එන එන අවස්ථාවට "තජ්ජං තජ්ජං" අර නන්දකොවාද සූත්‍ර ආදී සූත්‍රවල ඉතාම වටිනා පාඨ තිබෙනව. "තජ්ජං තජ්ජං භජෙත පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති"[4] සූත්‍ර රාශියක් කවලම් වෙන නිසා අපි දිගින් දිගට විස්තර කරන්නේ නැහැ. මැදුම් සඟියෙ නන්දකොවාද සූත්‍රයෙ එහෙම සඳහන් වෙනව." මේ මේ ප්‍රත්‍යයන් නිසා මේ මේ වේදනාවල් ඇති වෙනව. එහෙම නැත්නම් මෙතන කියවෙනව ස්පර්ශය. සළායතනය නිසයි මේ ස්පර්ශය ඇති වෙන්නෙ කියලා කියන කොට අර ස්පර්ශය පිළිබඳ මෝහනය එයින් ඉවත් කර ගැනීමට උපකාර වෙනව. සළායතනය උඩ ගොඩ නැඟුනු දෙයක් ඒකට සීමා වූ දෙයක්. සළායතනය නැති වෙන කොට ඒකත් නැහැ. ඊ ළඟට ඒ වගේම තමයි වේදනාව. වේදනාව මේ ස්පර්ශය නිසයි කියල වේදනාවෙහි හේතුව කෙරෙහි හිත යොදන කොට ඒ ස්පර්ශය පිළිබඳවත් නොඇල්ම එනව. වේදනාව පිළිබඳවත් නොඇල්ම ඇති වෙනව. ඔන්න ඔය විදියෙ ධර්මතාවක් මෙතන තිබෙන්නේ. තව දුරටත් මේක දිගින් දිගට කියන්න ඇහැකි. නමුත් දැන් සෑහෙන පමණ කාරණය පැහැදිලියි කියල හිතනව. ඔය වගේ තමයි ජාති ජරා මරණ පිළිබඳ කාරණයත්, අවසාන වශයෙන් කියනව නම්. එහෙමත් නැත්නම් අපි තව ටිකක් විස්තර කරමු - ඕන නම් - වේදනා, ඊ ළඟට තණ්හාඋපාදාන. උපාදාන නිසයි මේ භවය පවතින්නේ කියල යම් කෙනෙක් කල්පනා කරනව නම් අර භවය දැඩිකොට ගන්නේ නැහැ. මේ පවන් අත්ත අල්ලගෙන සිටින නිසා තමයි. මම දේශකයෙක් හැටියට සාමාන්‍යයෙන් මේ දේශනාව නැහුනත් කෙනෙක් හිතාගන්නෙ. "උපාදාන පච්චයා භවො"මට මේ ධර්ම දේශනාව ලැබිල තියෙන්නේ මේක - මේ අමුතුවෙන් හිමිවුන දෙයක් නොවෙයි. බාහිර වශයෙන් බලනව නම් පවන් අත්ත අල්ලගෙන ඉන්නව. කෙනෙක් හිතාගන්නව මේක ඉදිරිපිට තියාගෙන ඉන්න කොට දේශනා කරනව

කියල. මගේ ධර්ම දේශනා භවය එතනයි. "උපාදාන පච්චයා භවො" මේ ලේසි තේරුමකින් ඒ කිව්වේ.

ඊ ළඟට "භව පච්චයා ජාති" - ඒ විදියේ යම්කිසි භවයක් පැවැත්මක් ඇතිකර ගත්ත නම්, අර විජ්ජා දැක්ම අවස්ථාවේ අර නරඹන්නන් අමුතු මැජික් ලෝකයකයි හිටියෙ. ඒ මැජික් ලෝකය ඇති උනේ ඒ මැජික් උපාදාන කරගත්ත නිසයි. ඊ ළඟට ඒ භවයෙන් එළියට ආවාම සමහර විට ටිකක් කණගාටුත් හිතෙනව දැන් මේ කදිම මැජික් දැක්ම ඉවර උනා නේද කියල. අන්න ඒ වගේ දෙයක් තමයි මේ භවය. කෙනෙක් හිතා ගන්නව අර කොට බිත්තියකින් මෙහා පැත්තෙ ඉඳගෙන ඉන්න කෙනෙකුට එහා පැත්ත පේන්නෙ නැතිව වගේ මේ එක් එක් භවය කියල අපි ගන්න උත්පත්තිය අපේ මව් පියන්ට සීමා වූ එක කෙළවරකුයි අපි මේ ජාති කියලා ගන්නේ, උත්පත්තිය කියල ගන්නෙ. ඊ ළඟට මේ ශරීරයේ කෙළවර තමයි අපි මරණය කියල ගන්නෙ. අතික් භවය කියල ගන්නේ. හරියට අර කොට බිත්තියකින් මෙහා ඉඳගත්තු වගේ තත්ත්වයක් තිබෙන්නෙ. එව සංස්කාර සන්තතියක් කියන අවබෝධය නැහැ. එතකොට මේ භවය මවාගත්තු එකක්. කෘත්‍රිම දෙයක් මේක. ඒ භවය උඩයි ජාති කියන සංකල්පය තියෙන්නේ. මේ හැම එකක්ම "ජාති" කියල "උපත" කියලා කියන්නෙ. සමහර විට සාප්පුවකින් ගන්නව ඉතාමත්ම පරණ වෙච්ච බඩුවක්. හොඳට සායම් ගාල තියෙන නිසා අපි හිතාගන්නව අලුත් දෙයක් කියලා. ගෙදර ගෙනියනව. ඊට පස්සෙන්දාම මේක ක්‍රියා විරහිත වෙනව. එක්කො බිඳිල යනව. මේ අලුත් පිටම ගත්තු බඩුව "ජාති". මක් නිසාද අරක ගත්තු නිසයි මට මේක උපන්නේ. මැණික උපන්න වගේ මට මේක උපන්නේ එදයි. මේක අලුත් පිටමයි තියෙන්නේ. ඒක නිසා මේකෙ බලාපොරොත්තු නැති විදියට ජරා මරණ සෝක පරිදේව මේ ඔක්කොම. මේ විදියට අපට ගන්න පුළුවන් අංග යුගල වශයෙන්. අරගෙන ඒ යුගල අතර ඇති මේ ධර්මතාව දැකීමයි පටිච්ච සමුප්පාදය දැකීම. අංග දොළහ කටපාඩම් කරගෙන අනුලෝම පටිලෝම වශයෙන් කීම නොවෙයි.

එතකොට මේ විදියට කල්පනා කරන කොට මෙතන මේ අනුලෝම ප්‍රතිලෝම කාරණයත් ඉතාමත් වැදගත් දෙයක්. එයින් පේනව මේව හටගන්න නිසාමයි නැතිවීමක් තියෙන්නෙ. "යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං" - යමක් හටගන්නා ස්වභාවය තිබෙනව නම් ඒකාන්තයෙන්ම නිරුද්ධ වෙන්නත් ඕන. ඒ වගේම මේ සමුදය පක්ෂයත් නිරෝධ පක්ෂයත්. ඉතින් අර රහතන් වහන්සේගේ වෙනස තියෙන්නේ සම්පූර්ණයෙන්ම මේක ආශ්‍රවයන්ට යටත් නොවන තත්ත්වයකින්ම ක්ෂීණාශ්‍රව වශයෙන් මේ නිරෝධය දුටුව. දැන් මෙතන අපට තව දුරටත් යන්න පුළුවන් පටිච්ච සමුප්පාදය

පිළිබඳ කාරණයට. අර අවිජ්ජාව මුලට දාල තියෙන්නේ මක් නිසාද? ඒක නිත්‍ය නිසාවත් ඒක අහේතුක නිසාවත් නොවෙයි. සසරින් මිදීමේ ගැඹුරුම ප්‍රශ්නය තිබෙන්නේ ආසව කියන වචනය තුළයි. ආශ්‍රවයනුත් සමහර විට හතරක් හැටියට දක්වනව. කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව කියල. නමුත් බොහෝ තැන්වල අර්හත්වය පිළිබඳව සඳහන් වන තැන් වල "කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති" කියල තුනක් හැටියට දක්වනව. මක් නිසාද අවිජ්ජා' කියන එකටම අල්ලන්න පුළුවන් දිට්ඨි කියන එකත්. ඒ නිසයි.

මේ ආශ්‍රව කියන වචනය අපට තේරුම් ගන්න පුළුවන්. ලෝකයේ ආශ්‍රව කියන වචනයට දෙන අර්ථයට බොහෝ දුරට සමානයි. සාංසාරික පුරුදු ප්‍රවාහය - මේවට පෙළඹීල යන ස්වභාවයක් තියෙනව. මේ ආශ්‍රව ධර්මවල, ගලාගෙන එන ස්වභාවයක් තියෙනව. සංසාරගත සත්ත්වයා තුළ කාමයන් මවාගන්න, භවයක් මවාගන්න ස්වභාවයක් තියෙනව. ඒක තමයි කාමාසව, කාමයන්ට ඇදීයන ස්වභාවය, භවයක් මවාගන්න ස්වභාවය. "ආලයා රාමා - ආලය රතා ආලය සමමුදිතා"[5] ආදී වශයෙන් බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. ඒ විදියට භවයක් මවා ගන්න ස්වභාවයක් තියෙනව.

ඒ වගේම අවිජ්ජාව කියන එක. ඒක සමහර විට තේරෙන්නෙ නැති වෙන්න පුළුවන්. මක් නිසාද? අවිජ්ජා කියල වෙනම අංගයක් හැටියටත් තියෙනව ඒකම ආශ්‍රව හැටියටත් තියෙනව. අවිජ්ජාවත් එක්තරා පුරුද්දක්. බොහෝ විට සංසාරගත සත්ත්වයා තුළ තිබෙනව අඳුරට ප්‍රිය කරන බවකුත් ආලෝකයට අප්‍රියකරන ස්වභාවයකුත්. ආලෝකයට ඇස් වසාගන්න ස්වභාවයක් ලෝකයා තුළ තිබෙනවා. පහසුවෙන් අමතක කරන ස්වභාවයක් ලෝකයා තුළ තිබෙනව. එහෙම අමතක කරල තමයි මේ භවයේ හැසිරෙන්නෙ අනන්ත කාලයක්. අන්න ඒක තමයි මේ අවිජ්ජාශ්‍රවය. ඒ ආශ්‍රවය කොයි තරම් බල සම්පන්නද කියතොත් මහා තීක්ෂණ ප්‍රාඥයින්ට පවා එක සැරේට බැහැ රහත් වෙන්න. ධර්මචක්‍රය හතර සැරයක් කරකැවෙන්න ඕන. සෝවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් කියල. ඒ ආශ්‍රව ගොඩ කැපීමේ අමාරු කම පෙන්වන්න තමයි සෝවාන් පුද්ගලය හත් සැරයක් පමණය, 'සත්තක්ඛත්තුපරම', සකදාගාමී පුද්ගලය ගැන එක් සැරයක් 'සකිදෙව' ආදී වශයෙන් ව්‍යවහාරයේ පවා තියෙන්නෙ. එතකොට ඒ ආශ්‍රවයන් කපා හැරීමේ මඟත් මේකමයි, පටිච්ච සමුප්පාද ධර්මයමයි. මේකම සමහර විට දක්වනව ප්‍රතිපදාව හැටියට. මක්නිසාද? ප්‍රතිපදාව කියන්නේ අර අංග දොළහ කටපාඩම් කිරීම නොවෙයි. අර පටිච්ච සමුප්පාද ධර්මයේ හිත පැවැත්වීමයි. "අසමිං සති ඉදං හොති ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. අසමිං

අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති" ඉතාමත්ම අමාරු වැඩක් ඒක. එහිම හිත රඳවා ගැනීම. ලිස්සල යනව. එක්කො එහා එක අල්ල ගන්නව. නැත්නම් මෙහා එක අල්ල ගන්නව. ද්වයතාවෙයි ලෝකයා බොහෝ කාලයක් ජීවත් වෙන්නෙ. මැදවත් නොරැඳී සිටින තත්ත්වයකුයි රහතන් වහන්සේ ලබා ගන්නේ. ඒක තමයි බාහිය සූත්‍රයේ "නෙව ඉධ න හුරං න උභයමන්තරෙ" කියල ප්‍රකාශ කරල තිබෙන්නෙ. "යතො ත්වං බාහිය න තෙන, තතො ත්වං බාහිය න තත්ථ, යතො ත්වං බාහිය න තත්ථ, තතො ත්වං බාහිය නෙව ඉධ න හුරං න උභයමන්තරෙ, එසෙවන්තො දුක්ඛස්ස" අර එකක් පිළිබඳවවත් මනඃකල්පිත කරන්නෙ නැත්නම් ඒ එක සංකල්පයක් තුළවත් ලැග ගන්නේ නැහැ. ඒකට ඇතුල් වෙන්නෙ නැහැ. ඒකට ඇතුල් වෙන්නෙ නැත්නම් ඔබ මෙතනත් නොවෙයි. එතැනත් නොවෙයි. ඒ දෙක අතරත් නොවෙයි. එයම දුකේ කෙළවරයි.

එතකොට පටිච්ච සමුප්පාද ධර්මය හරියාකාර අවබෝධ කරගත්තු පුද්ගලය අවිද්‍යාවෙ බැඳෙන්නෙත් නැහැ. සංස්කාරවල බැඳෙන්නෙත් නැහැ. ඒ දෙක අතරෙ සම්බන්ධතාව දැකීම නිසා. සංස්කාරවල බැඳෙන්නෙත් නැහැ. විඤ්ඤාණයේ බැඳෙන්නෙත් නැහැ. ඒ දෙක අතර සම්බන්ධතාව දැකීම නිසා. සමුදය වය වශයෙන් ඔන්න ඔය විදියෙ තත්ත්වයකුයි තියෙන්නෙ. මෙන්න මේ දර්ශනය පිහිටකරගෙන තමයි තථාගතයන් වහන්සේ 'තාදී ගුණය' දියුණු කර ගත්තෙ. ඉතාමත්ම උත්තරීතර ප්‍රණීත වූ තාදී බවක්. නොදත් කම නිසාවත්, වෙන අර සංජය බෙල්ලට්ඨි පුත්තගෙ වගේ ඇඟ බේරාගැනීමේ ප්‍රතිපත්තියක් නිසාවත් කරන මධ්‍යස්ථ දෙයක් නොවෙයි. බුදු රජාණන් වහන්සේ මෙය සත්‍යය කියා හෝ බොරුව කියා හෝ ප්‍රකාශ නොකරන්නේ මක්නිසාද? දකිනව අවිද්‍යාව ඇති කල්හි මේව සත්‍යයි. අවිද්‍යාව නැති උනාම තමයි, නිරෝධය දුටු පුද්ගලයට තමයි, සළායතනය බොරු දෙයක් කියල, විඤ්ඤාණය මායාවක් හැටියට වැටහෙන්නෙ. අන්න ඒ අවබෝධයේ පිහිටි පුද්ගලය අරක ඒකාන්ත සත්‍යය හැටියට ගන්නෙ නැහැ. ඒ වගේම ඒව සත්‍යයි කියල කියන පුද්ගලයින් පිළිබඳවත් දැඩිව ගන්නෙ නැහැ. මක්නිසාද? වැඩිහිටියෙක් කුඩා දරුවෙකු අසන, ප්‍රශ්න වලට පිළිතුරු දෙන්න වගේ එක්තරා විදියක සහනශීලීත්වයක් බුදු රජාණන් වහන්සේ මේ සූත්‍රයෙන් ප්‍රකාශ කරනව.

සත්‍ය තත්ත්වය තමා දුටුව. දැන් මෙතන ඊළඟට අපට තේරුම් ගන්න පුළුවනි, අපි කලිනුත් සඳහන් කළා "පච්චෙක සච්චෙසු පුථූ නිවිට්ඨා" සාමාන්‍ය දෘෂ්ටි ගතිකයින් ලෝකයේ තම තමන්ටම පමණක් සත්‍යවූ දෘෂ්ටිවල කොටු වෙලා සිටිනව. "පච්චෙක සච්චෙසු" කියන වචනය ආශ්‍රයෙනුයි අපි අර "සය සංවුත" කියන වචනය තේරුවෙ. "සයසංවුතෙසු"

කියල ගැඹුරු වචනයක් තිබුන. අපි ඒක තේරුවෙ තම තමන්ගේ, ස්වකීය වූ දෘෂ්ටි වලට කොටු වෙල සිටිනව. ඒ කොටුවෙල සිටින්නේ මක් නිසාද?. ඒක අර චූලවියුහ සූත්‍රයෙන් උපුටා දැක්වූ ගාථාවෙන් ප්‍රකාශ උනා. "න හෙව සච්චානි බහූනි නා නා - අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ" තම තමන් ගත්තු සංඥාවල් අනුවයි ඒවා සත්‍ය හැටියට ගණන් ගත්තෙ. ඒ තමන්ගේ ස්පර්ශය අනුවයි. ශාලාවෙ ඉඳගෙන බැලුව නිසා යම් යම් දේවල් පෙනුනෙ නැහැ. විජ්ජා කාරය පෙන්වන නියම ආකාරය පෙනුනෙ නැහැ. ඒ අවිද්‍යාව නිසයි අර සංස්කාර ගොඩ නැඟුනේ. ඔන්න ඔය වගේ දෙයක්. එතකොට අර 'පච්චෙක සච්ච' කියන එක - මේකට තව හොඳ උපමාවක් තියෙනවා. අපි දිගටම මේව ගැන නොකිව්වත් උදාන පාළියේ ජච්චන්ධ වග්ගයේ බුදු රජාණන් වහන්සේ ගෙනහැර දක්වල තියෙනව අන්ධයින් සහ ඇතා පිළිබඳ උපමා කථාව. ඒක ඉතාම ප්‍රකට කථාන්තරයක්. ඒ කියන්නේ එක රජ කෙනෙක් අන්ධයින් පිරිසක් ගෙන්වල ඇතෙකුගේ එක එක අඟ පසඟ - හිස කණ පා වල්ග ආදිය අල්ලන්න සළස්සල ඊට පස්සෙ ඇතා කොයි විදියෙ සතෙක් ද කියල ඇහුවහම අර ජාත්‍යන්ධයින් තම තමන් අල්ල ගත්තු අංගය අනුව ප්‍රකාශ කළා. "ඇතා මෙහෙම සතෙක් මෝල් ගහක් වගෙයි එහෙම නැත්නම් වංගෙඩියක් වගෙයි කියල ඔයි විදියට ප්‍රකාශ කළා. ඔන්න ඔය විදියට තමයි ලෝකයාගේ අර දෘෂ්ටියත්. "සබ්බං තං එසස පච්චයා". සමහර විට අභිඥා ලාභීන් ගැන පවා බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කළා, බ්‍රහ්මජාල සූත්‍රයේ. තම තමන් ලැබූ නාමරූපයෙ යම් යම් ස්පර්ශයන් නිසා, ඇති කර ගත්තු සංඥාවල් නිසයි ඒ ඒ දෘෂ්ටීන් අල්ල ගත්තෙ. "ඉදමෙව සච්චං මොඝමඤ්ඤං" මෙයම සත්‍යයයි අනික් සියල්ල බොරුය කියල ඒ විදියට තදින් දෘෂ්ටි ගන්න පෙළඹුනා. බුදු රජාණන් වහන්සේ එහෙම දැඩි දෘෂ්ටියක් නොගෙන නිරෝධය දුටුව නිසා - මේ හැම එකක්ම නිරුද්ධ වෙනව සිතත් නිරුද්ධ වෙනව ධර්‍මයනුත් නිරුද්ධ වෙනව, සිතට අරමුණු වෙන ඒ අරමුණු පවා නිරුද්ධ වෙනව කියන එබඳු තත්ත්වයක් දැක්ක නිසා - විඤ්ඤාණ නිරෝධය ප්‍රත්‍යක්ෂ කළා. අන්න ඒ නිසා තමයි බුදු රජාණන් වහන්සේ සහනශීලීව මධ්‍යස්ථව සිටියෙ. - ඇත්ත වශයෙන් නිශ්ශබ්දතාවයි, එතැනට පිළිතුර, බොහෝ අවස්ථාවල.

ඔන්න ඔය විදියෙ ඉතාමත් ගැඹුරු කාරණයක් මෙතනින් ප්‍රකාශ වෙන්නෙ. මෙන්න මේක තව දුරටත් අපට තේරුම් ගන්න පුළුවන් - බුදු රජාණන් වහන්සේට මේ මැජික් දර්ශනය පිළිබඳව ඇති වුන තත්ත්වය. අර මැජික් දර්ශනය පිළිබඳව නුවණැස ඇති පුද්ගලයාට ඇතිවුන තත්ත්වය වගේම බුදු රජාණන් වහන්සේටත් ඒ විදියෙ අවස්ථාවල් පැන නැඟිල

තියෙනව. ඊට හොඳ සාධකයක් අපට හමුවෙනව දීඝ නිකායෙ, මහා පරිනිබ්බාන සූත්‍රයේ. බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑමට පාවා නුවර සිට කුසිනාරාවට වැඩම කරන අතර මඟදී ටිකක් විවේක ගන්න ගසක් මුල වැඩ සිටිය. ඒ අවස්ථාවේ කුසිනාරාවෙ ඉඳල පාවා නුවරට එන පුක්කුස නමැති මල්ලපුත්‍රයෙක් - ඒ තැනැත්ත ආළාර කාලාමයන්ගේ ශ්‍රාවකයෙක්. ආළාර කාලාම තාපසය ආකිඤ්චඤ්ඤායතනය ලැබූ තාපසයෙක්. බුදු රජාණන් වහන්සේගේත් ආචාර්යවරයෙක් හැටියට සඳහන් වෙනව - එහෙම එන අතරෙ බුදු රජාණන් වහන්සේ වැඩ ඉන්නව දකල වැඳල "සන්තෙන බො පන භන්තෙ පබ්බජිතා විහාරෙන විහරන්ති" කියල එක්තරා විදියක ප්‍රීති වාක්‍යයක් වගේ ප්‍රකාශ කළා. 'පැවිද්දන් කොයි තරම් ශාන්ත විහරණයකින් වාසය කරනවද' කියල බුදු රජාණන් වහන්සේ පිළිබඳව පැසසුම් වශයෙන් කිව්ව නමුත් ඊ ළඟට ප්‍රශංසාව කළේ තමන්ගේ ගුරුවරයා ගැනයි. ඊ ළඟට ප්‍රවෘත්තියක් ප්‍රකාශ කළා ආළාර කාලාමයන් ගැන. "ආළාර කාලාම මගේ ශාස්තෘවරය. මේ ආළාර කාලාම එක් අවස්ථාවක දිග ගමනක් යන අතරෙ, ගමන් මඟින් වෙන් වෙල ගසක් යට ඉඳ ගත්ත දිවාවිහරණය සඳහා. ඒ අවස්ථාවෙ පන්සියයක් ගැල් ඒ ස්ථානය පසුකරගෙන ගියා. ඒ ගැල් තික්ම ගියාට පස්සෙ ඒ ගැල් පසුපසින් ආපු යම් කිසි පුද්ගලයෙක් ඇවිල්ල මේ ආළාර කාලාමයන්ගෙන් ඇහුව මේ ගැල් පන්සියයක් ගියා දැක්කද කියල. "නෑ මං දැක්කේ නැහැ" "ශබ්දය ඇහුනද?" "නෑ මට ඇහුනෙ නැහැ" නිදාගෙනද හිටියෙ? "නැහැ මං නිදාගෙනත් නොවෙයි හිටියෙ" "සිහිය ඇතිවද හිටියෙ?" "ඔව් මං සිහිය ඇතිව හිටියෙ" කියල ප්‍රකාශ කළාම අර පුද්ගලය ලොකු සතුටක් ප්‍රසාදයක් ඇතිකරගෙන ආළාර කාලාමයන් ගැන මේක ආශ්චර්යයක් අද්භූත දෙයක්. කොයිතරම් ශාන්ත විහරණයකින් පැවිද්දන් ජීවත් වෙනවද කියල, මේ විදියෙ ගැල් ගමන් කරන අතර ඒ ගැල්වලින් විසිවුන මඩ පවා ඔබ තුමාගේ සංඝාටියෙ තැවරුනාට මොකද ඔබ තුමා ඒ කිසිවක් දැක්කෙ නැහැ, කියල ප්‍රකාශ කරල ගියයි කියල ඔය විදියට අර පුක්කුස මල්ල පුත්‍රය ආළාරකාලාම පිළිබඳ ප්‍රශංසාත්මක විස්තරයක් කළා. බුදු රජාණන් වහන්සේ ඊ ළඟට අහනව "පුක්කුස වැඩිය අමාරු ඔය ගැල් පන්සියයක් යන අවස්ථාවෙ ඒක අහන්නෙවත් දකින්නෙවත් නැතිව ඉන්න එකද එහෙම නැත්නම් මහ වැස්සක් වහිමින් ගල ගලා යද්දී, ගොරවමින් හෙන පුපුරන අවස්ථාවේදී, ඒව කිසිවක් නොඇසෙන තත්ත්වයක සිටීමද? එතකොට මේ පුක්කුස ප්‍රකාශ කරනව අර දෙවනුව කියාපු කාරණය තමයි අමාරු කියල. අන්න එතකොට බුදු රජාණන් වහන්සේ තමන් පිළිබඳවම අතීත ප්‍රවෘත්තියක් ප්‍රකාශ කරනව. පුක්කුස මම එක් අවස්ථාවක ආතුමාවෙ භුසාගාරයේ වැඩ විසුව - භුසාගාරය කියන්නේ දහයිය ගේ -

ඒ අවස්ථාවෙ මහා වැස්සක් වැහැල ගලාගෙන යද්දි විදුලි කොටමින් හෙණ පුපුරද්දි ඒ භුසාගාරයේම හිටපු ගොවියන් දෙදෙනකුත් ගවයින් හතර දෙනෙකුත් හෙන පහරින් මැරුණ. එතෙන්ට විශාල ජනකායක් රැස්වුනා. ඒ අවස්ථාවෙ මම ඒ භුසාගාරයෙන් නික්මිල එලිමහනෙ භුසාගාරයේ දොරකඩ සක්මන් කරමින් සිටිය. එතකොට මේ මහා ජනකායෙන් කෙනෙක් මා ළඟට ආවාම මම ඇසුව ඒ පුද්ගලයගෙන් "මක් නිසාද මහ සෙනඟක් රැස්වෙලා ඉන්නෙ." "දන් ස්වාමීනි මහ වැස්සක් වැහැල ගලාගෙන යද්දි විදුලි කොටමින් හෙන පුපුරද්දි හෙන පහරින් ගොවි සොහොයුරන් දෙදෙනකුත් ගවයින් හතර දෙනෙකුත් මියගියා. ඒකයි මේ මහ සෙනඟ රැස්වෙලා ඉන්නෙ. 'ඇයි ස්වාමීනි ඔබ වහන්සේ කොහෙද හිටියෙ?' "මම මෙතනමයි හිටියෙ" ඔබ වහන්සේ සැතපිලාද හිටියෙ?" "නැහැ මම සැතපිල නොවෙයි හිටියෙ", ඔබ වහන්සේට සද්දෙ ඇහුනෙ නැද්ද?" "නැහැ මට සද්දෙ ඇහුනෙ නැහැ. මම දුටුවෙත් නැහැ" මම සැතපිලා හිටියෙත් නැහැ" ඊ ළඟට අහනව ඔබ වහන්සේ සිහි ඇතිවද හිටියෙ" - "සඤ්ඤී" - සිහි ඇතිවම තමයි හිටියෙ "එතකොට මේ පුදගලය විස්මය ප්‍රකාශ කරනව. "සො තවං හනෙත සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සනෙත දෙවෙ ගලගලායනෙත. විජ්ජුතාසු නිච්ඡරනතීසු අසනියා ඵලනතියා නෙව අද්දස න පන සද්දං අසොසාසී "එහෙනම් ස්වාමීනි ඔබ වහන්සේ සිහි ඇතිවම අවදිව සිටගෙනත් මේ මහ වැස්සක් වැහැල ගලාගෙන යද්දී විදුලි කොටමින් හෙණ පුපුරද්දී ඒ කිසිවක් ඔබ වහන්සේ දක්කෙත් නැහැ. ඇසුවෙත් නැහැ?" "එසේය ඇවැත්නි කියල පිළිතුරු දුන්න. අන්න ඒ අවස්ථාවෙ - බුදු රජාණන් වහන්සේයි මේ අතීත ප්‍රවෘත්තිය ප්‍රකාශ කරන්නේ. - පුක්කුස, අන්න ඒ අවස්ථාවෙ අර පුද්ගලය මා ගැන ලොකු ප්‍රසාදයක් ඇති කර ගත්තා."අච්ඡරියං වත හො, අබ්භුතං වත හො සනෙතන වත හො පබ්බජිතා විහාරෙන විහරනති" කොයි තරම් ශාන්ත විහරණයකින්ද පැවිද්දන් වාසය කරන්නේ කියල කියනොත් මෙන්න මේ විදියට මහ වැස්සක් වැහැල ගලාගෙන යද්දි මෙබඳු සිද්ධියක් වෙලාත් ඔබ වහන්සේ දක්කෙ නැත කියල.

මෙතන මේ සඳහන් වෙන ප්‍රවෘත්තිය ගැන ඇතැම් කෙනෙක් කල්පනා කරනව බුදු රජාණන් වහන්සේ මේ අවස්ථාවේ නිරෝධ සමාපත්තියෙන්ය වැඩසිටියෙ කියල. නමුත් නිරෝධ සමාපත්තියේ නම් අර "සඤ්ඤී සමානො ජාගරො" කියන වචන සඳහන් වෙන්නෙ නැහැ. අර පුද්ගලය පුදුමය ප්‍රකාශ කරන්නෙ - "සො තවං හනෙත සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සනෙත දෙවෙ ගල ගලායනෙත" ආදී වශයෙන් ප්‍රකාශ කරන්නේ - සංඥාවත් ඇතිව අවදිව සිටියදීම මහ වැස්සක් වහින අතරෙ මේ විදියෙ

සිද්ධියක් ඔබ වහන්සේ දුටුවෙත් නැහැ ඇසුවෙත් නැහැ කියල ඒ විදියටයි විස්මය ප්‍රකාශ කළේ. එතකොට "සඤ්ඤී සමානො ජාගරෝ" කියන වචන යොදන්නෙ නැහැ නිරෝධ සමාපත්තිය නම්. ඒ වගේම මේක ආකිඤ්චඤ්ඤායතන තත්ත්වයත් නොවෙයි. ආළාර කාලාම සහ ගැල් පන්සීය පිළිබඳ ප්‍රවෘත්තියෙනුත් පෙනෙනව ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියත් නොවෙයි. මෙතන ඇත්ත වශයෙන්ම මේ ප්‍රකාශ කෙරෙන්නෙ අපි අර කලින් සඳහන් කළ අරහත්ත ඵල සමාධියයි. අරහත්ත ඵල සමාධියෙන් බුදුරජාණන් වහන්සේ වැඩ සිටිය අවස්ථාවක සළායතන නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගෙන - ලෝක නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගෙන - ලෝකයෙන් ඉවත් වෙල වැඩ සිටිය අවස්ථාවකයි මේ සිදුවීම සිදු උනේ. ඒකයි බුදුරජාණන් වහන්සේට ශබ්දයක් ඇහුනෙත් නැත්තෙ පෙනුනෙත් නැත්තෙ. එතකොට මෙන්න මේ කාරණය අනුව අපට නැවතත් මතක් කරගන්න පුළුවන් අර කලහ විවාද සූත්‍රයෙන් අපි කලින් අවස්ථාවක උපුටා දැක්වූ ගාථාවක් - මහ ප්‍රහේලිකා විදියේ ගාථාවක්. අටුවාවලත් නොයෙකුත් විදියට තේරුම් කරන එකක්.

"න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී - නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී
එවං සමෙතස්ස විභොති රූපං - සඤ්ඤානිදානා හි පපඤ්චසංඛා"

"න සඤ්ඤ සඤ්ඤී" සාමාන්‍ය සංඥාවෙන් සංඥාව ඇතිවත් නොවෙයි. "න විසඤ්ඤ සඤ්ඤී" විසංඥ වෙලා, සිහි නැතිව, හිටියත් නොවෙයි "නොපි අසඤ්ඤී" සංඥාව සම්පූර්ණයෙන් නැති අසංඥ තත්ත්වයකුත් නොවෙයි. "න විභූත සඤ්ඤී" සංඥාව කෙළවර කළ නිරෝධ සමාපත්තිය වැනි දෙයකුත් නොවෙයි. "එවං සමෙතස්ස විභොති රූපං" අන්න එබඳු තත්ත්වයට පත් වූ පුද්ගලයටයි රූපය විභූත වෙන්නේ. රූපය නැති වෙන්නෙ. රූප ප්‍රඥප්තිය නැති වෙන්නෙ. "සඤ්ඤා නිදානාහි පපඤ්ච සංඛා"සංඥාව නිදාන කොට ගෙනයි පපංච සංඛාවන් ඇතිවෙන්නෙ. මේ වචනය අපි කලින් විස්තර කරලත් තියෙනව. මේ මැජික් දර්ශනය ආශ්‍රයෙන් මේ පපඤ්ච සංඛා කියන එක තේරුම් ගන්නව නම්, පපඤ්ච සංඛාවන් තමයි අර මැජික් දර්ශනය පිළිබඳව අර ශාලාවෙ හිටිය පුද්ගලයා ඇති කර ගත්තෙ. තණ්හා, මාන දිට්ඨි වශයෙන් අර "ආ .... ඕ.... හූ හඬ නගමින් ගෙල දික් කරගෙන කටඇරගෙන ඇස් ඇරගෙන බලාගෙන ඇතිකර ගත්තේ ඔක්කොම පපඤ්ච සංඛා. ඉතාම ලක්ෂණ මැජික් දර්ශනයක්, පුදුම දේවල්. ඔන්න ඔය පපඤ්ච සංඛාවල් සංඥාව නිදාන කොට ගෙනයි ඇතිවෙන්නෙ. ඒ සංඥාවෙන් සම්පූර්ණයෙන්ම මිදුන තත්ත්වයකුයි අර සළායතන නිරෝධ අවස්ථාවෙ, අරහත්ත ඵල සමාපත්ති අවස්ථාවෙ, තිබෙන්නෙ. කලිනුත් දක්වල තියෙනව අරහත්ත ඵල සමාධිය ගැන සඳහන්

කළ සූත්‍රවල "නෙව පඨවිසඤ්ඤී පඨවිසඤ්ඤී න ආපස්මිං ආපොසඤ්ඤී න තෙජස්මිං තෙජොසඤ්ඤී න වායස්මිං වායොසඤ්ඤී න ඉධලොකසඤ්ඤී න පරලොකසඤ්ඤී", ඔය විදියට, දිගට විස්තර කරගෙන ගිහිල්ල, පොළොවෙහි පොළෝ සංඥාවකුත් නැහැ, ජලයෙහි ජල සංඥාවකුත් නැහැ. ගින්නෙහි ගිනි සංඥාවකුත් නැහැ, වායුවෙහි වායු සංඥාවකුත් නැහැ. ඔය විදියට කිසිවක් පිළිබඳව සංඥාවක් නැහැ. නමුත් "සඤ්ඤීච පන අස්ස" සංඥාවකුත් තිබෙනව. මොකක් ද සංඥාව. ඒකම තමයි මේ දේශනා මුලදී පාවිච්චි කළ සංඥාව. ඒකත් අර කලින් දේශනාවලදී අරහත්ත ඵලය ගැන විස්තර කරන අවස්ථාවලදී කලිනුත් කීප විටක් දක්වල තියෙන "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං".

## අධෝලිපි

1. ම.නි. III බු.ජ. 12 198 පිට
2. සං.නි. II බුජ 14-120 පිට
3. සං.නි. II බු.ජ. 14-42 පිට
4. ම.නි. III බු.ජ. 12-568 පිට
5. ම.නි. I බු.ජ. 10-408 පිට

# 27 වන
# දේශනය

# 27 වන දේශනය

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය"

අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන්වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ විසිහත් වන දේශනයයි මේ.

තථාගතයන් වහන්සේගේ තාදී ගුණය කාළකාරාම සූත්‍රයේ විශේෂයෙන් අවධාරණය කර ඇත්තේ මක් නිසාද යන්න තේරුම් ගැනීමට උපමා නිදර්ශන කීපයක් ගියවර දේශනයේදී අපි උපකාර කර ගත්ත. විඤ්ඤාණය මායාවකට උපමා කරන බුද්ධ දේශනාව ආශ්‍රයෙන් කාලානුරූපව, වේදිකාවේ කොනක සැඟවී සිටගෙන මැජික් දර්ශනයක ඇතුළත රහස් දකීමට අපි උත්සාහයක් දැරුව. 'තථතා', 'ඉදප්පච්චයතා' යන පද වලින් හැඳින්වෙන පටිච්ච සමුප්පාද ධර්මයේ අනුලෝම පටිලෝම දෘෂ්ටිකෝණ දෙක එකම මැජික් දර්ශනය දෙයාකාරයකින් දැකීමක් වැනි බව අපට ඒ උපමා කථාවෙන් පැහැදිලි උනා. ඒ දෙයාකාරයකින් දකීම කියල කියන්නේ ශාලාවෙ ඉඳගෙන බලන ප්‍රේක්ෂකයගෙ - අවිද්‍යාවෙන් බලන ප්‍රේක්ෂකයගෙ දෘෂ්ටි කෝණයත්, අර වේදිකාවෙ සැඟවී බලා සිටි නුවණැස ඇති පුද්ගලයාගේ - අවිද්‍යාව නැති කරගත් පුද්ගලයගෙ - පරීක්ෂක දෘෂ්ටි කෝණයත්. ප්‍රේක්ෂක දෘෂ්ටි කෝණයයි, පරීක්ෂක දෘෂ්ටි කෝණයයි කියල අපට පහසුවෙන් යොදා ගන්න පුළුවනි. මෙන්න මේ දෘෂ්ටි කෝණ දෙක අතර, මේ දෘෂ්ටිකෝණ දෙක සමහන් කිරීම පිළිබඳව පැන නඟින්න පුළුවන් ගැටලුව තමයි අර කාළකාරාම සූත්‍රයේ මතුපිටින් පෙනෙන ප්‍රහේළිකා ස්වරූපයට හේතුව. කාළකාරාම සූත්‍රයේ බැලූ බැල්මට පෙනෙන ප්‍රහේළිකා ස්වරූපයට හේතුව අර කියාපු දෘෂ්ටි කෝණ දෙක සමහන් කිරීම පිළිබඳ ප්‍රශ්නයයි. එහෙම නමුත් තථාගතයන් වහන්සේ ලෝකෝත්තර මට්ටමකින් මේ කියාපු දෘෂ්ටි කෝණ දෙක සමහන් කරගෙන විමුක්ති සුවය වින්ද බවට උදාන පාළියේ බෝධි වග්ගයේ මුල් සූත්‍ර තුනම සාධක වෙනව. ඒ සූත්‍ර වලින් කියැවෙන්නෙ

බුදු පියාණන් වහන්සේ සම්බෝධිය ලැබීමෙන් පසුව පළමුවන සතිය බෝමැඩ එකම පර්යංකයෙන් වැඩ ඉඳල ඒ හත් දින අවසාන වන රාත්‍රියේ ප්‍රථම යාමය තුළ පටිච්ච සමුප්පාදය අනුලෝම වශයෙන් මෙනෙහි කළ බවත්, මධ්‍යම යාමය තුළ පටිලෝම වශයෙන් මෙනෙහි කළ බවත්, පශ්චිම යාමය තුළ අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කළ බවත්. ඒ සූත්‍රවල සඳහන් වෙන මේ අනුලෝම පටිලෝම දෙක එකවර මෙනෙහි කිරීම හරියට අර අප කලින් සඳහන් කළ ප්‍රේක්ෂක පරීක්ෂක දෘෂ්ටි කෝණ දෙක සමහන් කිරීමක් වගෙයි. දන් මැජික් දර්ශනයක මැජික් පෙන්වන හැටි දකීම පෙන්වන ලද මැජික් පිළිබඳව නිබ්බිදාවක් ඇතිවීමට, ඒ මැජික් නිරෝධ වීමට, ඒ පිළිබඳව චිත්ත විමුක්තියක් ඇතිකර ගැනීමට උපකාර වෙනව. මැජික් පෙන්වන හැටි දකීමෙන් පෙන්වන ලද මැජික් පිළිබඳව කළකිරෙනව. ඒ වගේම සළායතනය හටගන්නා ආකාරය දකීම, සළායතන සමුදය දකීම, ඒ සළායතන පිළිබඳ නිබ්බිදාව විරාගය, නිරෝධය ආදී වශයෙන් ලෝකෝත්තර වශයෙන් චිත්ත විමුක්තියට ඇති මාර්ගයයි. ඒ බව හෙළිවන ඉතාම වටිනා ගාථා දෙකක් අංගුත්තර නිකායෙ ඡක්කනිපාතයේ සෝණ සූත්‍රයේ එනව :

"නෙක්ඛම්මං අධිමුත්තස්ස - පවිවේකං ච චේතසො
අබ්‍යාපජ්ඣාධිමුත්තස්ස - උපාදානක්ඛයස්සච
තණ්හක්ඛයාධිමුත්තස්ස - අසම්මොහඤ්ච චේතසො
දිස්වා ආයතනුප්පාදං - සම්මා චිත්තං විමුච්චති"[1]

මේ රහතන් වහන්සේ පිළිබඳවයි කියැවෙන්නේ

"නෛෂ්ක්‍රම්‍යය පිළිබඳ අදහසට නැමුනු, එහිම යෙදුනු, ඒ පැත්තටම නැඹුරුවුනු, ඒ වගේම "පවිවේකංච චේතසො" චිත්ත විවේකයට නැඹුරු වූ, ව්‍යාපාද රහිත තත්ත්වයට ඒ වගේම උපාදානක්ෂය කිරීමට නැඹුරුවූ, තණ්හාව ක්ෂය කිරීමට ඒ වගේම සිතේ නුමුලා බවට කියන මෙන්න මේ කාරණා හයට නැඹුරු වූ ඒ රහත් භික්ෂුවගේ සිත "දිස්වා ආයතනුප්පාදං" ආයතනයන්ගේ හටගැනීම දක මැනවින් විමුක්ත වෙයි. මැනවින් මිදෙයි.

එතකොට අපට මේ කාරණා අනුව හිතාගන්න පුළුවනි. මැජික් දර්ශනයකින් ආස්වාදය ලබන නරඹන්නකුගේ මැජික් විඥානය සකස් වෙලා තිබෙන නාම රූපයේ යථා ස්වභාවය අවබෝධ කර ගැනීම නිසා මැජික් විඥානය නිරුද්ධ වෙනව. මැජික් විඥානය සංසිඳෙනව. වෙනත් විදියකින් කියනවානම් මැජික් දර්ශනය නොපෙන්වන 'අනිදස්සන විඥානයක්' බවට පරිවර්තනය වෙනව. අර වේදිකාවෙ කොනක සැඟවී සිටගෙන

මැජික් දර්ශනය නැරඹූ පුද්ගලයට ඇතිවුනු මානසික පරිවර්තනය ඒකයි. මෙන්න මේක ආශ්‍රයෙන් අපට තේරුම් ගන්න පුළුවනි රහතන්වහන්සේගේ විඥාන නිරෝධය. ඒ වගේම රහතන් වහන්සේ භුක්ති විඳින අනිදස්සන විඤ්ඤාණ තත්ත්වය. මේ කාරණය ප්‍රකාශ වෙනව සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයෙනුත්. මේ සූත්‍රයේ නාමයෙන්ම පේනව මෙතන අර දෙවැදෑරුම් තත්ත්වය ගැනයි සූත්‍රයෙ කියැවෙන්නෙ. "ද්වයතා - අනුපස්සනා" දෙවැදෑරුම් අනුපස්සනාවක්. මේ සූත්‍රය පුරාම දිවෙන රටාවක් තමයි සමුදය - නිරෝධ වශයෙන් එක් එක් ධර්මය ඉදිරිපත් කරගෙන අනුපස්සනා දෙක පෙන්නුම් කිරීම. බුදුරජාණන් වහන්සේට තිබුන ගැටළුවේ පැති දෙක වගේ. ඉතින් අපට ඕන කාරණය මෙතන විඤ්ඤාණ නිරෝධය පිළිබඳවයි. ඒ පිළිබඳව කියැවෙන්නෙ.

"යං කිඤ්චි දුක්ඛං සම්භොති - සබ්බං විඤ්ඤාණ පච්චයා,
විඤ්ඤාණස්ස නිරොධෙන - නත්ථි දුක්ඛස්ස සම්භවො
එතමාදීනවං ඤත්වා - දුක්ඛං විඤ්ඤාණ පච්චයා
විඤ්ඤාණූපසමා භික්ඛු - නිච්ඡාතො පරිනිබ්බුතො"

"යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං විඤ්ඤාණ පච්චයාං" යම් කිසි දුකක් හටගනී ද ඒ සියල්ලම විඤ්ඤාණය ප්‍රත්‍යය කරගෙනය. "විඤ්ඤාණස්ස නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවො" විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් දුක් හටගැනීමක් නැත. "එතං ආදීනවං ඤත්වා දුක්ඛං විඤ්ඤාණ පච්චයා" විඤ්ඤාණ ප්‍රත්‍යය කරගෙන ඇතිවෙන දුක පිළිබඳ මේ ආදීනවය දැනගෙන, "විඤ්ඤාණූපසමා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො" විඤ්ඤාණය සංසිඳීමෙන් ඒ රහත් භික්ෂුව තෘෂ්ණා කුසගින්න නිවාගෙන පිරිනිවෙයි. මෙයින් අපට අර මැජික් දර්ශනයත් විඤ්ඤාණ මායාවත් අතර සංසන්දනය තවදුරටත් පැහැදිලි කරගන්න පුළුවන් වෙනව. මැජික් දර්ශනයක වගේම විඥාන මායාවෙත් මායාකාරී ස්වරූපයට මූලික හේතුව රූප සංඥාව - රූප නිසා රූප සංඥාව නිසා - ඇතිවෙන, නැත්නම් ඇතිකර ගන්නා, තණ්හා මාන දිට්ඨි පපඤ්ච සංඛා සමූහයයි. තණ්හා මාන දිට්ඨි ප්‍රපංචයන්ගෙන් ඇති කර ගන්නා ගිණීම් හැඳිනීම් ආදිය නිසයි මේ මුළාව වෙන්නෙ. ඒක නිසා මේ රූප සංඥාව නැති කර ගැනීමේ විශේෂ උත්සාහයකුත් තිබෙනව නිර්වාණය බලාපොරොත්තු වන භික්ෂුවගේ. මේ රූප සංඥාව නැතිවෙන තත්ත්වයක් දක ගැනීමේ කැමැත්ත තමයි අපි කලින් දවසෙ කලහ විවාද සූත්‍රයෙන් උපුටා දක්වූ ගාථාවෙන් කියැවෙන්නේ. "න සඤ්ඤසඤ්ඤී" ආදී ගාථාවක් කලින් දවසේ අපි උපුටා දක්වූවා. ඊට කලිනුත් අපට ඒක

දක්වන්න සිද්ධ වුනා. ඒ ගාථාවෙන් පිළිතුරු දෙන්න උත්සාහ කරන්නේ ඊට කලින් ගාථාවකින් අසන ලද රූපය නැතිවෙන තත්ත්වයක් පිළිබඳ ප්‍රශ්නයටයි. කලින් ගාථාවක සඳහන් වෙන "කථං සමෙතස්ස විභොති රූපං" කෙසේ සමන්විත වූවහුට රූපය නැතිවෙයිද? කියන ප්‍රශ්නයට පිළිතුරු දීමට තමයි අර "න සඤ්ඤ සඤ්ඤී" ආදී ගාථාව ඉදිරිපත් කරල තියෙන්නේ. ඒ ගාථාව අපි නැවතත් මතක් කර ගත්තොත්,

"න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී
නොපි අසඤ්ඤී න විභූත සඤ්ඤී
එවං සමෙතස්ස විභොති රූපං
සඤ්ඤානිදානාහි පපඤ්ච සංඛා"

සාමාන්‍ය සංඥාවෙන් සංඥී තත්ත්වයකුත් නොවෙයි. විසංඥ සංඥාවකුත් නොවෙයි. අසංඥ තත්ත්වයකුත් නොවෙයි. සංඥාව සම්පූර්ණයෙන්ම නැතිවුන තත්ත්වයකුත් නොවෙයි. "එවං සමෙතස්ස විභොති රූපං" මෙන්න මෙබඳු තත්ත්වයක් ඇති තැනැත්තාට රූපය විභූත වෙයි. නැති වෙයි. ඊ ළඟට අවසාන පදයෙන් කියැවෙනව වැදගත් කාරණයක්." "සඤ්ඤා නිදානා හි පපඤ්චසංඛා" - ප්‍රපංච සංඛාවෝ, ප්‍රපංච නිසා ඇති කරගන්නා ගිණීම් හැඳිනීම් ආදිය, ප්‍රඥප්ති ආදිය සංඥාව නිදාන කොට ඇත්තාහ. සංඥාව නිසයි. මේ සියල්ල වෙන්නෙ කියන එකයි. මේ රූපය ගැන විශේෂයෙන්ම උනන්දු වෙන්න තවත් හේතුවක් තමයි - රූපය ඇතිවිට තමයි මේ ස්පර්ශය. ගැටීම කියන සංඥාව ඇතිවෙන්නෙ. ඒකත් අර කලහ විවාද සූත්‍රයේම මුල් ගාථාවක අසනව ප්‍රශ්නය හැටියට. "කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා" කියල. කුමක් නැතිවුන කල්හිද ස්පර්ශයන් ස්පර්ශ නොකරන්නෙ. ඒකට දෙන පිළිතුර "රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා" රූපය නැතිවුන කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකරත්. මේ කාරණයටම අදාල වටිනා පාඨයක් අපට හමුවෙනව දීඝ නිකායේ සංගීති සූත්‍රයේ. "සනිදස්සන සප්පටිඝංරූපං"[1] කියල රූපයේ ලක්ෂණ දෙකක් වශයෙන් දක්වනව. සනිදස්සන, සප්පටිඝ - රූපයේ තිබෙනව යමක් පෙන්නුම් කරන ස්වභාවයක්. සනිදස්සන කියල කියන්නේ ඒකයි. ඒ වගේම සප්පටිඝ ගැටුමක් ලබාදෙන ස්වභාවය. මෙන්න මේ කාරණ දෙකම අපි මේ දේශනා මාලාවේ මුල් අවස්ථාවේදී උපුටා දැක්වූ ජටා සූත්‍රයේ එන ගාථාවකත් කියැවෙනව.

"යත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති,
පටිඝං රූප සඤ්ඤා ච - එත්ථ සා ඡිජ්ජතෙ ජටා[2]

මේ ජටා සූත්‍රයෙන් කියැවෙන්නෙ මේ මහා සංසාරෙ 'අන්තො ජටා බහි ජටා' අවුල විසඳෙන තැන. එතකොට මෙතන උත්තර දෙන්නෙ "යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති පටිඝං රූපසඤ්ඤා ච" යම් තැනෙක නාමයත් රූපයත් පටිඝයත් රූප සංඥාවත් -පටිඝ- කියල කියන්නේ ගැටුම, යම් තැනක "අසෙසං උපරුජ්ඣති" සම්පූර්ණයෙන්ම උපරෝධනය වෙයිද, වළක්වාලනු ලැබෙයිද" "එත්ථ සා ඡිජ්ජතෙ ජටා" ඒ අවුල එතැනායි සිඳලනු ලබන්නෙ, සිඳලනු ලබන්නේ එතෙන්දියි කියන එකයි. මෙතනත් කියැවෙනව "පටිඝං රූපසඤ්ඤා" කියල. එතකොට මෙන්න මෙයින් අපට 'රූපසංඥා' කියන වචනයත් ඉතාම වැදගත් එකක් බව පේනව. ඒ වගේම මේ සංඥා කියන එක, රූපයන් ගෙන එන සංඥාව. මේ සංඥාව නිදානය කරගෙන තමයි නොයෙකුත් ගිණීම් හැඳිනීම් ඇති වෙන්නෙ. මේව අපට ක්‍රමානුකූලව හිතා ගන්න පුළුවන් දැන් මේ සංඥාව කියන පදයේ ඇති වැදගත් කම. ඒ කියන්නේ "සංඥාව" කියන එක අපි කලිනුත් අවස්ථාවක සඳහන් කළා, හරියට සළකුණක් වගේ. එහෙම නැත්නම් සංකේතයක්. කැලයක් මැදින් යන පිරිසක් ආපසු එන පාර සොයාගන්න ගස්වල පොරොවකින් යම්කිසි සළකුණක් කපන්න වගේ, එක්තරා සංඥාවල් ඇතිකර ගැනීමේ සිරිතක් තියෙනවා. ඒ සංඥාව කියන වචනයත් එක්කම අර නිත්‍ය සංඥාව එනව ඉබේටම. එතකොට අන්න ඒ සංඥාව නිසා තමයි අර පපඤ්චසංඛා ඇති වෙන්නෙ. ඒකම තමයි අර මධු පිණ්ඩික සූත්‍රයේ" පපඤ්චසඤ්ඤා සංඛා" කියන එක පදයකින් හඳුන්වල තියෙන්නේ. සංඥාව නිදාන කොටගෙන පපඤ්ච සංඛාවල් ඇති වෙන නිසා ඒක එක පදයක් කරල දක්වනව. "පපඤ්චසඤ්ඤා සංඛා" පපඤ්චසඤ්ඤාවෙන් ඇති කර ගන්නා සංඛා, හැඳින්වීම්, ගිණීම්. ඊ ළඟට මෙතන මේ සංඥා කියන වචනය ගැන සළකා බලන කොට මේක කොයි තරම් වැදගත්ද කියතොත් අර සුත්ත නිපාතයේ ගුහට්ඨක සූත්‍රයේ කියැවෙනව" සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං"[3] කියල. සංඥාව පිරිසිඳ දැන ගෙන, සංඥාවෙ යථා ස්වභාවය දැනගත්තාම, මුළු මහත් චතුරෝඝයෙන්ම, මහා සංසාර කෙලෙස් ඕඝයෙන්ම, එතෙර වෙන්න පුළුවන්. ඒ සංඥාව ගැඹුරින් අවබෝධ කරගත්තොත් විමුක්තිය එතනායි. දැන් එතකොට මේ සංඥාව කියන එක ගැන අපි තවදුරටත් විමසල බැලුවොත්, සංඥාව කියල කියන්නේ - නිමිත්ත සංකේත කියන පද, ගන්න පුළුවන් මේක හැඳින්වීමට. දැන් යම්කිසි නිමිත්තකින් නිමිතිවන කිසිවක් නැතිනම් ඒ නිමිත්ත අනුව යම්කිසි ගිණීමක් හැඳින්වීමක් ප්‍රඥප්තියක් පණවන්න බැහැ. එහෙම නැතිනම් සංකේතයකින් සංකේතවත්වන කිසිවක් නැත්නම් ඒකෙ සංකේත භාවයකුත් නැහැ. මේක ටිකක් කල්පනා කරල තේරුම් ගත යුතු දෙයක්. ඒ කියන්නේ යම් කිසි නිමිත්තකට අපි නිමිත්තක් කියල කියන්නේ ඒකෙන් නිමිති වෙන

දෙයක් තිබෙනවනම් පමණයි. එහෙම නැතිනම් ඒක නිමිත්තක් වෙන්නෙ නැහැ. ඒ වගේම යම් කිසි සංකේතයකට අපි සංකේතයක් කියල කියන්නෙ ඒ සංකේතයෙන් සංකේතවත් වන කිසිවක් ඇත්නම් පමණයි. මේක එක්තරා ධර්මතාවක්. මේක තේරුම් ගැනීමට අපි උපකාර කරගනිමු, මජ්ඣිම නිකායෙ මහා වෙදල්ල සූත්‍රය. ඒ සූත්‍රයේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේත් මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේත් අතර කෙරෙන ඒ ධර්ම සංවාදයේදී, ධර්ම සාකච්ඡාවේදී, සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව" රාගො ඛො ආවුසො කිඤ්චනො, දොසො කිඤ්චනො, මොහො කිඤ්චනො තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා" ඇවැත්නි රාගය කිසිවකි, ද්වේෂය කිසිවකි, මෝහය කිසිවකි, ඒවා ක්ෂීණාශ්‍රව භික්ෂුව තුළ ප්‍රහීනය. මුල් සිඳින ලද්දේය. උගුලා තබන ලද තල්ගසක් මෙන් කරන ලද්දේය. "අනභාවකතා" නොපවත්නා බවට පත් කරන ලද්දේය. "ආයතිං අනුප්පාද ධම්මා" නැවත නූපදනා බවට පත් කරන ලද්දේය.

එතකොට රාගයත් 'කිසිවක්' ද්වේෂයත් 'කිසිවක්' මෝහයත් 'කිසිවක්'. මේ විදියට 'කිසිවක්' තිබෙනව නම් තමයි යම්කිසි දෙයක් නිමිත්තක් වන්නෙ. සංකේතයක් වන්නේ. ඒ එක්කම ඒ සූත්‍රයේ ඊට යටින් සඳහන් වෙනව තවත් පාඨයක් "රාගො ඛො ආවුසො නිමිත්තකරණො, දොසො නිමිත්තකරණො, මොහො නිමිත්තකරණො". එයින් තවත් මේ කාරණය පැහැදිලි වෙනව. ඇවැත්නි රාගය නිමිති ඇති කරවන දෙයකි. 'නිමිත්තකරණො' කියල කියන්නෙ සංකේතවත් කරවන දෙයක් කියන එකයි. රාගය නිමිති ඇතිකරවන දෙයකි. දෙවිෂය නිමිති ඇතිකරවන දෙයකි. මෝහය නිමිති ඇතිකරවන දෙයකි. දැන් එතකොට අපට මේ අනුව හිතාගන්න පුළුවනි මේ රාග දෝස මෝහ කියල ඒ යම්කිසි දෙයක් - නිමිති වන කිසිවක් තිබෙන තාක් තමයි අර නිමිති, නිමිති ස්වභාවයක් උඩුලන්නෙ. වෙන විදියකින් කියනව නම් තථාගතයන් වහන්සේ විඤ්ඤාණ මායාවෙ හරයක් නැතිබව, සාරයක් නැතිබව වදාළේ තමන් වහන්සේ තුළ නිමිති වලින්, සංකේත වලින්, නිමිති වන, සංකේතවත් වන 'කිසිවක්' නැති නිසයි. මොනවද මේ 'කිසිවක්' කියල කියන්නේ, රාග දෙව්ෂ මෝහ. ඒක නිසා තමයි රහතන් වහන්සේලා පිළිබඳව "අකිඤ්චන" පදය යොදන්නේ. 'අකිඤ්චන' කියල කියන්නේ මේ ලෝකෙ තියෙන අනෙකුත් ඔය ගිහියන්ගේ බඩු භාණ්ඩාදිය කිසිවක් නැති නිසාම නොවෙයි. අකිඤ්චන කියල කියන්නෙ ගැඹුරු අර්ථයෙන් ගත්තොත්, අර කියාපු රාග දෙව්ෂ මෝහ කියන කිඤ්චනයක්, කිසිවක්, නැහැ. එතකොට මෙතනින් ගන්න පුළුවන් අපට තථාගතයන් වහන්සේට විඤ්ඤාණ මායාවේ හරයක් 'දෙයක්, නැති උනේ

මක් නිසාද, ඒ සංඥා නිමිති වලින් නිමිතිවත් වන - සංඥා කියල කියන්නේ නිමිත්ත - එතකොට සංඥා වලින් නිමිතිවත් වන කිසිවක් උන් වහන්සේ තුළ නැති නිසයි. දැන් අර මැජික් දර්ශනය ගැන කල්පනා කරල බලනව නම්, අර වේදිකාවේ කොනක ඉඳල මැජික් දර්ශනය නැරඹූ නුවණැස ඇති පුද්ගලයාට මැජික් දර්ශනයේ දෙයක් නැති බව වැටහුනේ, හරයක් නැති බව වැටහුනේ, මක් නිසාද, ඒ තැනැත්තාට මැජික් දර්ශනය පිළිබඳව - අපි සීමිත අර්ථයකින් කියනව නම් - රාග දෝස මෝහ නැති උනා වගෙයි. වෙනත් විදියකින් කියනව නම් අර මැජික් දර්ශනයෙ ඇතුළත දුටුවට පස්සෙ ඒ තැනැත්තාට හාසයක් - එහෙම නැතිනම් සිනහවක් ඇතිවෙන විදියෙ ඇල්මක් නැති වුනා. ඇලුම් කරන දෙයක් මැජික් දර්ශනයේ දකින කොට සිනහ යනව. අර මැජික් පෙන්වන තැනැත්තගේ ඒ හොරකම් දැක්කට පස්සෙ හිනහ වෙන්න තැනක් නැහැ. ඒකෙ හාසයට ඉඩක් නැහැ. ඒ නිසා හාසයට තුඩුදෙන ඇල්මක් මොහු තුළ නැහැ. ත්‍රාසයට තුඩු දෙන ගැටුමකුත් නැහැ. අර ශාලාවේ ඉඳල බලන පුද්ගලයන් බය වෙනව. නමුත් මේ තැනැත්තට කිසිම භයක් නැහැ. ඇතුළත හොර පේන නිසා. ඒ වගේම කුතුහලයක් නැහැ. මෝහය නැති වීම නිසා. මේවායේ කෙරෙන වැඩ ටික පේන නිසා, නූල් සූත්තර පේන නිසා, මුළාවීමකුත් නැහැ. එතකොට සීමිත අර්ථයකින් අපට හිතා ගන්න පුළුවන් හාසයක් ත්‍රාසයක් මුළාවීමක් නැත්තේ අර මැජික් දර්ශනයෙ ඇතුළත පිළිබඳ අවබෝධය නිසයි. අවිද්‍යාව නැති උනා තාවකාලිකව. අන්න ඒ ධර්මතාව අනුව අපට හිතාගන්න පුළුවනි මේ නිමිති සංකේත ආදිය සංකේතවත් වන්නෙ මේ අප තුළම, සත්ත්වයා තුළම, තිබෙන ලෝභ දෝස මෝහ කියන මෙන්න මේ ධර්ම නිසා බව. ඒ ලෝභ දෝස මෝහ ඇති තාක් අර සංඥා නිසා රාග දෝස මෝහ කුලප්පු වීමක් තියෙනව. සංඥාවල ඇත්ත වශයෙන්ම නිමිති ස්වභාවයක් තියෙනව. ඒව සංකේත බවට පත් වෙනව. රහතන් වහන්සේ පිළිබඳව ඒ සූත්‍ර දේශනා වල සඳහන් වෙනව විශේෂයෙන්ම අට්ඨක නිපාතයේ මාගන්දිය සූත්‍රයේ අවසාන ගාථාව ඉතාම වැදගත් ගාථාවක්. ඒ ගාථාවෙ කියැවෙනව රහතන් වහන්සේ තුළ එක්තරා සංඥා විරක්ත බවකුත් ප්‍රඥා විමුක්ත බවකුත් තියෙනව කියල. සංඥා පිළිබඳව විරාගයකුත් ප්‍රඥාවෙන් ඇතිවුනු විමුක්ත බවකුත් තියෙනව කියල. ඒක කියවෙන්නෙ මෙහෙමයි.

"සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා -
පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා,
සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං -
තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ"

"සඤ්ඤා විරත්තස්ස න සන්ති ගන්ථා" සංඥාව පිළිබඳව විරක්ත වූ, රාගයක් ඇල්මක් නැති තැනැත්තාට, ගැට නැත. "පඤ්ඤා විමුත්තස්ස න සන්ති මොහා" ප්‍රඥාවෙන් විමුක්ත වූ පුද්ගලයාට මෝහයෙන් මුළාවීමක් නැත. සංඥාවත් දෘෂ්ටියත් යම් කෙනෙක් අල්ලා ගත්තාහු නම් ඔවුහු ලෝකයේ ගැටෙමින් හැසිරෙත්. එතකොට මේ සංඥා විරක්ත ප්‍රඥා විමුක්ත තත්ත්වය සමහර සූත්‍ර වල සඳහන් වෙනව "අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤා විමුත්තිං" කියන පද වලින්. රහතන් වහන්සේ පිළිබඳව සමහර විට යොදල තිබෙනව "අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා" ආදී වශයෙන්. අනාශ්‍රව වූ චෙතො විමුත්තියකුත් පඤ්ඤා විමුත්තියකුත්, ඒ චෙතො විමුත්ති කියන අදහසයි අර සඤ්ඤාවිරත්ත කියන එකෙන් ප්‍රකාශ වෙන්නෙ. පඤ්ඤා විමුත්තියයි "පඤ්ඤා විමුත්තස්ස" කියල සඳහන් වෙන්නෙ. එතකොට මේ අනුව අපට හිතා ගන්න පුළුවනි අර සංඥාව නිසා - සංඥාව කියන්නෙ මිරිඟුවක් - ඒ මිරිඟුව ඔස්සෙ දිවයන මෝහයක් රහතන් වහන්සේලාට නැහැ. ඒ වගේම ඒ සංඥා නිමිතිවත් වත්නෙ නැති නිසා, 'නිමිති' නිමිතිවත් වත්නෙ නැති නිසා, රහතන් වහන්සේලා අර විඤ්ඤාණ මායාවෙ තිබෙන ගැට වලට අහු වෙන්නෙ නැහැ. "සඤ්ඤා විරත්තස්ස න සන්ති ගන්ථා" මැජික් දර්ශන පෙන්වන තැනැත්තාගෙ, මැජික් කාරයාගෙ, ගැට වලට අහුවෙන්නෙ නැහැ. මෙන්න මේ නිසා තමයි ඒ රහතන් වහන්සේල "අනෙජො - ඨිතො" ආදී වචනවලින් දක්වල තියෙන්නෙ. නොසෙල්වෙන අචල තත්ත්වයක් රහතන් වහන්සේල තුළ තිබෙනව. අර මිරිඟුව ඔස්සෙ දුව යන්නෙ නැති තත්ත්වයක්. මජ්ඣිම නිකායෙ ආනෙඤ්ජ සප්පාය සූත්‍රය ආරම්භ කරන්නෙ බුදු පියාණන් වහන්සේ, "අනිච්චා භික්ඛවෙ කාමා තුච්ඡා මුසා මොස ධම්මා මායාකතමෙතං භික්ඛවෙ බාලලාපනං යෙ ච දිට්ඨධම්මිකා කාමා යෙ ච සම්පරායිකා කාමා යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා යා ච සම්පරායිකා කාමසඤ්ඤා උභයමෙතං මාරධෙය්‍යං මාරස්සෙසවිසයො මාරස්සෙස නිවාපො මාරස්සෙස ගොචරො"[4]

මෙයින් කියැවෙන්නෙ - අර මැජික් දර්ශනය ගැන කියාපු අදහස් වලට බොහෝ දුරට සැසඳෙන විදියෙ කියමනක් මෙතනින් කියවෙන්නෙ. "අනිච්චා භික්ඛවෙ කාමා" "මහණෙනි මේ කාමයෝ අනිත්‍යය"."තුච්ඡා" හිස්ය. "මුසා" බොරුය. "මොසධම්මා" මුළා කරවන ස්වරූපයෙන් යුක්තය. "මායාකතමෙතං භික්ඛවෙ" මායා කාරයකු, මැජික් කාරයකු විසින් කරන ලද දෙයක් බඳුය."බාලලාපනං" අර ශාලාවෙ සිටින මෝඩයින් ලවා නන්දොඩවවන විදියෙ දේවල්ය. ඊ ළඟට ඒව මොනවද කියන එක තව විස්තර වශයෙනුයි කියන්නෙ. "යෙ ච දිට්ඨධම්මිකා කාමා යෙ ච

සම්පරායිකා කාමා" මේ ජීවිතය පිළිබඳව යම් කාමයෝ වෙත්ද ඒවාත් පරලොව පිළිබඳව කාම සංඥාවනුත් මේ කියාපු දෙකම "උභයමෙතං මාරධෙය්‍යං" මාරයාගේ රාජධානියයි. "මාරස්සෙස විසයො" මාරයාගේ වශයෙහි පවත්නා ප්‍රදේශයයි. "මාරස්සෙස නිවාපො" මාරයාගේ ඇමයි. "මාරස්සෙස ගොචරො" මාරයාගේ ගොදුරු බිමයි. ඔය ආදී වශයෙන් බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කළේ අන්න අර සංඥා නිමිතිවත් නොවන සංකේත, සංකේතවත් නොවන තත්ත්වයක්, මානසික තත්ත්වයක්, කෙනෙකුට ලබාගත හැකි නිසයි. අන්න ඒ කාරණය එතකොට මෙයින් පැහැදිලි වෙනව. විඥානය පිළිබඳ මායාවත් මේ මැජික් දර්ශනයත් අතර සංසන්දනයෙ එක්තරා ගැඹුරක් තිබෙනව. මේ නිමිති නිමිතිවත් වන ආකාරය. මෙන්න මේ අනුව අපට හිතාගන්න පුළුවනි. සඤ්ඤාවිරත්ත වීමට, සංඥාව පිළිබඳ විරාගයක් ඇතිකර ගැනීමට, ඒ සංඥාව අවබෝධකර ගත යුතුයි, කියල "සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං" සංඥාව[6] පිළිබඳව පිරිසිඳ දැනගත්තොත් ඒ අවස්ථාවේදී අර කියාපු මුළාවල් කෙනෙකුට ඇතිවෙන්නෙ නැහැ.

රහතන් වහන්සේ පිළිබඳව "අනිමිත්ත අප්පණිහිත, සුඤ්ඤත" කියල විමොක්ඛ තුනක් ගැන කියැවෙනව. නිමිත්තකින් යම්කිසි දෙයක් නිමිතිවීම ගැන අපි සඳහන් කළා. එහෙම නිමිති ගැනීමක් නැති තැනක, යම්කිසි කෙනෙක් එහෙම නිමිති ගන්නෙ නැත්නම්, ඒ තැනැත්තා තුළ ප්‍රණිධියක් ඇතිවෙන්නෙ නැහැ. ප්‍රණිධි කියල කියන්න යම්කිසි දෙයකට යොමුවීමක් - බලාපොරොත්තු වීමක්. ඊ ළඟට යම්කිසි දෙයක් පිළිබඳව යොමුවීමක්, බලාපොරොත්තුවීමක් නැතිනම් ඒ පිළිබඳව පැවැත්මක සාරයකුත් නැහැ. එතන අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියන විමොක්ඛ තුනේ එක්තරා ක්‍රමානුකූලත්වයක් තියෙනව. අනිමිත්ත කියල කියන්නෙ අපි මෙතෙක් විස්තර කළ ආකාරයට නිමිති නොගන්නා තත්ත්වයයි. අර රාග දොස මෝහ නැති සන්තානයේ ලෝකයේ තිබෙන නිමිති නිමිතිවත් වන්නෙ නැහැ. නිමිති ස්වභාවයට පත්වෙන්නෙ නැහැ. ඉතින් අනිමිත්තයි. එහෙම නිමිති ගැනීමක් නැති තැනක ප්‍රණිධියක් නැහැ. ආශාවක්, බලාපොරොත්තුවක්, යොමුවීමක් - යමක් දෙසට යොමු වීමක්, නැහැ. - හරියට අර මැජික් දර්ශනයේ පෙන්වන දේවල් පිළිබඳව කලකිරීම ඇතිවුනාට පස්සෙ ඒ මැජික් දර්ශනය බලන්න හිතෙන්නෙ නැහැ. ඒ පැත්තට යොමුවීමක් නැහැ. ප්‍රණිධියක් නැහැ. යොමු වීමක් නැති වූ විට පැවැත්මකුත් නැහැ. දිගටම බලාගෙන ගියොත් තමයි මැජික් දර්ශනය අර්ථවත් වන්නෙ. එහෙම නැත්නම් සිනමා දර්ශනයක් අර්ථවත් වන්නෙ, එහෙම නැත්නම් මැජික් ලෝකයේ උපදින්නෙ ඒ තැනැත්තා. මැජික් ලෝකය සකස් වෙන්නෙ පැවැත්මක් පිළිබඳ සාරයක් තියෙනවනම් පමණයි. මේක ගැඹුරින් කල්පනා

කර ගත්තොත් එහෙම පිටින්ම විඥානය පිළිබඳ මායාවෙ ඇතුල් පැත්ත පෙනෙනව මේකෙන්. නිමිති ගැනීමක් නැති තැන ප්‍රණිධියක් යොමු වීමක් බලාපොරොත්තුවක් නැහැ. බලාපොරොත්තුවක් යොමු වීමක් නැති තැන පැවැත්මක් පිළිබඳ සාරයක් නැහැ. ඔන්න ඕක නිසා තමයි අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියන මේ පද තුන රහතන් වහන්සේ පිළිබඳව යෙදිල තියෙන්නෙ. ඒ පද තුනම වෙනත් ආකාරයකින් යෙදිල තියෙනව අපි කලින් අවස්ථාවක විග්‍රහ කළ නිබ්බාන පටිසංයුක්ත සූත්‍රයක. "අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං" කියල. අප්පතිට්ඨං කියල කියන්නෙ ප්‍රතිෂ්ඨාවක් නැති. ප්‍රතිෂ්ඨාව ප්‍රණිධිය නිසා ඇති වෙන්නක්. ඒ කියන්නෙ දුක්ඛානුපස්සනාව නිසා ප්‍රණිධියක් නැති වෙනව. එතකොට එතන අප්පතිට්ඨ තත්ත්වයක්. ප්‍රතිෂ්ඨාවක් නැහැ. අප්පවත්තං කියල කියන්නෙ අර අනත්තානුපස්සනාව නිසා පැවැත්මක් පිළිබඳ සාරයක් නැති බව වැටහීම. හරයක් කියල කියන්නෙ දීර්ඝ කාලයක් පවතින දෙයක්. ගහක් අඳුනගන්න අරටුව තියෙනව කියල කියන්නෙ කාලයක් පවතින දෙයක්. අනික් දේවල් නැති වෙල යන්න පුළුවන් කොළ එහෙම, අරටුව තියෙනව. ඒ විදියට පැවැත්මක් පිළිබඳව හැඟීමක් නැහැ, එතකොට. අනාරම්මණං අරමුණක් නොගන්නා බව. අනිමිත්ත තත්ත්වයයි - අනිච්චානුපස්සනාවෙන්. මෙන්න මේ කාරණාව අපට තවත් පැහැදිලි වෙනව මේ කියාපු උපමාව ආශ්‍රයෙන්. අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියන පද, අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං ආදී පද, මේ හැම එකක්ම වඩාත් අර්ථවත් වෙනව මේ උපමාව ආශ්‍රයෙන්. මේ කියාපු සඤ්ඤා විරත්ත පඤ්ඤා විමුත්ත ස්වභාවය නිසා රහතන් වහන්සේගේ දෘෂ්ටිකෝණය එහෙම පිටින්ම වෙනස්, ලෝකයේ දෘෂ්ටි කෝණයට වඩා. ලෝකයේ ඇත්ත හැටියට පෙනෙන දේ රහතන් වහන්සේට බොරුයි. ඒ තරම් මහ පුදුම විශාල පරතරයක් ඇතිවෙනව, මේක නිසා. ඒ කාරණය තමයි සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේම එක තැනක සඳහන් වෙන්නේ අනුපස්සනා දෙකක් වශයෙන්" යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ඉදං සච්චන්ති උපනිජ්ඣායිතං ඉදමරියානං එතං මුසාති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අයං එකානුපස්සනා යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය ඉදං මුසාති උපනිජ්ඣායිතං තදමරියානං එතං සච්චන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අයං දුතියානුපස්සනා" මෙයින් කියැවෙන්නෙ "මහණෙනි, දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයා විසින්, මහණ බමුණන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාව විසින්, යමක් මෙය සත්‍යයයි කල්පනා කරන ලද්දේද එයම ආර්‍යයන් වහන්සේලා විසින් මෙය මුළාවකැයි මනා ප්‍රඥාවෙන් දක්නා ලද්දේය. ඒ එක අනුපස්සනාවක්.

අනික් අනුපස්සනාව මොකක්ද, "මහණෙනි, යමක් දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයා විසින්, මහණ බමුණන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාව විසින්, මෙය මුසාවකැයි කල්පනා කරන ලද්දේද එයම ආර්‍යයන් වහන්සේලා විසින් මෙය සත්‍යයැයි යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දක්නා ලද්දේය."

කොයි තරම් විශාල වෙනසක් ද, පරතරයක් ද, කියල මෙයින් හිතාගන්න පුළුවනි. ඒ කාරණය ඊ ළඟට ගාථාවලිනුත් කියැවෙනව. කලිනුත් සමහර අවස්ථාවලදී අපි උද්ධෘත වශයෙන් දැක්වූ ගාථා -

"අනත්තනි අත්තමානිං - පස්ස ලොකං සදෙවකං
නිවිට්ඨං නාමරූපස්මිං - ඉදං සච්චන්ති මඤ්ඤති
යෙන යෙන හි මඤ්ඤන්ති - තතො තං හොති අඤ්ඤථා
තං හි තස්ස මුසා හොති - මොසධම්මං හි ඉත්තරං
අමොසධම්මං නිබ්බානං - තදරියා සච්චතො විදූ
තෙ වෙ සච්චාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා"[5]

"අනත්තනි අත්තමානිං පස්ස ලොකං සදෙවකං" අනාත්ම වූ දෙයක ආත්මයක් දක්නා දෙවියන් සහිත ලෝකයා දෙස බලව. "නිවිට්ඨං නාම රූපස්මිං" නාම රූපය තුළට වැදගෙන, රිංගා ගෙන "ඉදං සච්චන්ති මඤ්ඤති" මෙය සත්‍යයයි හඟී. "යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා" යම් යම් දෙයක් පිළිබඳව මඤ්ඤනා කරත්ද, හඟිත්ද, ඒ මඤ්ඤනා කිරීම නිසාම එය අන්‍යාකාරයකට පරිවර්තනය වෙයි. යමක් 'දෙයක්' හැටියට ගත්තොත් ඒ 'දෙය' විපරිණාම ධර්මයට යටත් වෙනව. ඒක වෙනස් වෙන්න පටන් ගන්නව. 'දෙයක්' හැටියට ගත්තෙ නැත්නම් වෙනස් වීමක් පිළිබඳ ප්‍රශ්නයක් පැන නඟින්නෙම නැහැ. එතකොට යමක් 'දෙයක්' උන හැටියෙ ඒක වෙනස් වෙන්න පටන් ගන්නව. ඒකත් එක්කම අර පුද්ගලයත් වෙනස් වෙනව. විපරිණාමයත් එක්කම ඊ ළඟට ඉතින් ශෝක වැළපීම් ආදියත් එනව. එයම එහි මුළාව වෙයි. දෙයක් පිළිබඳ මුළා ස්වභාවය මොකක්ද? අන්න අර මඤ්ඤනාව නිසා වෙනස්වෙන්නට පටන් ගැනීම. සුළු කාලයක් පවතින මුළා කරවන සුළු දෙයකි එය. එහෙම නැත්නම්, මක්නිසාද යත්: එය සුළු කාලයක් පවතින මුළා කරන දෙයක් හෙයිනි. ඔන්න ඊ ළඟට කියවෙනවා නිවන පිළිබඳව. "අමොසධම්මං නිබ්බානං - තදරියා සච්චතො විදූ" නිවන මුළා නොකරවන සුළු ස්වභාවයක් ඇති දෙයකි. "තදරියා සච්චතො විදූ" ආර්‍යයන් වහන්සේලා එය සත්‍ය වශයෙන් දැන ගත්හ. "තෙ වෙ සච්චාභිසමයා" ඔවුහු මේ සත්‍යය අවබෝධ කර ගැනීමෙන් "නිච්ඡාතා පරිනිබ්බුතා" තෘෂ්ණා කුස ගින්න නිවාගෙන පිරිනිවියාහු වෙත්.

එතකොට මෙතෙක් ප්‍රකාශ කළ අදහස් තව දුරටත් සිතේ තැන්පත් කර ගැනීමට අපි තවත් නිදර්ශනයක් ගනිමු. මේවා, මේ සියල්ලම, හකුළා දක්වන නිදර්ශනයක්. යාලුවන් දෙදෙනෙක් ලෑලි කැබැල්ලක සායම් දෙවර්ගයකින් මොකක්දෝ අඳිනවා. කිට්ටු වෙලා බැලුවොත් පේන්නෙ දාම්පෙතක් අඳිනවා. කොටු අඳිනවා. දෙන්න එක්ක හවුල් වෙලා දාම්පෙතක් ඇන්ද. ඊ ළඟට කිසි වටිනාකමක් නැති කෑට කැබිලිති එකතු කරගෙන ඒවයෙන් අර වගේ සායම් දෙපාටක් ගාලා සකස් කර ගන්නවා ඉත්තන්ට. දැන් එතකොට දාම් පෙතත් හරි, ඉත්තනුත් සූදානම්. දැන් කොච්චර යාලුවන් උනත්, හවුල් වෙලා මේ වැඩේ කළත්, මේ දාම් පෙතෙන්, ඉත්තන්ගෙන් වැඩ ගන්න නම්, පිල් දෙකක් හැටියට බෙදෙන්න ඕන. අවයතාව. දැන් ඉතින් දෙන්න අර ඉත්තන් බෙදා ගත්ත. දැන් ක්‍රීඩාව ආරම්භ කරනවා. දෙපිලක් - අවයතාව - අපි නිතර සඳහන් කළ අවයතාව මෙතෙන්දී මතු වෙනවා. යම්කිසි දෙයක් ක්‍රියාත්මකවීමට දෙකක් අවශ්‍ය වීම. ඒ එක්කම මේ දෙදෙනාගේ සිත්වල ජය - පරාජය කියල තවත් අවයතාවයක සේයාවක් ඇති වෙනවා. ජයයි පරාජයයි කියන බලාපොරොත්තුවක්. නමුත් දෙන්න තවම විනෝදයටයි, කාලය ගෙවා දැමීමටයි, නිකම් විනෝදයටයි, මේ දාම් ක්‍රීඩාව කරගෙන යන්නෙ. සෙල්ලමට නමුත් තරඟයක්. තරඟයක් නමුත් සෙල්ලමක්. ඉතින් ඔය විදියට මේ දාම් ක්‍රීඩාව කරගෙන යන අතරෙ, මෙතෙන්ට එනවා එක්තරා පරිත්‍යාගශීලී විනෝදකාමියෙක්. එයා කල්පනා කරනවා මේ දාම් ක්‍රීඩාව වඩාත් උද්‍යෝගිමත් කිරීමට නම්, මේකට තෑග්ගක් දෙන්න පොරොන්දු වෙන්න ඕන කියල. මේ දාම් ක්‍රීඩාවෙන් දිනන තැනැත්තාට දාහක් දෙන්න පොරොන්දු වෙනවා. දැන් එතකොට මෙතන සිට අර සාමාන්‍ය විනෝදයට කාලය ගෙවා දැමීමට කරන ක්‍රීඩාවක් නොවෙයි, මෙතන. කොච්චර යාලුවන් උනත් දැන් මෙතන තිබෙන්නේ - ලෝභය ඉදිරිපත් වුන නිසා - පොරයක්. රුපියල් දාහක් දිනාගැනීමේ පොරයක්, දැන් ගෙනියන්නෙ. දැන් ඉතින් දාඩිය දමාගෙන මේ ඉත්තන් අඳිනවා. මේ ඉත්තන් දැන් 'ඇත්තන්' වෙලා. අර නොවටිනා ඉත්තන් දැන් දහසක් වටිනා ඇත්තන් කරගෙනයි අඳින්නෙ මේ. මෙහෙම ඇදගෙන යන අතරෙ, තවත් මෙතෙන්ට එනවා එක්තරා විකෘති මානසික තත්ත්වයක් ඇති දාමරික පුද්ගලයෙක්. යම්කිසි අනියම් හේතුවක් නිසා මේ තැනැත්තා මාරක ආයුධයක් පෙන්වල මේ තරඟයට අළුත් නීතියක් එකතු කරනවා. මේ තරඟ කරුවනුත්, බලාගෙන සිටින අයත් තමාගෙ යටතට අරගෙන අළුත් නීතියක් එකතු කරනවා. දිනන එක්කෙනාට දහසක් ලැබෙනවා. හැබැයි පරදින එක්කෙනා මෙතනම මරනවා. දැන් එතකොට මේ සෙල්ලම කොහොමද? දැන් සෙල්ලම 'ලෙල්ලමක්' වෙලා. දැන් මිතුරන් දෙදෙනාට එකිනෙකා පේන්නෙ හතුරන් හැටියට.

දැන් මේක ක්‍රීඩාවක් නොවෙයි. දැන් දමන්නෙ හීන් දාඩිය. දැන් අර මරණයෙන් ගැලවීමට කරන, එහෙම නැතිනම් මර උගුලෙන් ගැලවීමට කරන, ප්‍රයත්නයක් හැටියටයි ක්‍රීඩාව යන්නෙ. මේ ක්‍රීඩාව ඉවර වුන හැටි අපි දන්නෙ නැහැ කොහොමද කියල. නමුත් මෙතනින් අපට ගන්න පුළුවනි, මේ කාරණය ආශ්‍රයෙන් තේරුම් ගන්න පුළුවනි, අර නොවටිනා ඉත්තන් ඒවායේ අර සංඥාවක් වැටුන පාට කිරීමෙන්. ඒවා ඊ ළඟට දෙපිලක් උනා. ඊ ළඟට ඒ ඉත්තන්ට පණ ඇවිල්ල වගේ "ඇත්තන්" උනා. මේ සියල්ලම සිද්ධ උනේ අර තණ්හා මාන දිට්ඨි මඤ්ඤනා නිසා. අර පපඤ්ච ආදී වශයෙන් අප සඳහන් කළේ, තණ්හා මාන දිට්ඨි වශයෙන් අර දෙදෙනාගේ සන්තානයේ ඇතිවුන සිතිවිලි නිසා. ඒක කොයි තරම් ඉහ වහා ගියා ද කියතොත්, විශේෂයෙන්ම අර මරණය පිළිබඳ තර්ජනය පැමිණි අවස්ථාවෙ ඉඳලම මේ දෙදෙනාට, මේ යාලුවන් දෙදෙනාට, දාම් පෙතම ලෝකයක් උනා. මුළු මහත් අවධානයම අර දාම් පෙතේ තියෙන්නෙ. ජීවිතයත් මරණයත් අතර සටනක්. එතකොට මේ එක පැත්තක්. මේ තමයි ලෝකය. කවදාවත් ඉවර වෙන්නෙ නැති දාම් ක්‍රීඩාවක්. අපි අනිත් පැත්ත අරගෙන බලමු.

දැන් රහතන් වහන්සේට මේ මුළු ලෝකයම දාම් පෙතක්. ඒක නිසා තමයි අර අධිමුත්ත ස්වාමීන් වහන්සේ - අපි කලිනුත් උද්ධෘත වශයෙන් දක්වුව - උන් වහන්සේ කැලයක් මැදින් වඩිනකොට හොර මුලකට අහු වෙලා, ඒ හොර දෙටුව තමන්වහන්සේ මරණයට පත් කරන්න සූදානම් වෙනකොට වදාළ ගාථාව කොයි තරම් වටින ගාථාවක්ද?

"තිණකට්ඨ සමං ලොකං - යදා පඤ්ඤාය පස්සති,
මමත්තං සො අසංවින්දං - නත්‍ථි මෙ ති න සොචති"

'තුඹට ඕන නම් මාව මරන්න, මෙන්න මේකයි තත්ත්වය. යම් අවස්ථාවක මේ මුළු ලෝකයම, මේ මුළු මහත් පඤ්චස්කන්ධ ලෝකයම, ඇතුළතත් පිටතත් සියල්ලම තණකොළ ලී කැබලි වගේ ප්‍රඥාවෙන් දකීද, මමත්වයක් නොලබන්නේ, මට කිසිවක් නැතැයි සෝක නොකරයි', මේකටම උපකාර වන තව කොතෙකුත් ගාථා අපට බුද්ධ දේශනාව ආශ්‍රයෙන් වඩා අර්ථවත් අන්දමින් තේරුම් ගන්න පුළුවනි. ධම්මපදයෙ එහෙමත් කියවෙන්නෙ,

"ජයං වෙරං පසවති - දුක්ඛං සෙති පරාජිතො,
උපසන්තො සුඛං සෙති - හිත්වා ජය පරාජයං"[6]

සාමාන්‍යයෙන් මේක අපි තේරුම් ගන්නෙ "ජය ගැනීම කියන අදහස නිසා කෙනෙකුට වෛරය ඇතිවෙනව". මේ දාම් ක්‍රීඩාව පිළිබඳව වගේ. "පරාජිත පුද්ගලයා දුක සේ හොවිනව. හාන්සිවෙලා ඉන්නව. උපශාන්ත වූ රහතන් වහන්සේ සැප සේ නිදනව. ජයපරාජය දෙකම අතහැරල". ඕනනම් ජය විතරක් අතාරින්න පුළුවන් නේ. මොකද මේ ජය පරාජය දෙකම අතහැරියයි කියල කියන්නෙ? ඒ දෙක ඈඳුත්තක්. ඒ දෙක එකටයි යන්නෙ. මේ දෙක එකටම යන බව - මේ ද්වයතාව පිළිබඳ අදහස - ඉතාම වටිනා දෙයක්. මේක මේ ධර්මයේ සාරය එහෙම පිටින්ම හකුළුවා දක්වන කාරණයක්. මේක පටන් ගත්තෙ විඤ්ඤාණයත් නාම රූපයත් කියන දිය සුළියෙන්. එතකොට මේ අදහසම අත්ත දණ්ඩ සූත්‍රයේ එහෙමත් කියැවෙනව:

"යස්ස නත්‍ථි ඉදං මෙති - පරෙසං වාපි කිඤ්චනං,
මමත්තං සො අසංවින්දං - නත්‍ථි මෙති න සොචති"

සුත්ත නිපාතයේ අත්තදණ්ඩ සූත්‍රයේ කියවෙනව 'යම් කෙනෙකුට' - ඒ කියන්නේ රහතන් වහන්සේ පිළිබඳවයි කියවෙන්නෙ - මෙය මගේ යැයි සිතිවිල්ලක් පහළ නොවන්නේ ද, ඒ වගේම 'පරෙසං' අනුන්ගේ කියලත් සිතෙන්නෙ නැද්ද, එබඳු පුද්ගලයා මමත්වයක් පිළිබඳ අදහසක් නොලබන්නේ මට කිසිවක් නැතැයි ශෝක නොකරයි.

දැන් එතකොට නිවන පිළිබඳව අපි මේ ඉදිරිපත් කළ දේශනා පෙළේ මෙතෙක් අප උත්සාහ කළේ නිවන කියන්නෙ කෙබඳු තත්ත්වයක් ද කියන එක විස්තර කිරීමටයි. තේරුම් කර ගැනීමටයි. එහෙම තේරුම් කිරීමට අවශ්‍ය උනේ මක් නිසාද? මේ බෞද්ධ ප්‍රතිපදාවේ ඉලක්කය වන, පරමාර්ථය වන, නිවන පිළිබඳව නොයෙකුත් විදියේ මතිමතාන්තර, පටලැවිලි සහිත මති මතාන්තර, කවදත් ලෝකේ පවතින නිසයි. මේ කාලයේත් එහෙමමයි. මේ කාලයේ විශේෂයෙන්ම නිවනේ නාමයෙන් බොහොම දෙනෙක් පතන්නේ භවනිරෝධය නොවෙයි. භවයයි. භවයමයි පතන්නේ නිවනේ නාමයෙන්. එතකොට ඉලක්කය වැරදි නම් විදමන හරියාම සැක සහිතයි. දැන් අපි මේ දේශනාවලින් උත්සාහ කළේ අර නිවන් ඉලක්කය සැහෙන පමණ මතු කර ගැනීමටයි. එහෙම මතු කර ගැනීමේ අපේ උත්සාහය සාර්ථක උනා නම්, ඊ ළඟට අප බලාපොරොත්තු වන්නෙ,මෙතන ඉදල තිබෙන දේශනා කීපයෙන්, මේ ප්‍රතිපදාවට අදාල යම් යම් කරුණු පෙළ ගැස්වීමටයි. මේ

කියන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට උපකාර වන කරුණු පෙළ ගැස්වීමටයි. මේ දේශනා මාලාවේ මුලදී අපි විරේකයකුත් රසායනයකුත් ගැන සඳහන් කළා. මේ වන විට මුල් කාරණය සම්පූර්ණ උනා නම්, ඊ ළඟට තියෙන්නේ රසායන කොටසයි. මක් නිසාද මේ තාක් කළ දේශනවලිනුත් අපි යම් යම් මූල පද, සූත්‍ර වල හැංගිල තිබෙන - වැඩිය මේ කාලයේ අවධානයක් යොමු නොකරන - වටිනා මූලපද කීපයක් මතු කර ගත්ත. සුඤ්ඤතා, ධුවතා, තථතා, අතම්මයතා, ඉදප්පච්චයතා, පපඤ්ච, මඤ්ඤනා ආදී මූල පද රාශියක් මේ සූත්‍ර වලින් අපි ඉදිරියට ගත්ත. ඒ වගේම ඒව පිළිබඳ යම් යම් ධර්ම කාරණාත් සාකච්ඡා කළා. නමුත් ඒවයිදි අපේ මූලික පරමාර්ථය උනේ අර නිවන කියන ඉලක්කය පිළිබඳ මෙතෙක් ඇතිවෙලා තිබුන දූර්මත ඉවත් කිරීමයි. ඉවත් කිරීමට උත්සාහ කිරීමයි. නමුත් මේ දේශනා මාලාවේ පරමාර්ථය ශාස්ත්‍රීය මට්ටමකින් යම්කිසි කුතුහලයක් සංසිඳුවා ගැනීම නොවෙයි. මේ ස්වාක්ඛාතවූ ධර්මයේ සන්දිට්ඨික අකාලික එහිපස්සික ඔපනයික පච්චත්තං වෙදිතබ්බ විඤ්ඤූහි ගුණ සමුදාය මතුකරගෙන මේ කියන ඉලක්කයට පැමිණීමට උත්සාහයක් දැරීමයි. අන්න ඒ නිසා සමහර විට මෙතැන ඉඳල ඉදිරියට තිබෙන දේශනා කීපය නිවන් ප්‍රත්‍යක්ෂ කිරීමට දිවා රෑ වෙහෙසෙන යෝගාවචර සිතකට රසායන වීමට බැරි නැහැ.

"ලොභො දොසො ච මොහො ච - පුරිසං පාප චෙතසං,
හිංසන්ති අත්තසම්භූතා - තචසාරංව සංඵලං"[7]

කෝසල සංයුක්තයේ දී පසේනදි කොසොල් රජුට දේශනා කළ ගාථාවක්. ඒ ඉතාම සරල ගාථාවක්. අපි සරල දේවල් වලින්මයි ආරම්භ කරන්නෙ. "ලෝභයත් ද්වේෂයත් මෝහයත් ඇතුළතින්ම හටගෙන, තමා තුළින්ම හටගෙන, පාප සිතිවිලි ඇති පුද්ගලයාට හිංසා කරත්. පාප සිතිවිලි ඇති පුද්ගලයා වනසා ලත්". අවසාන පදයෙන් කියන්නේ උපමාවක්, "තච සාරංව සංඵලං" උණබට ආදී පොතුහර ගසක ඵලය, ගෙඩිය, ඒ ගස නසන්නාක් වගෙයි.

මේ ගාථාවෙන් කියවෙන මූලික අදහස ලෝභ දෝස මෝහ කියන මේ ක්ලේශ ධර්ම ඇතුළතින්ම හටගන්න බවයි. 'අත්ත සම්භූත' බවයි. මේක අමුතුවෙන් කියන්නට අවශ්‍ය උනේ මක්නිසාද, සාමාන්‍ය ලෝකයා හිතන්නේ ලෝභ දෝස මෝහ කියන ඒවා බාහිර නිමිති වලින් ඇතිවන දේවල්ය කියල. අර මැජික් දර්ශන දාම් ක්‍රීඩාව ආදී දේවලිනුත් අපට පෙනීගියා මේවා නිමිති වෙන්නෙ මක් නිසාද, ඇතුළත තිබෙන යම්කිසි 'දෙයක්'

නිසයි, නිමිති සංකේත වෙන්නෙ. එතකොට මෙන්න මේ කාරණය යෝනිසෝ මනසිකාරය පිළිබඳ ප්‍රශ්නයක්. බුදුරජාණන් වහන්සේ මෙතෙන්දි මතුකර දෙන්නෙ මේ ප්‍රතිපදාව සඳහා අවශ්‍ය මූලික යෝනිසෝමනසිකාරයයි. සාමාන්‍ය ලෝකයා හිතන්නෙ ලෝභ දෝස මෝහ බාහිර නිමිති වලින් ඇති වෙනව කියලයි. බුදු පියාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ මේව හරියට අර උණ බට ආදියේ වගේ ඇතුළතින්ම හටගෙන ඒ පුද්ගලයාව වනසනව කියලයි.

මේ යෝනිසෝමනසිකාරය පිළිබඳ ප්‍රශ්නයම තමයි, කලින් අවස්ථාවක අපි මධු පිණ්ඩික සූත්‍රය ගැන සාකච්ඡා කරන අවස්ථාවෙ ගැඹුරු පාඨයකින් ඉදිරිපත් උනේ. ඒකේ කොටසක් අපි නැවත මතක් කර ගත්තොත් "චක්ඛුංච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං" ආදී වශයෙන් ගිහිල්ල.......... "යං සඤ්ජානාති තං විතක්කෙති යං විතක්කෙති තං පපඤ්චෙති යං පපඤ්චෙති තතො නිදානං පුරිසං පපඤ්චසඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු" කියල අර දීඝ පාඨයක් මධු පිණ්ඩික සූත්‍රයේ සඳහන් වෙනව. එතනින් කියවෙන්නෙ, නිදසුනක් වශයෙන් කිව්වොත්, ඇසත් රූපයත් නිසා ඇස පිළිබඳ විඤ්ඤාණයක් හට ගන්නව. ඒ කාරණා තුනේ එකතු වීම ස්පර්ශය හැටියට හඳුන්වනව. ඊළඟට ඒ ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන වේදනාවක් ඇති වෙනව. යමක් විඳියිද එය හඳුනා ගන්නව "යං වෙදෙති තං සඤ්ජානාති" අන්න දන් මෙතෙන්දි ගත්තොත් "යං සඤ්ජනාති තං විතක්කෙති"අන්න සංඥා කියන තැන ඉඳල අපි මේක විග්‍රහ කරන්න ගියොත් "යමක් හඳුනා ගනීද ඒ පිළිබඳව විතර්ක කරයි." "යං විතක්කෙති තං පපඤ්චෙති" යමක් පිළිබඳව විතර්ක කරයි ද ඒ පිළිබඳව ප්‍රපඤ්ච කරයි. ඒ විතර්කම ඉහවහා යාමක්. "යං පපඤ්චෙති තතොනිදානං පුරිසං පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු" යමක් පිළිබඳව පපඤ්ච කරයි ද ඒ හේතුකොටගෙන අතීත අනාගත වර්තමාන වූ, ඇසින් දත යුතු රූපයන් පිළිබඳව 'පපඤ්චසංඛාවෝ' අර කියාපු පුද්ගලයව මැඩලත්, අභිභවනය කරත්. ඒකත් හරියට - අර උණ බට ආදියේ ඵලයෙන් ඒ ගස වැනසෙන අදහසමයි, මෙතනින් කියැවෙන්නෙත්. එතකොට අයෝනිසොමනසිකාරය ඇතිවෙන්නෙ මක් නිසාද කියන එකත් මෙතැනින් පැහැදිලි වෙනව. යෝනිසොමනසිකාරය යටපත් වෙන්නෙ, අයෝනිසො මනසිකාරයට ඉඩ ලැබෙන්නෙ, ලෝකයේ අරව ඉහවහ යන නිසා, අර විතර්ක ප්‍රපංච ආදියෙන් අරව වැඩී ගියාට පස්සේ මේව කොහෙන් පටන්ගෙන කොහෙන් ඉවර උනාද කියල බලාගන්න බෑ. මහා ජංජාලයක්, අන්තෝ ජටා බහි ජටා තත්ත්වයක් ඇති වෙනව. මේ

යෝනිසොමනසිකාරය පිළිබඳ ප්‍රශ්නය කොයිතරම් වැදගත් ද කියන එක අපට තවත් හෙළිවෙනව අර සුත්ත නිපාතයේත් සංයුක්ත නිකායෙ සගාථක වග්ගයේත් දකින්ට ලැබෙන සූචිලෝමසුත්‍රයෙන්.[8] සූචිලෝම යක්ෂයා බුදුරජාණන් වහන්සේගෙන් ඉතාම වටිනා ගාථාවක් අහනව, එයට පිළිතුරු වශයෙන් බුදු රජාණන් වහන්සේ ඉතාමත්ම වටිනා ගාථා තුනකින් පිළිතුරු දෙනව. අසන ප්‍රශ්නය මොකක්ද?

"රාගොච දොසොච කුතො නිදානා - අරතී රතී ලොමහංසො කුතොජා,
කුතො සමුට්ඨාය මනොවිතක්කා - කුමාරකා වඩ්කමිවොස්සජන්ති "

බුදු රජාණන් වහන්සේ ඊට දෙන පිළිතුරු ගාථා,

"රාගොච දොසොච ඉතො නිදානා - අරතී රතී ලොමහංසො ඉතොජා,
ඉතො සමුට්ඨාය මනො විතක්කා - කුමාරකා වඩ්කමිවොස්සජන්ති"

සෙනහජා අත්ත සම්භූතා - නිග්‍රොධස්සෙව ඛන්ධජා
පුථූ විසත්තා කාමෙසු - මාලුවාව විතතා වනෙ.

යෙ නං පජානන්ති යතො නිදානං - තෙ නං විනොදෙන්ති සුණොහි යක්ඛ
තෙ දුත්තරං ඔඝමිමං තරන්ති - අතිණ්ණපුබ්බං අපුනබ්භවාය.

එතකොට මේ ගාථා තේරීමේදී අපට අටුවා මහින් ඉවත් වෙන්ට සිද්ධ වෙනව. මක්නිසාද ලොකු ගැටලු විදියෙ පදයක් මෙතන කියවෙනව. මුල් ගාථාවෙ සූචිලෝම යක්ෂයා අසන ප්‍රශ්න පිළිබඳව බොහෝ මුද්‍රණ වල, ඒ වගේම අටුවා එහෙමත්, පිළි අරගෙන තිබෙන පාඨය පිළිබඳවයි අපට මෙතන තිබෙන ගැටලුව. අටුවාව යොදන්නේ "කුමාරකා ධඞ්ක මිවොස්සජ්ජන්ති" දැන් මෙතන අපි ගත්තේ වෙන පාඨයක් "වඞ්ක" කියලයි. ඉස්සෙල්ල මේ අටුවාව දෙන අදහස තේරුම් කරමු. අටුවාව තෝරන හැටියට යක්ෂයා අසන්නේ "රාගොච දොසොච කුතො නිදානා" රාගයත් ද්වේෂයත් කොයින්ද හටගන්නෙ. "අරතී රතී ලොමහංසො කුතොජා" අරතී අධි කුසල ධර්මයන්හි නොඇල්ම නම් වූ ඒ අරති කියන අකුශල ධර්මය ඒවගේම රති, පඤ්ච කාමයන්හි ඇල්ම කියන ඒ රතිය, ඒ වගේම ලොමහංසො ලොමුදැහැගැන්ම, භයවීම මේව කොහෙන්ද හටගන්නෙ "කුතොජා" කොතනින්ද උපදින්නේ. "කුතො සමුට්ඨාය මනො විතක්කා කුමාරකා ධඞ්ක මිවොස්සජන්ති". ඉස්සෙල්ල අපිට කියන්න වෙනව මෙතන මේ "ධඞ්ක" කියන වචනය ගැන යමක්. අටුවාව ගන්න හැටියට මේ

"ධඞ්ක" කියල කියන්නෙ කපුට. මහ දිග කථාන්තරයක් ඉදිරිපත් කරනව මේ ගාථාව තේරීමට අටුවාව. යම්සේ ගම් දරුවෝ කපුටන් අල්ලා ගෙන දිග නූලකින් උන්ගේ පාදයෙන් බැඳල මුදාහරිත් ද එතකොට අර කපුටන් ඇත පියාඹාගෙන ගිහිල්ල ආපහු කරකැවිල ඇවිත් අර දරුවන්ගේ පාමුලට වැටෙත්ද අන්න ඒ විදියට - කියල ඊ ළඟට තෝරනව අරකියාපු මනෝ විතර්ක - මනොවිතක්කා කියන පදය - මනෝ විතක්කා කියන පදය දෙකට කඩනව. අකුසල විතර්ක, කුසල් මනස - කුසල් සිත - විකෂ්ප කරයි. ඒ කියන්නේ අර ගම් දරුවන් කපුටකු මුදාහැරියාම ඈතට පියාඹල ගිහිල්ල කපුටා ආපහු පාමුල වැටෙන්න වගේ අකුසල් විතර්ක කුසල් සිත විකෂ්ප කරයි කියලයි, තෝරන්නේ.

නමුත් අපට මේක වෙන ආකාරයකට තෝරන්න සිද්ධ වෙනව. සමහර මුද්‍රණවල තිබෙන "කුමාරකා වඞ්ක මිවොස්සජන්ති" කියන පාඨය පිළිගත්තොත් "ව" කාරය ආගමාක්ෂරයක් හැටියට සළකන්ට පුළුවනි. එහෙම ගත්තොත් "කුමාරකා අඞ්කං ඉව ඔස්සජන්ති" දරුවන් මවකගේ ඇකයෙන් නික්මෙන්නාක් මෙනි. මවකගේ ඇකය හැර විසිර යන්නාක් මෙනි කියල තේරුම් ගන්න පුළුවනි. එහෙම ගත්තොත් අපට මේ ගාථාව සම්පූර්ණයෙන් තෝරන්න වෙන්නෙ - බුදු රජාණන් වහන්සේ ඒ ගාථාවට දෙන පිළිතුරු ආශ්‍රයෙන් අපි ගත්තොත් "රාගයත් ද්වේෂයත්" "ඉතො නිදානා" මෙතනින්ම, ඇතුළතින්ම හටගත්තු දෙවල්. අරතියත් රතියත් ඒත් ඇතුළතින්මයි. "ඉතොජා". "ඉතො සමුට්ඨාය" මෙතැනින්ම පැන නැගිල. 'මනො විතර්කයෝ' අපි ඒක එක පදයක් හැටියට ගන්නව. දෙකට කඩන්නෙ නැතිව. මනො විතර්කයෝ මෙතැනින්ම පැන නැඟී "කුමාරකා අඞ්කං ඉවොස්සජන්ති" දරුවන් මවකගේ ඇකය හැරයන්නාක් මෙන් විසිරයෙත්. මේ අටුවාව මගින් ඉවත් වෙන්නට විශේෂ හේතුව, අටුවාව 'මනොවිතක්කා' කියන එක දෙකට කඩල දක්වල තියෙනව. නමුත් එම අටුවාචාරීන් වහන්සේම සංයුත් අටුවාවෙ ඊට කලින් දේවතා සංයුත්තයේ එන කුම්ම සූත්‍රයේ 'මනො විතක්කා' කියන පදය තේරීමේදී මෙන්න මෙහෙම කියනව. "මනොවිතක්කෙති මනම්හි උප්පන්නවිතක්කෙ." මනොවිතක්කා කියල කියන්නෙ සිතෙහි උපන් විතර්ක - එතකොට එතන එහෙම තෝරනව, මනොවිතක්කා කියන එක. වඩා සහේතුකයි එක පදයක් හැටියට ගැනීම. සිතේ ඇතිවන විතර්ක හැටියට. නමුත් අටුවාචාරීන් වහන්සේ අර විදියට පටලැවිල්ලක් ඇති කර ගත්තෙ මක් නිසාද, ක්‍රියාකාරක පද සම්බන්ධයකින් අර දරුවන් කපුටා මුදා හැරීම පිළිබඳ උපමාව සනාථ කරන්ට ඕන නිසයි. කපුටන් මුදාහරින්නාක් මෙන් විතර්කයෝ මනස වික්ෂේප කරත්, කියල. ඊට වඩා අර්ථවත් වෙනව අපි මේ මවකගේ

ඇසය හැරයාම පිළිබඳව ඉදිරිපත් කළ අදහස. අපට ඒක තව දුරටත් හේතු සහිත බව පෙන්නුම් කරන්ට පුළුවනි, අනිත් ගාථාටික ගැනත් කල්පනා කරලා බලනකොට.

බුදුරජාණන් වහන්සේ පිළිතුරු වශයෙන් දුන්නු පළමුවන ගාථාවයි අර සඳහන් කළේ. මුල් ගාථාවට වඩා මේක වෙනස් වෙන්නෙ 'කුතො' කියල අහන ප්‍රශ්නයට 'ඉතො' කියල දෙන පිළිතුර විතරයි. කොයින්ද මේව හටගන්නෙ - මේ මෙතනමයි කියල.

ඊ ළඟට දෙවන ගාථාවෙන් කියැවෙනව

"සෙනහජා අත්තසම්භූතා - නිග්‍රොධස්සෙව ඛන්ධජා,
පුථූ විසත්තා කාමෙසු - මාලුවාව විතතා වනෙ"

එතැන ගැඹුරු අදහසක් කියැවෙනව. "සෙනහජා" මේ සෙනහ කියන වචනයේ අර්ථ රාශියක් තියෙනව. සෙනෙහස, දියසීරාව ඒ කියන්නෙ කෙතමනය, තණ්හාව කියල ඔය විදියෙ අර්ථ රාශියක් තියෙනව. ඒ අර්ථ ගණනාවක්ම මෙතන උපකාර කරගෙන තියෙන බවයි පෙනෙන්නෙ. බුදුරජාණන් වහන්සේ මෙතන යොදාපු උපමාවෙ නුග ගහක අතු වලින් බේරෙන අරළු උපමාවට අරගෙන තියෙනව. නුග ගහේත් අරළු බහින්නෙ සෙනහජා, දියසීරාව උපකාර කරගෙනයි. ඒ වගේම අත්ත සම්භූතා - ඇතුළතින්මයි හටගන්නෙ. ඊ ළඟට අනිත් උපමාව "පුථූ විසත්තා කාමෙසු" එහෙම හටගෙන කාමයන්හි වෙන් වෙන්ව ඇලෙනව. මෙතන මේ උත්තර දෙන්නේ අර මනොවිතර්ක පිළිබඳව. අර මනොවිතර්ක ඇතුළතින්ම හටගෙන බාහිරව තියෙන කාමයන්හි ඇලෙනව. උපමාව තමයි හරියට නුග ගහක අරළු අතුවලින් බැහැගෙන ගිහිල්ල පොළොවෙ හයි උනාට පස්සෙ මුල් කඳ සොයාගන්න බැහැ. අයෝනිසොමනසිකාරයට ඕන හැටියට ඉඩ තියෙනව. ලොකුවට හැදුනු නුග ගහක් බලන කොට මේකෙ මුල්ම කඳ මොකක්ද කියල සොයාගන්න බැහැ. මක්නිසාද දිය සීරාව නිසා තමා තුළින්ම හටගත්තු දේවල් වලට යට උනා. ඒකම තමයි ඊ ළඟ උපමාවෙනුත් දෙන්නේ. "මාලුවාව විතතා වනෙ" මාලුවා වැල කියන එක යම්කිසි ගසක දෙබලෙක සමහර විට කුරුල්ලකු මාලුවා වැලක ඇටයක් ගෙනැල්ල තැන්පත් කළාම කාලයක් ගිහිල්ල මාලුවා වැලක් හැදෙනවා. එහෙම හැදිල ගහත් වසාගෙන ගස මතින් පැතිරෙනව. මේ අනුව මේ උපමාදෙකෙන්ම පෙනෙන්නේ එතකොට අර අයොනිසො මනසිකාරයට ඉඩ ලැබෙන හැටියි. මේව ඇතුළතින්ම හට ගෙන වැඩීයාම නිසා, විතර්ක

ප්‍රපංච ආදියෙන් වැසීයාම නිසා, මේ මුල සොයාගන්න බෑ. යෝනිසෝ මනසිකාරයට ඉඩ නැති වෙනව. ඔය අදහසයි මෙතැනින් කියැවෙන්නෙ. එතකොට අපි අර දරුවන් පිළිබඳ උපමාව මෙතැනට කිට්ටු කරන්න තවත් හේතුවක්, මක්නිසාද මවකගේ ඇකයෙන් නික්මෙන දරුවන් ගැන කියාගෙන යනකොට එතෙන්ටත් අර "සෙනහජා අත්‍තසම්භූතා" කියන පද දෙක අර්ථවත් කර ගන්න පුළුවන්. ස්නෙහජා - ස්නෙහයෙන් හටගත්, අත්‍ත සම්භූතා මවකට අයිතිකම කියන හැටියට සළකන්න පුළුවන් දරුවන්. අනිත් එක මේ ගාථාවල මුල ඉඳල අගටම කියැවෙන්නෙ මේව හටගන්න තැන පිළිබඳවයි. අර කපුටා එලවීම පිළිබඳ කථාවෙන්, අවධාරණය කරන මූලික කාරණය යටපත්වෙනව. "කුතොනිදානා" "කුතො සමුට්ඨානා" 'කොතනින් හටගෙන' 'කොතනින් පැන නැඟී' ආදී වශයෙන් ඒ විදියටයි අහන්නෙ. ඒකට පිළිතුරු "ඉතො නිදානා, ඉතොජා, ඉතො සමුට්ඨාය" කියල ඒ විදියටයි. මෙතනින්ම හටගනී මෙතනින්ම උපදී.

"සෙනහජා" කියන එක 'තණ්හාවෙන් හටගත්' කියල ගන්න පුළුවන් මනෝ විතර්ක ගැන කියැවෙන කොට. "සෙනහජා", "අත්‍ත සම්භූතා" තණ්හාව නිසා උපදින, "අත්‍ත සම්භූතා" ඇතුළතින්ම හටගන්නා අර නුගගහ ගැන කියන කොට 'දියසීරාව'. මාලුවා වැල ගැන කියනකොටත් 'දියසීරාව'. ඔය විදියට අර්ථ ගණනාවක් මේකෙන් මතු කරගන්න පුළුවනි. සෙනහජා අත්‍ත සම්භූතා - නිග්‍රොධස්සෙව ඛන්ධජා, පුථූ විසත්තා කාමෙසු" අර විදියටම අර ගහ පිළිබඳ උපමාවත් වැල පිළිබඳ උපමාවත් වගේම පපඤ්ච වශයෙන් කෙලෙස් ධර්ම ඇතුළතින් හටගෙන ඒව වැඩී ගියාට පස්සෙ "පුථූ විසත්තා" කාමයන්හි ඒව ඇලුනට පස්සේ, සොයාගන්න බෑ මේක ඇතුළතින්ද හටගත්තෙ පිටතින්ද කියල. ඉතින් අර මිරිඟුව ඔස්සෙ යනව.

ඊළඟට අග ගාථාවෙන් ඉතා වටිනා අදහසක් කියැවෙනව. "යෙ නං පජානන්ති යතො නිදානං - තෙ නං විනොදෙන්ති සුණොහි යක්ඛ". යම් කෙනෙක් මේ කියාපු කාරණාවල, රාග දොස මෝහ මනෝවිතර්ක ආදී මේ හැම එකකම නිදානය" යතො  නිදානං" මේව හටගන්නා තැන "පජානන්ති" මැනවින් තේරුම් ගත්තාහු ද ඔවුහු ඒවා දුරු කරත්. "තෙ නං විනොදෙන්ති. සුණොහි යක්ඛ" හොඳට අහන්න යක්ෂය "තෙ දුත්තරං ඔඝමිමං තරන්ති අතිණ්ණපුබ්බං අපුනබ්භවාය" ඔවුහු එතර වීමට ඉතාම දුෂ්කර වූ, මෙතෙක් එතෙර නොවූ, ඒ සංසාර කෙලෙස් මහෝඝයෙන් එතෙර වෙත්.

# අධෝලිපි

1. දී.නි. III - බු.ජ. 9-366 පිට
2. සං.නි. I - බු.ජ. 13-26 පිට
3. සු.නි. - බු.ජ. 25-246 පිට
4. ම.නි. III - බු.ජ. 12 -82 පිට
5. සු.නි. - බු.ජ. 25-236-238 පිටු
6. බු.නි. I - බු.ජ. 24-76 පිට
7. සං.නි. I - බු.ජ. 13-134 පිට
8. සු.නි. - බු.ජ. 25-82 පිට ; සං.නි I බු.ජ 13 - 368 පිට